# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

**මෙත් සවිය සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව METHSAVIYA NEWSLETTER**

* මෙත් සවිය විසි වන කාණ්ඩය * තිස් නව වන කලාපය * 2023 අගෝස්තු



**20 වැනි සංවත්සරය**

**2023 අගෝස්තු 06**

| | |
|---|---|
| නිතින් මෙත් සිතින් මම් වෙසෙම් | වා |
| ගතින් මෙත් සිතින් රෝ මුදම් | වා |
| බැතින් තුන් රුවන් ඔප් නගම් | වා |
| මෙතින් නෙත් පියම් වා නිවෙම් | වා |

"මෙත් සවිය සඟරාව" අංක QD/පුවත්/104/2023 යටතේ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත.

ඉරු දින වල භාවනා වැඩසටහන් පැවැත්වෙන ස්ථානය හා ලිපි එවිය යුතු ලිපිනය :
අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08.

සෑම මසකම ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධම්ගවේෂී බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය - ශ්‍රී ලංකාරාමය, නො.55, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08. දු: ක: 0714014467, 0112505088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org



ගෞතම බුදුරජාණන් වහන්සේ
ලොව පහල වීම සහ හෙළදිවට බුදු හිමි වැඩම කර
වසර 2600 ක් සපිරීම නිමිතිකොට
2012/01/08 දුරුතු පොහෝ දින
අරඹන ලද ඓතිහාසික මහියංගන
රාජමහා විහාර පුදබිමෙහි
අඩි 102ක් උසැති
පිටුපස ආධාරකයක් රහිත
ලක්දිව උසම බුදුපිළිම වහන්සේ වන
මෙත්සවිය 2600 සම්බුද්ධත්ව ජයන්ති
සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ
රු. කෝටි 24ක් පමණ මුදලක් වැයකොට
2023/05/28 දින
වන්දනාමානය සඳහා
විවෘත කරන ලදී

**ශාසන අභිවෘද්ධිය පිණිස**
**මෙත්සවියෙන් සිදු කල / කෙරෙන**
**අනෙකුත් වැඩසටහන් කිහිපයක්**

- සතිපතා සමථ - විදර්ශනා භාවනා වැඩසටහන් පැවැත්වීම
- යාපනය නාගදීප විහාරස්ථානයේ වැසිකිළි පද්ධතිය තැනීම.
- මිරිසවැටිය සලපතල මළුව ප්‍රතිසංස්කරණය ඇරඹුම.
- කළුතර සාමණේර භික්ෂු පුහුණු මධ්‍යස්ථානය තැනීම.
- කළුතර මෙත්සවිය පෙරපාසල ඇරඹීම. (සියල්ල නොමිලේ)
- ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙනේ කුල දරුවන් 9 දෙනෙකු සසුන්ගත කර අරඹන ලද ධර්ම දූත භික්ෂු පුහුණු වැඩසටහන.
- ආරණ්‍ය සේනාසන සඳහා වියලි ආහාර ලබා දීම.
- මරණයට කැපවූ අසරණ සතුන්ට අභය දානය ලබා දීම.
- අක්ෂි සායන.
- ලේ දන් දීමේ වැඩසටහන්.
- රෝහල් සඳහා ආධාර ලබා දීම.

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය

දු:කඃ 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org

**ඉරු දින වල භාවනා වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08**

**සෑම මසකම ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධර්මගවේෂි බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07**


## මෙත් සවිය 2022/ 2023 වසර සඳහා විධායක කමිටුව

**ගරු පැවිදි අනුශාසක**

බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරාධිපති, අතිපූජ්‍ය වීරගොඩ ඥාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**ගරු සභාපති**

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී, විද්‍යාවාචස්පති, දේශමාන්‍ය,
විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී මහාචාර්ය චන්දන ජයරත්න මහතා.

දු:ක : 0714800800, ෆැක්ස් : 0112 515 615 / විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

**ගරු උප සභාපති**

චේනුක ජයනාත් මහතා — දූ.ක : 071 433 3868

නිමේෂ් සශින්ත මහතා — දූ.ක : 077 977 9963

**ගරු සම ලේකම්වරු**

පියල් චන්ද්‍රතුංග මහතා — දූ.ක : 071 450 1358

මංජුල පත්මකුමාර මහතා — දූ.ක : 071 529 5855

**ගරු භාණ්ඩාගාරික**

චින්තක බණ්ඩාර මහතා — දූ.ක : 071 811 4477

**ගරු උප භාණ්ඩාගාරික**

සුරංග ලියනගේ මහතා — දූ.ක : 077 599 4987

**ගරු සංස්කාරක**

එම්. කේ. ප්‍රියන්ත මහතා. — දූ.ක : 071 228 5680

**ගරු කාරක සභිකවරු**

මාලන් කන්දගේ මහතා 077 277 2601/ චමින්ද ඉන්දික මහතා 0712299212 / නුවන් පෙරේරා මහතා 0777005772 / එස්. ජී. මධුරංග මහතා 076 440 5979 / කෝසල එදිරිසිංග මහතා 071 632 2306 / එස්. එල්. පූර්ණ ප්‍රදීප් මහතා 071 905 8023

**බුදු පිළිම කමිටුව - සභාපති**

පී.පී. පෙරේරා මහතා — දූ.ක : 0719 441 269

**වෙබ් අඩවි කමිටුව - සභාපති**

සමීර දයානන්ද මහතා — දූ.ක : 0772 347 157

**කාන්තා කමිටුව - සභාපතිනිය**

රංජනී උඩුගොඩ මහත්මිය — දූ.ක : 0777 613 659

**තරුණ කමිටුව - සභාපති**

සුරත් චතුරංග මහතා — දූ.ක : 0717 744 297

**අසරණ සරණ කමිටුව - සභාපති**

අමල් බණ්ඩාර මහතා — දූ.ක : 071 603 8639

**සුව සෙත කමිටුව - සභාපති**

අතුල නානායක්කාර මහතා — දූ.ක : 0714 078 429

**දාන - ශිල - භාවනා කමිටුව - සභාපති**

නිහාල් මෙන්ඩිස් මහතා — දූ.ක : 0718 266 143

**අධීක්ෂණ කමිටුව**

දයානන්ද ඉලේපෙරුම මහතා / වික්‍රම ගුණදාස මහතා

**සුභසාධක කමිටුව**

උපුල් රාජපක්ෂ මහතා

**පර්යේෂණ කමිටුව - සභාපති**

සන්ධ්‍යා ජයතුංග මිය — දූ.ක : 0718 021 200

**මෙත්සවිය T. V මාධ්‍යජාලය - අධ්‍යක්ෂිකා**

චම්පාවෝ ජයකුමාරි මෙනෙවිය — දූ.ක : 0702 117 913

**කළුතර ශාඛාවේ සභාපති**

නිහාල් මෙන්ඩිස් මහතා — දූ.ක : 0718 266 143

**මෙත්සවිය සාමණේර භික්ෂු පුහුණු හා පෙර පාසල් සම්බන්ධිකාරක**

රුෂාන්ති දසනායක මෙනෙවිය — දූ.ක : 0701 558 558

## අප ගැන වචනයක්

**මෙත් සවිය සංසදය, නිරවුල් මනසක් ඇති, වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර පහළොවකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි**. වර්තමාන සාමාජික සංඛ්‍යාව 7,500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මඟින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාලවල දී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක්, දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටුව හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය ලෙස පවත්වා ගනිමින් දහ හත් වසරක් සහ බොරැල්ල ශ්‍රී ලංකාරාමය මූලස්ථානය කරගනිමින් වසර 3 ක පමණ කාලයක් **"මෙත් සවිය මෛත්‍රී සංසදය"** පසුගිය විසි වසරක් පුරා සමථ විපස්සනා භාවනාව හත් දහස් පන්සියයකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද **"මෙත් සවිය"** වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදීප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදීපය සහ කිලිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම, මහියංගන රාජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම, ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 102 ක් උසැති **"මෙත්සවිය 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය"** ඉදි කිරීමේ කටයුතු 2012 - 01 - 08 දින ආරම්භ කර වසර 11 කට පසු 2023 - 05 - 28 දින වන්දනාමානය සඳහා විවෘත කරන ලදී. එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල) ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය 20 වසරක් පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

## මෙත් මෙත් සවිය මගින් නොමිලයේ උගන්වන "මෙත් සවිය ළදරු පාසලට" ( ශිෂ්‍යත්ව සහ පාසල් උපකරණ පරිත්‍යාග කල හැක.)


මෙත් සවිය කළුතර ශාඛාවේ අධීක්ෂණය යටතේ පැවැත්වෙන අභිනවයෙන් ඉදිකල ගොඩනැගිලි, වැසිකිළි, ක්‍රීඩා උයන සහිත මෙත් සවිය කළුතර පෙර පාසැල 2021 අප්‍රේල් 18 වන ඉරුදින පෙ.ව. 10.00 ට උත්සවාකාරයෙන් ඇරඹින. එය පිහිටා ඇත්තේ කළුතර හොරණ පාරේ පරදූව තෝරගල්ල සිරි සදහම් අරණ විහාර භූමියේ ය. පූජ්‍ය සුගතානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසකත්වයෙන් හා මෙත් සවිය කළුතර ශාඛාවේ අධීක්ෂණයෙන් පැවැත්වේ.

නිතර ගංවතුරට යටවන මෙම පෙදෙස්වල ඉතා දරිද්‍රතාවයෙන් පෙලෙන පවුල් වල ළමුන් සඳහා ඉංග්‍රීසි හා සිංහල භාෂා මාධ්‍ය දෙකෙන් ම පෙර පාසැල් අධ්‍යාපනය ලබාදීමට කටයුතු සංවිධානය කර ඇත. ළමුන් 40 ක් දක්වා ඉගැන්වීමේ පහසුකම ඇති මෙම පෙර පාසැලේ අධ්‍යාපන කටයුතු සියල්ල නොමිලයේ සැපයේ.

නොමිලයේ සපයනු ලබන ඇඳුම් කට්ටල, සපත්තු, පාසල් උපකරණ, ක්‍රීඩා භාණ්ඩ මෙන්ම විහාරස්ථානයේ හා පෙර පාසලේ විදුලි බිල්පත් - ජල බිල්පත් හා පෙර පාසැල් ගුරුතුමිය හා පාලිකාවගේ ගෙවීම් යනාදිය සඳහා සෑම මසකම බරපැන රු.25,000/- ඉක්මවයි.

අධ්‍යාපනය ලබා දීම සඳහා සෑම මසකම ඉහත මුළු මුදල ම හෝ එක් ළමයකු සඳහා රු.1,500/-ක ශිෂ්‍යත්වයක් ලබා දී ප්‍රඥාකාරක කුසල් ලබනු කැමති පිංවතුන් වෙතොත් කළුතර ශාඛාවේ සභාපති - හිටපු පොලිස් පරීක්ෂක නිහාල් මෙන්ඩිස් මහතා (071 826 6143) හෝ කළුතර සදහම් අරණ වැඩසටහන් සම්බන්ධීකාරක රුෂාන්ති මහත්මිය (071 643 4248) හෝ අමතන්න. පෙර පාසල 2021 අප්‍රේල් මස 19 වන දින සිට මේ දක්වා සතියේ දිනවල නොකඩවා පැවැත්වේ.

## 2023 අගෝස්තු 06 වන ඉරු දින, ධර්ම දේශනාව සහ මෛත්‍රී භූෂණ සම්මාන උලෙළ මෙත් සවිය වාර්ෂික මහ සභා රැස්වීම




## මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

## අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

## මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ එල කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එල කරනු ලබන දැන්වීම් 2024/01/31 දිනට පෙර සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

## මෙත් සවිය හැඳුනුම්පත සහ සාමාජිකත්වය අළුත්කර ගැනීම

මෙත් සවිය හැඳුනුම්පත් මෙතෙක් ලබා නොගත් සාමාජිකයින් එම හැඳුනුම්පත් මෙත් සවිය කාර්යයාලයට පැමිණ ලබා ගන්න. තවද මෙත් සවිය රඳා පවතින්නේ ඔබගේ සාමාජික අරමුදල් මතය. එබැවින් සාමාජිකත්වය අළුත් කර නොගත් අය වෙත්නම් හැකි ඉක්මනින් සාමාජිකත්වය අළුත්කරගෙන අප සංසදයෙන් කෙරෙන සියළුම පුණ්‍යකටයුතු වල කොටස් කරුවකු වන්න.

**මාසයේ පළමු ඉරු දින වැඩසටහන් සිරිත් පරිදි බොරැල්ල ධම්මගවේෂි බෞද්ධාශ්‍රමයේ පැවැත්වීමට විධායක කමිටුව තීරණය කර ඇත.**

මෙත් සවිය
මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ

# 19 වන සංවත්සර මහ සභා වාර්තාව

මෙත්සවිය 19 වන සංවත්සරය - මහසමුළු වාර්තාව
දිනය සහ වේලාව : 2022.08.07 / ප.ව. 2.00
ස්ථානය : ධම්මගවේෂී බෞද්ධාශ්‍රමය, කොළඹ 07

මෙත්සවිය 19 වන සංවත්සරය සහ වාර්ෂික මහා සමුළුව මෙත්සවිය නිර්මාතෘ සහ මෙත්සවිය සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ ප්‍රධානවත්යෙන් 2022 අගෝස්තු 07 වන ඉරුදින, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ලිපිනයේ පිහිටි ධම්මගවේෂී බෞද්ධාශ්‍රම ධර්මශාලාවේදී පවත්වන ලදී. බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරයේ විහාරාධිපති වීරගොඩ ඥාණ ස්වාමින්වහන්සේ මුලසුන දරණ ලද අතර, මෙත්සවිය නිලධාරී මණ්ඩලය ප්‍රමුඛ මෙත්සවිය වාර්ෂික මහා සමුළුවට සපැමිණි සමාජිකන්ගේ සහභාගිත්වයෙන් මෙත්සවිය 19 වන සංවත්සරය සහ වාර්ෂික මහා සමුළුව පවත්වන ලදී.

මහසමුළුවේ වැඩකටයුතු ආරම්භ කරමින් මිහින්තලේ කළුදිය පොකුණ අරහත්ත තපෝවනයේ භාරකාර තපොවනේ සද්ධාජීව ස්වාමින්වහන්සේ විසින් රැස්ව සිටි පිරිස ආජීව අෂ්ටමක සීලයේ පිහිටුවා ධර්ම දේශනාවක් පවත් වන ලදී. ධර්ම දේශනාවෙන් අනතුරුව මෙත්සවිය තේමා ගීතය ගායනා කරන ලදී. මෙත්සවිය 19 වන වාර්ෂික මහා සමුළුව ආරම්භ කරමින්, සම ලේකම් මංජුල රණසිංහ මහතා විසින් න්‍යාය පත්‍රය කියවීමෙන් අනතුරුව පසුගිය සභා වාර්තාව සහ පසුගිය වර්ෂය සඳහා වූ මෙත්සවිය ක්‍රියාකාරකම් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

වර්ෂ (2022-2023) වර්ෂ සඳහා මෙත්සවිය නව නිලධාරී මණ්ඩලය පිහිටුවීමේ කටයුතු ආරම්භ කරමින්, මෙත්සවිය ව්‍යවස්ථානුකුලව සියළු වත්මන් නිලධාරීන් සිය තනතුරු වලින් ඉල්ලා අස්වෙන ලදී. මෙත්සවිය ගරු පැවදි අනුශාසකතුමන් ලෙස පූජ්‍ය වීරගොඩ ඥාණ ස්වාමින්වහන්සේගේ නම මහාචාර්ය චන්දන ජයරත්න මහතා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව චින්තක බණ්ඩාර මහතා විසින් ස්ථිර කරන ලදී. මෙත්සවිය ගරු සභාපතිතුමන් ලෙස මහාචාර්ය චන්දන ජයරත්න මහතාව කෝසල එදිරිසිංහ මහතා යෝජනා කරන ලද අතර එම යෝජනාව මංජුල රණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී. උප සභාපතිවරුන් ලෙස නිමේෂ් සචින්ත සහ චේනුක ජයනාත් මහත්වරුන්ගේ නම් පිළිවලින් චින්තක බණ්ඩාර, එස්. ජී. මධුරංග යන මහත්වරුන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාවන් පිළිවලින් වික්‍රම ගුණදාස, කෝසල එදිරිසිංහ යන මහත්වරුන් විසින් ස්ථිර කරන ලදී.

පියල් චන්ද්‍රතුංග සහ මංජුල රණසිංහ යන මහත්වරුන්ගේ නම් සම ලේකම් තනතුර සඳහා පිළිවලින් මාලන් කන්දගේ, චමින්ද ඉන්දික යන මහත්වරුන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනා පිළිවලින් චින්තක බණ්ඩාර, කෝසල එදිරිසිංහ යන මහත්වරුන් විසින් ස්ථිර කරන ලදී. භාණ්ඩාගාරික තනතුර සඳහා චින්තක බණ්ඩාර මහතාගේ නම කෝසල එදිරිසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව එම්. කේ. ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

සුරංග ලියනගේ මහතාගේ නම උප භාණ්ඩාගාරික තනතුර සඳහා කෝසල එදිරිසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව එම්. කේ. ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී. සංස්කාරක තනතුර සඳහා එම්. කේ. ප්‍රියන්ත මහතාව චේනුක ජයනාත් මහතා විසින් යෝජනා කර කෝසල එදිරිසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී.

කාරක සභික වරුන් ලෙස කෝසල එදිරිසිංහ, නුවන් පෙරේරා, චමින්ද ඉන්දික, එස්. ජී. මධුරංග, මාලන් කන්දගේ සහ පූර්ණ ප්‍රදීප් යන මහත්-වරුන් ද තෝරා පත් කරගැනීමට යෝජනා විය. එම සියළු නිලධාරී පත්කිරීම් සහා සම්මත කිරීම සඳහා මංජුල රණසිංහ මහතා යෝජනා කල අතර චින්තක බණ්ඩාර මහතා එම යෝජනාවන් ස්ථිර කරන ලදී. බුදු පිළිම ක්‍රියාකාරී කමිටුවේ සභාපතිත්වය සඳහා ප්‍රේමදාස පෙරේරා මහතාද, කාන්තා කමිටුවේ සභාපතිය ලෙස රංජනී උඳුගොඩ මහත්මියද, වෙබ් හා මාධ්‍ය කමිටුවේ සභාපතිත්වය සඳහා සමීර දයානන්ද මහතාද, දාන-සීල-භාවනා කමිටුවේ සභාපතිත්වය සඳහා මෙන්ඩිස් මහතාද, පර්යේෂණ කමිටුවේ සභාපතිත්වය සඳහා සන්ධ්‍යා ජයතුංග මෙනවියද, සුභසාධන කමිටුවේ සභාපතිත්වය සඳහා උපුල් රාජපක්ෂ මහතාද, අසරණ සරණ කමිටුවේ සභාපතිත්වය සඳහා අමල් බණ්ඩාර මහතාද, තරුණ කමිටුවේ සභාපති ලෙස සුරත් චතුරංග මහතා ද, සුවසෙත කමිටුවේ සභාපති ලෙස අතුල නානායක්කාර මහතා ද, මෙත්සවිය TV අනුකමිටුවේ අධ්‍යක්ෂ ධූරය සඳහා චම්පාවෝ ජයකුමාරි මහත්මියද, මෙත්සවිය කළුතර ශාඛාවේ සභාපතිත්වය සඳහා නිහාල් මෙන්ඩිස් මහතාද, යන ලෙස නම් යෝජනා කරන ලදී. එම සියළු නිලධාරී පත්කිරීම් සහා සම්මත කිරීම සඳහා චින්තක බණ්ඩාර මහතා යෝජනා කල අතර චමින්ද ඉන්දික මහතා එම යෝජනාවන් ස්ථිර කරන ලදී. දයානන්ද ඉලේපෙරුම සහ වික්‍රම ගුණදාස යන මහත්වරුන් මෙත්සවිය අධීක්ෂණ කමිටු සාමාජිකයකයන් ලෙස පත් කර ගැනීමට චේනුක ජයනාත් මහතා යෝජනා කරන ලද අතර එම යෝජනාව කෝසල එදිරිසිංහ මහතා ස්ථිර කරන ලදී.

මෙත්සවිය සඟරාවේ සියළුම කලාපයන් එක්ව සාදන ලද මෙත්සවිය සඟරා එකතුවක් සමන්ති අහුබුදු මහත්මිය විසින් මහාචාර්ය චන්දන ජයරත්න මහතා වෙත පිළිගන්වන ලදී. අනතුරුව මහියංගන පුදබිමේ ඉදිකරන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීම සඳහා ආධාර කල පිරිසකට එම පිළිමවහන්සේගේ ආකෘති ප්‍රධානය කිරීම සිදු කරන ලදී. චින්තක බණ්ඩාර මහතා විසින් මෙත්සවිය මාධ්‍ය ජාලයට ආලෝකකරණ උපකරණ කිහිපයක් පූජා කරන ලදී.

මෙත්සවිය 19 වන සංවත්සර මහා සමුළුව සාර්ථක කර ගැනීම සඳහා විවිධ ආකාරවලින් සහයෝගය දැක්වූ පිරිසට සහ ආයතන වලට සංසදයේ කෘතඥ පූර්වක ස්තුති ප්‍රකාශ කරමින් මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා උත්සවයේ නිමාව සනිටුහන් කරන ලදී.

# "නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස" නමස්කාර පාඨය හැදුනේ මෙහෙමයි

බුද්ධත්වයෙන් දෙවැනි දින මහ බෝමැඩදී අකුරු දහ අටකින් හා පද පහකින් යුක්ත වූ මෙම නමස්කාර පාඨය,

1. සතාගිරි, 2.) රාහු අසුරේන්ද්‍ර 3.) සිව්වරම් දෙවි 4.) සක්දෙවිඳු 5.) සහම්පති මහබඹු
යන යක්ෂ, අසුර, දිව්‍ය, බ්‍රහ්මයන් විසින් කියූ එක් එක් පදය එකතු කොට තනා ගන්නා ලද්දකි.

### නමෝ:-

නරකයට යන සතුන් වළකා නිවන් පුරයට පමුණුවන හෙයින් "න" අර්ථයද, ලෝක සත්ත්වයන් නිවන් පුරයට පමුණුවන බැවින් "**මෝ**" යන අර්ථයද එක්කොට සතාගිරි යක්‍ෂයානෝ "**නමෝ**" යන පදයෙන් වැන්දේය. සාතාගිරි යකුන් "නමෝ" ගුණයට වදින ලද අයුරු

| | | | | |
|---|---|---|---|---|
| අපා දොර වැසුව සම්බුදු ගුණය | කියා | - | **න** යන පදය ගොනු කරමින් දහම | නියා |
| **මෝ** යන පදෙන් නිවණේ ඇති හරය | කියා | - | සතාගිරි යකුන් වැන්දා **නමෝ** | කියා |

### තස්ස:-

දීපංකර බුදු සමයේ පටන් තණ්හාව නසමින් පාරමී පූර්ණය කළ නිසා අසුරේන්ද්‍රයා "**තස්ස**" කියා වැන්දේය. රාහු අසුරිඳු "**තස්ස**" ගුණයට වදින ලද අයුරු.......

| | | | | |
|---|---|---|---|---|
| තන්හා බරිත සිතුවිලි හැම | දුරලුව | - | සත්‍ය වචනයෙන් තුන්ලොව | සැනසුව |
| **තස්ස** යන පදෙන් ඒ බුදු ගුණ | කීව | - | අසුරිඳු රාහු වැන්දා සිරිපද | ගාව |

### භගවතෝ:-

සමාධි ප්‍රඥවෙන් පරතෙරට ගිය හෙයින් ක්ලේශයන් නසා බුද්ධත්වයට පැමිණි හෙයින් ධෘථරාෂ්ට, විරූඨ, විරූපාක්‍ෂ, වෛශ්‍රවණ, සහ සතර වරම් දෙවියෝ "**භගවතෝ**" කියා වැන්දේය. සතර වරම් දෙවිවරු "**භගවතෝ**" ගුණයට වදින අයුරු......

| | | | | |
|---|---|---|---|---|
| නුවණින් අග්‍රවු ගුණයට සිත | රන්දා | - | දන් පිදුමට සුදුසු ගුණයට හිත | බන්දා |
| දුරලු නිසා කෙලෙසුන් මර බල | සින්දා | - | **භගවතෝ** ගුණෙන් සිව් දෙවි බුදු පා | වැන්දා |

### අරහතෝ:-

සසර බියට පත් සත්වයාට අභය පුරයට ප්‍රවේශවීමට අනන්ත ගුණ ඇති අරහත් ධජය ප්‍රමුඛකොටගත් සර්වඥයන් වහන්සේට **අරහතෝ** කියා ශක්‍රයා වැන්දේය. සක්‍ර දෙවිඳුන් "**අරහතෝ**" ගුණයට වදින ලද අයුරු.......

| | | | | |
|---|---|---|---|---|
| භව චක්‍රෙයහි අරයන් සන්සිදින | ලද | - | බුදු බව ලබා සිවු සස් දම් දෙසන | ලද |
| සක් දෙවිඳුන් බුදුන් ගුණ කද සිතන | ලද | - | **අරහතෝ** කියා වැන්දා සම්බුදු | පාද |

### සම්මා සම්බුද්ධස්ස:-

දුක්ඛ, සමුදාය, නිරෝධ, මාර්ග යන උතුම් ඇත්ත සතර තමන් විසින්ම අවබෝධ කරගෙන ලොවට දායාද කළ හෙයින් සහම්පති මහා බ්‍රහ්මයා **සම්මා සම්බුද්ධස්ස** යන දෙපදයෙන් වැන්දේය. මහා බ්‍රහ්මයා "**සම්මා සම්බුද්ධස්ස**" ගුණයට වදින ලද අයුරු......

| | | | | |
|---|---|---|---|---|
| නිමා කරන්නට සසරෙහි සියලු | දොසා | - | සම්මා බුදුන් ගුණ මහබඹු දුටුව | නිසා |
| **සම්මා සම්බුද්ධස්ස** ගුණ කද ඇතුව | තොසා | - | නම්මා සිරස වැන්දා බඹු සතුට | නිසා |

------------------------------------------------------------------------

මේ කොටස් පහ එකතු කරලා තමයි අපි බුදු රජාණන් වහන්සේට "**භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**" කියලා නමස්කාර කරන්නේ.
තෙරුවන් සරණයි.!!! සුවපත් වෙත්වා!!!

**අපේ ජීවිතය කියන්නේ හරියට අම්බලමක් වගේ..**
**එනව යනව විතරයි. කවදාවත් නැවතීමක් නම් නැතී..**
**ජීවිතෙත් එහෙමමයි....**
**සදාකාලිකවම නැවතීමක් නම් නැති**
**ඒ නැවතුමට, එක එක අය එනවා**
**ඒත් කිසිම කෙනෙක් එහි බොහෝ**
**කාලයක් නතර වෙන්නෙ නෑ.. යන්න යනවා.**
**ජීවිතෙත් එහෙමයි.**
**අපේ ජීවිතේට එන කිසිම කෙනෙක් අපි එක්කම**
**සදාකාලිකවම ඉන්නෙ නෑ... යන්න යනවා.**
**කිසිම බැඳීමක් සදාකාලික නෑ...**
**බැඳීම යනු දුකට තවත් නමක් විතරයි.**

**සෑම බැඳීමක් තුල ම ඇත්තේ දුකම පමණි**
**මේ බව අවබෝධ කරගෙන බැඳෙන්න**
**එවිට අතහැරෙන ජීවිත ගැන**
**නොගැටී නොසැලී අවබෝධයෙන්**
**අද දවස අරඹන්න**
**ජීවිතයට බුදු වදන එක්කර ගන්න**
**ධර්මාවබෝධය ලබන්න වාසනාව ලැබේවා....**

**සම්මා**
**සම්බුදු**
**සරණයි....!!**

නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙත් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා

**මෙත් සවිය**
මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත,
බොරැල්ල, කොළඹ 08.
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org
විද්‍යුත් තැපෑල : office@methsaviya.org
දු: කඃ 0714 0144 67 / 0112 50 50 88,

20 වෙනි සංවත්සරය

**මෙත් සවිය**
මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## මෛත්‍රී භූෂණ උපහාර උළෙල සහ 20 වන සංවත්සර සැමරුම

**2023 අගෝස්තු මස 06 වන ඉරු දින**
**ප.ව. 1.30 සිට 5.30 දක්වා**
**කොළඹ විශ්වවිද්‍යාලයීය නව කලාගාරයේ දී**

**මෙත් සවිය**
මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## මෙත්සවිය 20 වන සංවත්සර සැමරුම සහ මෛත්‍රීභූෂණ උපහාර උළෙලේ න්‍යාය පත්‍රය

ප.ව.

| | |
|---|---|
| 01 . 30 | සාමාජිකයින්ගේ සහ ආරාධිත අමුත්තන්ගේ පැමිණීම |
| 01 . 45 | තේ පැන් සංග්‍රහය |
| 02 . 00 | බස්නාහිර පලාතේ ගරු අධිකරණ සංඝ නායක, කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ මහාචාර්ය **අගලකඩ සිරිසුමන ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්ම දේශනාව** |
| 03 .05 | ගරුතර මහා සංඝරත්නය වැඩම කරවීම සහ 20 වන සංවත්සර සැමරුමේ ප්‍රධාන ආරාධිත අමුත්තා වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේගරු **අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිඳුන්ගේ** සපැමිණීම |
| 03 . 10 | සාම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීම |
| 03 . 15 | මුලසුන හෙබවීම: මෙත්සවිය අනුශාසක බොරැල්ල ශ්‍රී ලංකාරාමාධිපති **අතිපූජ්‍ය වීරගොඩ ඤාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේ** |
| 03 . 20 | මල් පහන් පුදා ආජීව අෂ්ඨමක සීලය සමාදන් වීම<br>මෙත් සවිය තේමා පාඨය කියවීම |
| 03 . 30 | පූජා නර්තනය |
| 03 . 35 | පිළිගැනීමේ කථාව - මෙත් සවිය ගරු සභාපති, විද්‍යාකීර්ති මහාචාර්ය **චන්දන ජයරත්න මහතා** |
| 03 . 40 | සාම්ප්‍රදායික බෙර වාදන නර්තනාංගය |
| | **මෛත්‍රී භූෂණ සම්මාන පිරිනැමීම** |
| 03 . 45 | තරුණයින් මත් උවදුරින් ගලවා ගැනීම සඳහා බිහිකල මිතුරු මිතුරෝ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනේ නිර්මාතෘ **කුප්පියාවත්තේ බෝධානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ** උපහාර සම්මානය වෙනුවෙන් හේතුපාඨ කියවීම හා සම්මානය පිරිනැමීම |
| 03. 50 | ධනාත්මක මනෝවිද්‍යාව සිංහලෙන් ජාත්‍යන්තරයට ගෙනගිය අධ්‍යාපන මනෝවිද්‍යාවේදී **මහාචාර්ය දයාරෝහණ අතුකෝරාල මහතාගේ** උපහාර සම්මානය වෙනුවෙන් හේතුපාඨ කියවීම හා සම්මානය පිරිනැමීම |
| 03 . 55 | මෛත්‍රී භූෂණ උපහාරලාභීන් විසින් පවත්වනු ලබන කෙටි දෙසුම් |
| 04 . 15 | ප්‍රාසාංගික වැඩසටහන - මෙත්සවිය කළුතර පෙරපාසලේ දරුවන් |
| 04. 20 | මෙත් සවිය විසි වසරක ප්‍රගති සමාලෝචනය |
| 04 . 25 | තම කාලය, ධනය, ශ්‍රමය වැය කර මෙත් සවියේ උන්නතියට උරදුන් සාමාජිකයින් ඇගයීම |
| 04. 35 | ගරු අග්‍රාමාත්‍ය තුමාගේ දේශනය |
| 04 . 45 | ප්‍රාසාංගික වැඩසටහන - හොරණ විදුසිළු රංගායතනය |
| 04 . 50 | මුලසුනේ දෙසුම |
| 05 . 00 | මෙත්සවිය මගින් පැවිදි කල සාමණේර හිමි නමක් විසින් පවත්වනු ලබන පුණ්‍යානුමෝදනාව |
| 05 . 10 | ප්‍රාසාංගික වැඩසටහන - මෙත්සවිය කළුතර පෙරපාසලේ දරුවන් |
| 05 . 15 | **වාර්ෂික මහා සමුළුව** : පසුගිය වාර්ෂික මහ සමුළුවේ වාර්තාව ඉදිරිපත් කිරීම, වාර්ෂික ප්‍රගති වාර්තාව හා අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම. ඉදිරි වර්ෂය සඳහා නිළධාරී මණ්ඩලය සහ විගණකවරු පත් කිරීම |
| 05 . 25 | ස්තුති කතාව - සම ලේකම් |
| 05 . 30 | ජාතික ගීය වාදනය කිරීම |
| | සමාප්තිය |

**(මෙම උත්සවය සඳහා සුදු හෝ ලා පැහැති ඇඳුමකින් සැරසී පැමිණීම වඩා යෝග්‍ය වේ).**

# පසුගිය වසර සඳහා කාන්තා කමිටුවේ ප්‍රගති සමාලෝචනය

ලෝකය පුරාම බලපෑම් ඇති කළ අප වැනි නොදියුණු රට වලට තදින්ම බල පැවැත් වූ අසීරු කාල පරිච්ඡේදයක් පසු කරමින් සිටින්නෙමු. එබඳු වාතාවරණයක් මධ්‍යයේ වුවද අපේ මෙත් සවිය සංවිධානය බෞද්ධාගමික පසුබිමක් යටතේ සැලකිය යුතු මෙහෙවරක යෙදීම සුළු කොට තැකිය හැකි නොවේ.

අපට යෝධ ශක්තියක් වූ මහාචාර්ය තුමන්ගේ මග පෙන්වීම යටතේ අපහසුතා මධ්‍යයේ වුව ද අප විසින් මෙත්සවිය මගින් නොකඩවා සිදු කරන සද් කාර්යන්ට ඉහලින්ම දායක වූ බව සඳහන් කල හැක. ශාසනයේ චිරස්ථායී බව උදෙසා සංඝ පරම්පරාවෙහි පැවැත්ම අනිවාර්ය වේ. මේ බව වටහාගත් සංවිධාන ද පුද්ගලයන් ද ඒ අනුව බොහෝ වැඩ කටයුතු සිදු කරති.

මෙත් සවිය සංවිධානය මගින් ද කුල දරුවන් සසුන් ගත කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ වීම සතුටකි. මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ දී අප කාන්තා කමිටුවේ සාමාජිකාවන් විශාල කාර්‍යභාරයක් සිදු කල බව සඳහන් කල හැක. මහණ වීම සඳහා තෝරාගන්නා ලද දරුවන් උදෙසා ඔවුන්ගේ අවශ්‍යතා සොයා බලමින් අප සාමාජිකාවන් කටයුතු කලේ ඔවුගේ දරුවන් මුණුබුරන් වෙනුවෙන් කටයුතු කරන තරම් දයා හරිතවය.

2022 වසර අවසානයේ මිය ගිය මෙත්සවිය සාමාජික සාමාජිකාවන්ගේ මියගිය ඥාතීන් වෙනුවෙන් වාර්ෂිකව පිරිනැමෙන දානමයපුන්‍යකර්මය ඉතාමත් සාර්ථකව කාන්තා කමිටුවේ මූලිකත්වයෙන් සිදු කිරීමට හැකිවිය.

සුපුරුදු පරිදි නව වසර එළඹෙද්දී සිදු කරන පුන්‍යකර්මයන්ද නොපිරිහෙලා ඉටු කෙරුණි. ජනවාරි පළමු වැනි දින කොලඹ ගංගාරාමයේ සිදු කරන දානමය පිංකම මෙම වසරේ ද කිසිදු අඩුපාඩුවකින් තොරව සිදු කිරීමට හැකි වූයේ කාන්තා කමිටු සාමාජිකාවන් ඉතාමත් උනන්දුවෙන් සියලු කටයුතු වලට දායක වූ බැවිනි. මහාචාර්ය තුමන් විසින් අනුරාධපුර රුවන්වැලි මහා සෑය පරිශ්‍රයේ ඉතාමත් ඉහලින් සිදු කල පූජාවන්ටද කාන්තා කමිටුවේ පූර්ණ සහභාගීත්වය ලබාදීමට හැකි විය. එවැනි වැඩසටහන් අතරේ නිතිපතා සිදු කරන මෙත් සවියට සම්බන්ධ හැමදෙනාගේම ප්‍රශංසාවට ලක්වී ඇති දානමය පිංකමක් ලෙස සලසා සිදු කරනු ලබන තේ පැන් සංග්‍රහය නොකඩවා ඉතාමත් හොඳින් සිදු කිරීමට කාන්තා කමිටුවට හැකි විය. තවද මහියංගන පුදබිමෙහි මෙත්සවිය මගින් තැනුණු ලක්දිව උසම වටකුරු බුදුපිළිමය අවට පිච්චමල් සිටුවීමට දායක වීම සිතින් නොමැකෙන පුණ්‍ය කර්මයකි. සංවිධාන මට්ටමින් පමණක් නොව පුද්ගලිකවද කැපකිරීම් තුලින් මේ සාර්ථක බව කාන්තා කමිටුව ලබාගෙන ඇත. අප විසින් සිදු කරනු ලබන සියලු කාර්යන්හි දී මෙත්සවිය ක්‍රියාකාරී තරුණ පිරිමි දරුවන් ලබාදෙන සහයෝගයට අපි ඔවුන්ට පින් දෙන්නෙමු.

මහාචාර්ය තුමාගේ මගපෙන්වීමෙන් සාමාජික ඔබ සැමගේ සහයෝගයෙන් ඉදිරියටත් අපට හැකි ඉහලම අයුරින් මෙත්සවිය වැඩකටයුතු වලට දායක වීමට කාන්තා කමිටුවේ අප හැම දෙනා ඇප කැප වී සිටින බව සඳහන් කරන්නේ සතුටිනි.

**කාන්තා කමිටුව – සභාපතිනි - රංජනී උඳුගොඩ මිය**
**උප සභාපති - හේමන්ති පෙරේරා මිය**
**ලේකම් - සෝමා දීගල්ල මිය**

# මෙත් සවිය තරුණ කමිටුවේ ප්‍රගති සමාලෝචනය

මෙත්සවිය තරුණ කමිටුව, විශේෂයෙන්ම මෙත්සවිය තරුණ පිරිස සඳහාම වෙන් වූකමිටුවයි. තම තරුණ කාලය, දෛනික කාර්යන්ට අමතරව, බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් අර්ථාන්විතව කැප කරමින් මෙත්සවිය මගින් සිදු කරන සියලු කටයුතු වලදී අවශ්‍ය දායකත්වය නොපමාව ලබා දෙන කමිටුවයි.

2018 වර්ෂයේ සිට ස්ථාපිත කරන ලද මෙත්සවිය නව තරුණ කමිටුවේ සාම්ප්‍රදායික කාර්යභාරයන් ඒ අයුරින්ම පවත්වා ගනිමින්, නව ව්‍යාපෘති ද ඇතුලත් කරමින් මෙත්සවිය සංවිධානයේ උතුම් අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකි සෑම ශක්තියක්ම ලබාදීම අපගේ අරමුණයි.

අපගේ කාර්යභාරයන් අතර මෙත්සවිය සාමාජිකයන් සඳහා "අසරණ සරණ කැට" නොමිලේ ලබාදීම සුවිශේෂී වේ. එමගින් සාමාජිකයන්ට මරණයට කැපවූ හෝ අසරණ වූ සතුන් නිදහස් කිරීමට පහසුවෙන්ම දායක විය හැකි අතර එය මහා ආනිශංස ගෙන දෙන පිංකමකි. එම මුදල් පරිත්‍යාග වලින් මේ වන විට හරකුන්, පාත්තයින්, තාරාවුන්, කුරුල්ලන්, නයින් ඇතුළු අප්‍රමාණ සතුන් පිරිසකට ජීවිත දානය ලැබී ඇත.

මේ අතර "මෙත්සවිය **T-shirts**" අලෙවි කිරීම ද මෙත්සවිය තරුණ කමිටුව මඟින් සිදු කරනු ලබයි. මෙමගින් ලැබෙන ආදායම මෙත්සවිය කාර්යාලය නඩත්තු කිරීම ඇතුළු විවිධ කටයුතු සඳහා යොදා ගනු ලබයි.

එමෙන්ම තවත් එක් සුවිශේෂී කටයුත්තක් ලෙස "මෙත්සවිය **Garage sale** නවතම ව්‍යාපෘතිය සාමාජිකයන් ට හඳුන්වාදීම පසුගිය මාස කිහිපය තුළ සිදුකෙරිණි. මෙම නවතම සංකල්පය මගින් මෙත්සවිය සාමාජිකයන් විසින් භාවිතා කරන ලද, තවදුරටත් භාවිතා කළහැකි තත්ත්වයේ ඇති භාණ්ඩ සුදුසු මිලකට විකිණීම සිදුකරනු ලබයි. භාණ්ඩ විකුණා ලැබෙන ආදායමෙන් කොටසක් මෙත්සවිය භාවනා වැඩසටහන පවත්වනු ලබන ශ්‍රී ලංකාරාමය විහාරස්ථානයේ විදුලි ආලෝක බිල ගෙවීම සඳහා ද, මෙත්සවිය මඟින් මහියංගනය පුද බිමෙහි ඉදිකරනු ලබන මෙත්සවිය 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිම වහන්සේ ගොඩනැගීම සඳහා ද වෙන්කරනු ලබයි.

මේ ආකාරයෙන් තාරුණ්‍යයේ ජවය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් කැප කරමින් මෙත්සවියට ශක්තියක් වන ප්‍රධාන අනු කමිටුවක් ලෙස අපගේ කාර්යභාරයන් ඉදිරියටත් නොකඩවා පවත්වාගෙන යාම අප කමිටුවේ බලාපොරොත්තුවයි..

**මෙත්සවිය තරුණ කමිටුව**
**සභාපති - සුරත් චතුරංග මයා**



## වර්ෂ 2600 සම්බුද්ධ ජයන්තිය සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීමේ පුණ්‍යවන්ත මෙන්ම ඉතා ගාම්භීර ක්‍රියාවලිය පිළිබඳ ඉදිරිපත් කරන්නා වූ කෙටි සමාලෝචනයයි.

වර්ෂ මෙත්සවිය 2600 සම්බුද්ධ ජයන්තිය සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීමේ පුණ්‍යවන්ත මෙන්ම ඉතා ගාම්භීර ක්‍රියාවලිය පිළිබඳ ඉදිරිපත් කරන්නා වූ කෙටි සමාලෝචනයයි.

බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනාගමනය සිහිගැන්වීම පිණිස චිරාත් කාලයක් පවතින පූජා වස්තුවක් ලෙස බැතිමතුන්ට වන්දනාමාන කර කුසල් රැස්කර ගැනීමේ මාහැඟි අරමුණෙන් යුතුව 2012 දී අරඹන ලදී. මාගේ සභාපතිත්වයෙන් එම බුද්ධ ප්‍රතිමාවේ දෙවන අදියරේ වැඩ කටයුතු 2013/01/26 වැනි දුරුතු පොහෝ දිනයේදී ආරම්භ කරන ලදී.

මෙම ප්‍රතිමාව කිසිදු පිටුපස ආධාරයකින් තොරව අඩි 102 ක් උස්ව වටකුරු හැඩයකින් යුක්තවීම මෙහි සුවිශේෂී ලක්ෂණයකි. අදියර කීපයකින් යුතුව මහියංගනය විල්ලුව වැව මධ්‍යයේ සීමාමාලකයේ සකස් කොට දෙවන හා තුන්වන අදියර වශයෙන් ඉහලට නැංවීම කෙරුන අතර, පද්මාසනයෙන් ඉහලට බුද්ධ ප්‍රතිමාවේ කටයුතු 2022 වසර වන විට නිම කරන ලදී.

බුදු මළුව වටා නෙළුම් මල් සකසා වන්දනා මාන කිරීමට හැකි අයුරින් සකස් කිරීම 2023 මාර්තු මස දී හතරවන අදියර වශයෙන් වූ අතර, සියලු සැදැහැවතුන් පිරිසගේ ඒකායන ප්‍රාර්ථනය පරිදි පින්වත් සැමගේ සහභාගිත්වයෙන් යුතුව මෙම මා හැඟි බුද්ධ ප්‍රතිමා වහන්සේ වර්ෂ 2023 ක් වූ මැයි මස 28 වන දින ලංකාවාසී මෙන් ම සියලු ලෝකවාසීන්ගේ හිතසුව පිණිස මෙත්සවිය මගින් සසුනට පූජා කරන ලදී.

මෙම මාහැඟි කුසලකර්මය නිවන් අවබෝධය පිණිසම හේතු වාසනා වේවා!!! සාධු! සාධු! සාධු!

**බුදු පිළිම කමිටු සභාපති - පී. පී. පෙරේරා මයා**

## මෙත්සවිය TV /මෙත්සවිය මාධ්‍ය ජාලය

**මෙත්සවිය TV ස්ථාපිත කිරීම**

2021 වර්ෂයේ නොවැම්බර් මාසයේ ආරම්භවූ මෙත්සවිය මාධ්‍ය ජාලය මුල් අවස්ථාවේ මෙත්සවිය වෙබ් අවකාශය සහ මෙත්සවිය TV එක්ව පැවති අතර 2022 ජූලි මස 03 වන දින පැවැත්වූ වාර්ෂික සභා රැස්වීමේදී මෙත්සවිය වෙබ් අවකාශය සහ මෙත්සයවි TV ලෙස වෙන් වෙන්ව ස්ථාපිත කිරීම සිදුවිය.

**වීඩියෝ වැඩසටහන් ආරම්භ කිරීම**

මෙත්සවිය TV ආරම්භ කල මුල් අවස්ථාවේ ධර්ම දේශනා සජීව විකාශනය කිරීම පමණක් සිදුවූ අතර එහි දී රටේ විවිත්‍ර දේශකයානන් වහන්සේලාගේ ධර්ම දේශනා මෙත්සවිය TV ඔස්සේ විකාශනය විය. පසුගිය කාලයේ රටේ ඇති වූ ආර්ථික අවපාතය හේතුවෙන් මෙත්සවිය "ස්වයංපෝෂණ ව්‍යාපෘතිය" ආරම්භ වූ අතර තේමා 09 ක් යටතේ ක්‍රියාත්මක වූ එහි ජනතාව අතරට ගොස් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක විය. ඒවා ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා සම්මුඛ සාකච්ඡා වීඩියෝ පට ලෙස මෙත්සවිය TV නාලිකාව ඔස්සේ විකාශනය කරන ලදී. එලෙසම "ස්වයංපෝෂණ" මුහුණු පොතේ පිටුවක් ද ඊට සමගාමීව ආරම්භ කරන ලදී. එලෙසම මෙත්සවිය අසරණ සරණ කමිටුව මගින් සිදු කරන අභයදානමය ක්‍රියාකාරකම් වීඩියෝ පට ලෙස නිෂ්පාදනය කිරීම ද, මෙත්සවිය අනෙකුත් කණ්ඩායම් සඳහා ප්‍රවර්ධන පෝස්ටර් නිර්මාණය කිරීම ද සිදු කරන ලදී.

2023 පෙබරවාරි නිදහස් සමරුවට සමගාමීව කළුතර සදහම් අරණ භික්ෂු පුහුණු මධ්‍යස්ථානයේ දී සිදුකල කුලදරුවන් මහණ කිරීමේ ශාසන හිතකාමී පුණ්‍ය කර්මය ද, මෙත්සවිය පෙර පාසලේ කුඩා දරුවන්ගේ විචිත්‍ර ප්‍රාසංගික වැඩසටහන ද මෙත්සවියTV දීර්ඝ වීඩියෝ පට ලෙස විකාශනය කරන ලදී.

සැප්තැම්බර් මාසයේ මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන්ගේ ජන්මෝත්සවය නිමිති කරගෙන සිදු කරන ලද ධර්ම දේශනය, ගංගාරාමයේ සිදු කල දානමය පුණ්‍ය කමර්ය හා අභයදානමය පුණ්‍ය කර්මය ද, වාර්ෂිකව මෙත්සවිය මගින් දෙසැම්බර් මාසයේ දී මියගිය සාමාජිකයින් වෙනුවෙන් බොරැල්ල ශ්‍රී ලංකාරාමයේ දී, සිදු කරන දානමය පුණ්‍ය කර්මය ද, සැම ජනවාරි 01 වන දිනකම කොළඹ ගංගාරාම විහාරස්ථානයේ සිදුකරන උදෑසන කේෂධාතු පූජාව හා දානමය පුණ්‍ය කර්මය ද, මෙත්සවියTV ඔස්සේ විකාශනය කරන ලදී. එමෙන්ම මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන් විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලද මෙත්සවිය විසින් සංවිධානය කරන ලද අධ්‍යාපන වැඩමුළුව ද මාධ්‍ය ආවරණය කරන ලද අතර එය අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාගයන්හි ප්‍රතිඵල ඉලක්කගත කල ඉතා ඵලදායී වැඩසටහනකි. කොළඹ විශ්වවිද්‍යාලයේ දයා රෝහණ අතුකෝරල මහතා විසින් සිදුකල පෞරුෂත්වය ගොඩනැගීමේ වැඩමුළුව ද මාධ්‍ය ආවරණය කරන ලදි.


පසුගිය 2022/2023 වර්ෂයේ දී ධර්ම දේශනා 03 ක් මෙත්සවිය TV ඔස්සේ සජීවීව විකාශනය කරන ලද අතර එහිදී ලංකාවේ විචිත්‍ර ධර්ම කථිකයන් වහන්සේලා වන මනෝවිද්‍යා උපදේශක ත්‍රිපිටකාචාර්ය කැලණියේ අජිත හිමියන්ගේ, ආචාර්ය කුකුල්පනේ සුදස්සී හිමියන්ගේ සහ ශාස්ත්‍රීය පණ්ඩිත ගොන්බද්දල දමිත හිමියන්ගේ ධර්ම දේශනා විකාශනය විය.

පසුගිය දශක දෙක පුරාම මෙත්සවිය මගින් සිදුකල මහා පුණ්‍ය කර්මයක් වන මහියංගනය බුද්ධ ප්‍රතිමාව නෙළීමේ කාර්යයේ විවිධ අවස්ථා යටතේ ඌර්ණ රෝම ධාතුව තැන්පත් කිරීම, ශීර්ෂයේ ධාතු නිදානෝත්සවය ආදී වැඩසටහන් ඉදිරිපත් කිරීම ද, බුද්ධ ප්‍රතිමාව ජනතා පූජෝපහාරය වෙනුවෙන් නිරාවරණය කරන අවස්ථාවේ සජීවීව විකාශනය මෙත්සවිය TV විසින් සිදු කරන ලද බව සටහන් කරන්නේ ඉතාමත් ප්‍රීතිසහගත සිතින් ය. එලෙසම මෙම උතුම් පුණ්‍ය කර්මයේ මාධ්‍ය ආවරණය සඳහා ජාතික තලයේ නාලිකා වෙත ද ආරාධනා කිරීම ද සිදුකරන ලදි.

මෙත්සවියTV කාර්ය මණ්ඩලය සඳහා නව ක්‍රියාකාරීන් පත්වීම, නිලධාරීන් පත්කර ගැනීම යථාවත් කර ගැනීම මෙම කාලය තුල සිදුකරනු ලැබූ අතර වෙනත් සමාජජාල ඔස්සේද මෙත්සවියTV ප්‍රවර්ධන කාර්යයන් සිදුකරගෙන යාමට අපි බලාපොරොත්තු වෙමු. මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ උසස් අධ්‍යාත්මික චින්තනයකින් යුතු පුරවැසියන් ජනගත කිරීමේ මෙත්සවිය ඵලදායී වැඩපිළිවෙල සාර්ථක කරලීම පිණිස දායකවීමට මෙත්සවිය TV වන අප ඒකකයට හැකිවීම පිළිබඳව අපි එතුමන්ට ගෞරවනීය ප්‍රණාමය පුදකර සිටිමු. මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන් සහ මෙත්සවිය සංවිධානය ඉටුකරනු ලබන මේ මහා සද්කාර්යයේ යහපත් සංකල්ප සහ ආකල්ප ජනගත වේවා! කීර්තිය දසත පැතිරේවා යි ! මෙත්සවියTV ප්‍රාර්ථනාවයි.

**මෙත් සවිය T.V / මෙත්සවිය මාධ්‍ය ජාලයේ අධ්‍යක්ෂිකා**

**චම්පාවෝ ජයකුමාරි මෙනෙවිය**



# වෙබ් කමිටුවේ ප්‍රගති සමාලෝචනය

මෙත්සවිය වෙබ් කමිටුව වන අපගේ මූලික කාර්යය වනුයේ අප සංවිධානය සහ ඒ හා සමගාමීව සිදුකෙරෙන කටයුතු නිසි පරිදි මනා නියාමනයකින් යුතුව මෙත් සවිය සාමාජිකයින්ට සහ පොදුවේ සමස්ත ලාංකිකයින්ට methsaviya.lk ඔස්සේ ගෙනහැර දැක්වීමයි. පෙර වර්ෂයේදී කොවිඩ් වසන්ගතයත් සමග සහ ඉන්පසු ඇතිවූ ආර්ථික අපහසුතා හමුවේ මෙත් සවිය මගින් දියත් කල ස්වයන්පොෂණ වැඩසටහන සමග සුවිශේෂ වූ කර්යභාරක් ඉටුකළ වෙබ් කමිටුව, පසුගිය වසර 2022-23 කාලය තුල ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් පවතින්නේ මෙත් සවිය සංවිධානය තුල අප මෙතෙක් කල් සිදුකරන්නට යෙදුනා වූ බුද්ධ, ධම්ම, සංඝ ත්‍රිවිධ රත්නය මූලික කරගත් බුද්ධ සාසන මෙහෙවරෙහි අවස්ථා එක්රැස් කර ඒ සියල්ල අපගේ වෙබ් අඩවිය තුලින් සමස්ත ලෝක වාසීන්ට දැක බලා සතුටු සිතින් අනුමෝදන් වීමට අවස්ථාව සැකසීමයි. මේ වන විටත් සිදු කෙරෙමින් පවතින මෙම කාර්යය සඳහා අපගේ වෙබ් අඩවිය බල ගැන්වීමට අමතරව අතීත , වර්තමාන, අනාගත යන තුන් කල්හිම කරන්ට යෙදුනාවූ එම කටයුතු වල මතක සටහන් පිළිවෙලින් එක්කාසු වෙමින් පවතී. එය තව නොබෝ කලකින් methsaviya.lk වෙබ් අඩවිය හරහා අප සියල්ලන්ටම දැකබලා ගත හැකිවනු ඇත.

මෙයට අමතරව මෙත්සවිය ආරම්භයේ සිට 20 වන සංවත්සරය සමරන අද දක්වා අප සංවිධානය මගින් පළකරන්නට යෙදුනා වූ සියලුම මෙත්සවිය සඟරා කලාපයන් methsaviya.lk වෙබ් අඩවිය හරහා පරිශීලනය කිරීමට අවශ්‍ය කටයුතුද මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ සියල්ල සැකසෙන අතරතුර සංවිධානයේ සියලු ධර්ම දේශනා, දෛනික නිවේදන දැනුම් දීම් සහ අනෙකුත් කටයුතු මෙත්සවිය වෙබ් අඩවිය ඔස්සේ පල කිරීමද අපගේ මහාචාර්ය චන්දන ජයරත්න ගුරු පියාණන්ගේ මග පෙන්වීම ඔස්සේ නිතැතින්ම සිදු කෙරෙයි.

මේ සියලු කර්තව්‍යයන් ප්‍රමාදයකින් තොරව වෙබ් අඩවිය ඔස්සේ ලබා දීම සඳහා දායක උන වෙබ් කමිටුවේ සියලු සාමාජිකයිනුත්, මහාචාර්ය චන්දන ජයරත්න ගුරු පියාණනනුත්, නන් අයුරින් උපකාර කල සියලු දෙනාත් මේ අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කරන අතර මේ සියල්ල ඔබ අප සියලු දෙනා ප්‍රාර්ථනා කලාවූ බෝධියෙන්ම ඒ උතුම් වූ නිර්වාන ධාතුව අවබෝධය පිණිසම හේතු වේවා.

**මෙත් සවිය වෙබ් කමිටු සභාපති**
**සමීර දයානන්ද මහතා**



# සුවසෙත කමිටුවේ ප්‍රගති සමාලෝචනය

**සුවසෙත කමිටුව - අපේ මෙහෙවරෙන් බිඳක්....**

සුවසෙත කමිටුව මෙත්සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසංදයේ අනුකමිටුවක් වශයෙන් ක්‍රියාකාරී දායකත්වයක් දරනු ලැබේ. සෞඛ්‍ය යනු හුදෙක් රෝගාබාධ වලින් තොර වීම පමණක් නොව, පරිපූර්ණ කායික, මානසික, සමාජයීය සහ අධ්‍යාත්මික යහ පැවැත්මකි. (ලෝක සෞඛ්‍ය සංවිධානය) යන තේමාව් සමග මහාචාර්ය චන්දන ජයරත්න ගුරු පියාණන් ගේ මග පෙන්වීම සහ අශිර්වදාය කැටිකොට අප මේ විසිවන වසරට පා තබන්නෙමු.

මෙහි සාමාජිකයන් භාවනා පුහුණු වැඩසටහන සපුරා ගෙන පංච අභිඥා පාඨමාලා පුහුණුව ලත් කණ්ඩායමකින් සමන්විතවේ. මෙයට වෛද්‍ය, හෙද, වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් සහ ආහාර සහ පෝෂණවේදීන් ද ඇතුලත්වේ. මෙත්සවිය ක්‍රම ක්‍රමෙන් ව්‍යාප්ත වන විට එහි කාර්ය භාරයන් විවිධ අනුකමිටු වෙත විමධ්‍යගත කිරීමේ ප්‍රතිපලයක් ලෙස බිහිවූ සුවසෙත කමිටුව මේ වන විට විශේෂ කටයුතු රැසක් පහත පරිදි ඉටු කරයි.

- අධි මානසික චිකිස්තාව **Psychic healing** මගින් රෝගීන් සුව කිරීම -මෙහිදී අධි මානසික ශක්තිය යොදා ගනිමින්, ඔසු භාවිතා නොකර රෝග සුවපත් කිරීම සිදුකෙරේ.
- පංච අභිඥා පාඨමාලාව හැදෑරූ අධි මානසික චිකිස්තාව ප්‍රගුණ කිරීමට කැමති මෙත්සවිය සාමාජිකයන් හට වැඩි දුර පුහුණුව ලබාදීම.
- වාර්ෂිකව ලේ දන්දීමේ වැඩසටහන් හෝ වෛද්‍ය සායන පවත්වා අවශ්‍ය ඔසු වර්ග නොමිලේ මහජනතාවට සැපයීම - මෙම වැඩසටහන් වලදී අතිරික්ත බෙහෙත් ද්‍රව්‍ය භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්තාන වෙත පිරිනමනු ලැබේ.
- දිවයිනේ දුෂ්කර පළාත්වල අක්ෂි සායන පැවැත්වීමට සහ ඇස් කන්නාඩි බෙදා දීමට මව් කමිටුවට සහය වීම
- ආර්ථික අපහසුතා ඇති තෝරාගත් රෝගීන් හට ඔසු ලබා ගැනීමට පිරිවැය දැරීම.
- විවිධ විහාරස්ථානවල වාර්ෂික වස් පින්කම් සඳහා ඔසු වර්ග, ප්‍රථමාධාර ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම.
- සෙසු කමිටුවල කටයුතු වලට නන් අයුරින් සහය වීම.

මීට අමතරව, බුදු වදනක් වන ''යෝ භික්ඛවේ මං උපට්ඨහෙය්‍ය සෝ ගිලානන් උපට්ඨහෙය්‍ය-ගිලන් රෝගීන්ට උපස්ථාන කරන පුද්ගලයා තමන් වහන්සේට උපස්ථාන කරනවා හා සමානය. යන්න''පෙරදැරිකරගත් සුවසෙත කමිටුව කොළඹ ජාතික රෝහලේ භික්ෂු වාට්ටුව හා සම්බන්ධව වැඩසටහන් කිහිපයක් කිරීමට මේ වසරේදී අපේක්ෂා කරගෙන සිටී. එසේම පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා සම්බන්ධ සෞඛ්‍ය වැඩසටහන් සඳහා ග්‍රාමීය මට්ටමෙන් රජයේ සෞඛ්‍ය අංශ සමග එක්ව කටයුතු කිරීමටත් බලාපොරෝත්තු වෙමු. අප කමිටු සාමාජික වූ සජීව චන්ද්‍රවංශ තරුණ මහාතා පසුගිය වසරේ පැවිදි දිවියට පිළිපන් බවත් මෙහිදී මෙත් සිතින් සඳහන් කිරීමට කැමැත්තෙමු. අද දින විසිවන වසට පා තබන අප සමග එක් වන ලෙස සුදුසුකම් සපිරූ සියළු මෙත්සිය සාමාජිකයන් හට අප ගෞරවයෙන් අරාධනා කරමු..

**ඔබ සැමට තෙරුවන් සරණයි !**
**සුවසෙත කමිටු සභාපති - අතුල නානායක්කාර**

# අසරණ සරණ කමිටුවේ ප්‍රගති සමාලෝචනය



මෙත්සවිය මෛත්‍රී සංසදය හරහා කෙරෙන බෞද්ධ සාමාජික මෙහෙවර සඳහා කටයුතු කෙරෙන කමිටුවක් ලෙස 'මෙත්සවිය අසරණ සරණ කමිටුව' හඳුන්වාදිය හැක. මෙත්සවිය ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ අනුශාසනා පරිදි කරුණාව සහ මෛත්‍රිය පදනම්ව අසරණ සරණ සේවා, මරණයට කැප වූ අසරණ සතුන් නිදහස් කිරීම ඇතුළු පුළුල් පරාසයක් තුළ විහිදුණු පුණ්‍ය ක්‍රියා රාශියක් සිදු කිරීම අසරණ සරණ කමිටුවේ මූලික අරමුණ ලෙස හඳුන්වාදිය හැකිය. මරණයට කැපවූ හෝ හිරකල සතුන්ට අභය දානය සහ නිදහස ලබාදීමේ උතුම් කුසල කර්මය වෙනුවෙන්,

- 08/09/2022 දින, ගංගාරාම විහාරස්ථානයේ දී ගරු මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන් අතින් කුරුල්ලන් 21 නිදහස් කිරීම,
- 10/10/2022 දින මරණයට කැප වූ කිරි ගවයන් දෙදෙනකු සහ කුඩා පැටවකු වශයෙන් තිදෙනෙක් බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරයේදී මෙත්සවිය භාවනා වැඩසටහනේදී නිදහස් කිරීම.
- 04/12/2023 දින බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරයේදී මෙත්සවිය සංඝගත දක්ෂිණාව අතරතුර මරණයට කැපවූ කිරි ගවයන් 6 දෙනෙක් නිදහස් කිරීම සිදු කිරීම.
- 01/01/2023 දින ගංගාරාම පන්සලේ සිදු කෙරෙන වාර්ෂික දානයෙන් අනතුරුව මරණයට කැපවූ තාරාවන් 5 දෙනෙකු වැව මධ්‍යයේ පිහිටි අභය භූමියට නිදහස් කිරීම.

සාමාන්‍යයෙන් නිදහස් නොකරන සමාජයේ කරුණාවට භාජනය නොවන සතුන් වන නාගයන් හැඳින්විය හැක. නමුත් මෙත්සවිය අසරණ සරණ කමිටුව උතුම් මෛත්‍රී කරුණා පෙරදැරිව නයි පනික්කියන් ලග සිරකර සිටින නාගයන් 2ක් 15/01/2023 දින නිදහස් කිරීමේ දුර්ලභ කුසල කර්මය සිදුකිරීම කරන ලදී.

අසරණ සරණ කමිටුව විසින් පවුල් 20 ට වැඩි ප්‍රමාණයකට කළුතර තෝරගල්ල සිරි සදහම් ආශ්‍රමය පවත්වාගන යන මෙත් සවිය විසින් නොමිලේ අධ්‍යාපනය ලබාදෙන පෙර පාසල් සිටින අඩු ආදායම්ලාභී පවුල් සඳහා රු. 60,000/= වැඩි ආහාර ලබා දීම සිදු කරන ලදී.

මෙත්සවිය මඟින් සිදුකරන සංඝ ශාසනය චිරස්ථිතිය උදෙසා කළුතර කොරගල්ල සිරි සදහම් ආශ්‍රමයේ භික්ෂු පුහුණු මධ්‍යස්ථානයේ වැඩකටයුතු සඳහා විශේෂ දායකත්වයක් සැපයීමද අසරණ සරණ කමිටුව සිදුකර ඇත. ඒ සඳහා අවශ්‍යය කුළ දරුවන් සොයා ගැනීමට ලංකාවේ විවිධ පළාත් වලට යාමද මහණ පිංකම සඳහා දින ගණනක් වෙහෙසෙමින් ශ්‍රමදානය ලබාදෙමින් අසරණ සරණ කමිටු සාමාජිකයන් දැඩි කැපකිරීමක්, කුසල කර්මයක් සිදුකරගන්නා ලදී.

තවදුරටත් මෙත්සවිය ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ සංකල්පයකට අනුව රටේ පවතින දුෂ්කර වාතාවරණය හේතුකොටගෙන දානය නොලැබෙන හෝ හිඟ ආරණ්‍ය සේනාසන සහ පිරිවෙන් සඳහා වියළි ආහාර පූජා කිරීමේ වැඩපිළිවෙල අසරණ සරණ කමිටුව මෙම වසරේ සිදුකරන ලද සුවිශේෂිත පින්කමකි. මෙම වැඩපිළිවෙල යටත් මේ වනවිට ආරණ්‍ය සේනාසන සහ පිරිවෙන් සඳහා අවස්ථා 10 කදී වියළි ආහාර පූජා කර ඇත.

- පුරාණ ගල්ලෙන් විහාරයේ කොංගහහේන කොරතොට සහ මෙල්වොන් ස්ටේට්, ජයවීරගොඩ හංවැල්ල වැඩ සිටින ස්වාමින් වහන්සේලා 4 නමක් උදෙසා,
- කරන්දෙණිය ශ්‍රී සදහම් සුව අරණ, ඇඹිල්පිටිය උල්පතගම ආරණ්‍ය සේනාසනයේ වැඩ සිටින මහා සංඝරත්නය උදෙසා,
- ස්වාමින්වහන්සේලා 15 නමක් වැඩ සිටින දැරණියගල යටිවල අසමාන කන්ද ආරණ්‍ය සේනාසනය,
- නැවතත් හංවැල්ල ජයවීරගොඩ වැඩසිටින ගරු මහා සඟරුවන 3 නමක් උදෙසා,
- සාමනේර සහ මහාසඟරුවන 8 නමක් පමණ වැඩසිටින සිළුමිණ පිරිවෙන, පිළියන්දල,
- මැල්සිරිපුර කොස්කැළේ පුබුදුගල ආරණ්‍ය සේනාසනය ස්වාමින් වහන්සේලා 6-8 නමක් වැඩ සිටි,
- රූපසිංහ යෝගාශ්‍රමය, අනුරාධපුර 5 නමක්,
- කුටි සෙනසුන් 4 ක වැඩසිටින ස්වාමින් වහන්සේලා 7 නමක් උදෙසා, අනුරාධපුර පූජා නගරය,
- ස්වාමීන් වහන්සේලා 10 නමක් පමණ වැඩ සිටින ඇත්දළගල ආරණ්‍ය සේනාසනය, මීගලෑව, කුදාගන්නෝරුව,
- ස්වාමින් වහන්සේලා 17 නමක, ළමුන් 24 සිටින ළමා නිවසක්, වැඩිහිටියන් (18) සිටින වැඩිහිටි නිවසක් සහිත ශ්‍රී අම්භරුක්කාරාම පුරාණ රජමහා විහාරය,
- ත්‍රිකුණාමලය පුල්මුඩේ කඹුරුපිටිය ආරණ්‍යට,නැවතත් ත්‍රිකුණාමලය පුල්මුඩේ කඹුරුපිටිය ආරණ්‍ය, දෙවන වරටත් ශ්‍රී අම්භරුක්කාරාම පුරාණ රජමහා විහාරයට,
- ත්‍රිකුණාමලය පුල්මුඩේ අර්සිමලේ ආරණ්‍ය සේනාසනයට (ප්‍රධාන මධ්‍යස්ථානයට), (භාවනායෝගී මහා සංඝරත්නය 5 නමක් වැඩ සිටියි)
- තෙවන වරටත් ශ්‍රී අම්භරුක්කාරාම පුරාණ රජමහා විහාර පිරිවෙන් හා වැඩිහිටි නිවාස සංවිතයට,
- දෙවන වරටත් ත්‍රිකුණාමලය අර්සිමලේ ප්‍රධාන ආරණ්‍යට සේනාසන මධ්‍යස්ථානයට, යන ලෙස වියළි ආහාර පූජා කර ඇත.

**අසරණ සරණ කමිටුවේ සභාපති - අමල් බණ්ඩාර මයා**

**මෙත්සවිය අසරණ සරණ කමිටුවේ සියළුම සාමාජිකයන්ටත්, මෙත්සවිය සියළුම කමිටු සාමාජිකයටත්, ඔවුන්ගේ දෙමාපියන්ටත්, මියගිය සාමාජිකයන්ටත්, මෙත්සවිය උදව් උපකාර කරන දේව, නාග, ඍෂි ඇතුළු සියළුම දෙනාටත් විශේෂයෙන් අප සියළු දෙනාටම මාර්ගය පහදා දෙන නිවැරදි කරන ගරු මහාචාර්ය චන්දන ජයරත්න ගුරුතුමන්ටත් ප්‍රාර්ථනා කරන බෝධියකින් උතුම් චතුරාර්‍ය සත්‍ය අවබෝධයට මේ සියළු පින් හේතු වාසනා වේවා. කරදරයක් බාධාවක් ලෙඩක් දුකක් විශේෂයෙන්ම නිවන් දක්නා තුරු අසරණ නොවේවා!.**

# බුදු සසුන සුරකින ඃ සක්දෙවිඳුණී..!!



මහාපින්ඇති අමරපුරාධිපතියාණෙනි.. ඒ තථාගත සම්බුදුරජාණන් වහන්සේ සරණ ගිය සෝතාපන්න ශ්‍රාවක වූ සක්දෙවිඳාණෙනි... ඒ මහාබෝධිසත්වයන් වහන්සේ මව් කුස පිළිසිඳගත්දා පටන්.. සතර වරම් දෙවියන්ට අණදී බෝසතුන් සුරැකි සොඳුරු සිත් ඇති දෙව්රජුනි.ඒ බෝසත්කුමරුන් මිහිමත පැමිණ 'සිංහනාදීපවත්වද්දී සාධුකාර දුන් සක්දෙවිඳාණෙනි.. එදා අභිනික්මනට යන මහාබෝසතුන් සරසන්නට දෙව් සළුපිළි ගෙනයන්නැයි විස්කම් දෙව්පුත් යැවූ සමිඳුණී... ඒ අසිරිමත් සිදුහත් බෝසතුන් විසින් කැපූ කෙස් වැටිය ගෙන අහසට විසිකළ කල්හි දෝතින්ගෙන. මගුල් කඩුවත් ගෙන සිළුමිණ සෑ බැන්දේ ඒ බෝසතුන් වහන්සේගේ අසිරිමත් බුද්ධාභිශේකයටත් පෙර ය දෙවිඳාණෙනි... එදා මාර සෙනඟ පිරිවරාගෙන පවිටු මරු පැමිණෙනද්දී ජය ශංඛයද ගෙන සක්වල ගල මුවෙහි සිට ඉවත බලාසිටියේ කවර වූ හැඟීමෙන්දැයි මට සිතාගත හැකිය දෙව්රජාණෙනි. ඒ අසිරිමත් තථාගතයන් වහන්සේගේ බුද්ධත්වයෙන් පසු ඔබවහන්සේ මොනතරම් සතුටින් ප්‍රිතියෙන් සක් පිඹ ඝෝෂා කළේයැයි බුදුරජුන් විසින් දේශනා කළ නිසා දන්නෙමි.

දෙවියන්ගේත් අසුරයන්ගේත් අතර යුද්ධයක්වෙද්දී වේපචිත්ති අසුරයා පිරිස අමතා "ඔය ශක්‍ර දේවේන්ද්‍රයාව දෑත් දෙපා ඇතුළුල බෙල්ල පස්වෙනි කොට... බන්ධනයෙන් බැඳලා... අසුරපුරයේ මං ළඟට අරගෙන එන්න ඕන..." කිව්වා. ඒක එහෙම තමයි. රුධිර වහනයක් නැති ඒ යුද්ධයෙන් අසුරයෝ දින්නොත් ඒ විදිහටයි වෙන්නෙ.. එවගේම සක්දෙවිඳු දින්නොත් වේපචිත්තිව දෙඅත් දෙපා බෙල්ල යන පස්තැනින් බැඳ ඔබවහන්සේලඟට ගේන්න කියලයි ඔබවහන්සේ දෙවියන්ට අණදීලා තිබ්බේ. ඒ සුධර්මා දිව්‍ය සභාවට ඉදිරිපත්කරන්නට වාසනාවටම එදා ඔබවහන්සේ දිනුවා. වේපචිත්තිව සුධර්මා දිව්‍ය සභාවට ගෙනාවා. ඒ සුධර්මා දිව්‍ය සභාවට ගෙනෙද්දිත් පිටතට ගෙනයද්දිත් පාපී වචන ඇති වේපචිත්ති නපුරු කැත වචනවලින් ඔබවහන්සේට බැණ වැදෙනවා. මේක අහපු මාතලී ඔබ වහන්සේගෙන් ඇහුවේ "පින්වත්... සක් දෙවිඳුනි.. වේපචිත්තිගේ නපුරු වචන ඉදිරියේ.. ඒවා අසමින් ඉවසගෙන ඉන්නෙ මොකද? භයටද? බැරිකමටද?"

'මං වේපචිත්තිට භයෙන් ඉවසනවා නොවෙයි... බැරිකමකට ඉවසනවාත් නොවෙයි. බුද්ධිමත්ව කටයුතු කරන මං වගේ කෙනෙක් මේ. බාලයෙක් එක්ක හැප්පෙන්න යන්නෙ මොකටද? ඉතින් වළක්වන්න කෙනෙක් නැත්නම්.. අඥාන උදවිය බොහෝ සෙයින් යුද්ධවලට පැටලෙනවා. ඒ නිසා තමයි නුවණැත්තා දැඩි දඬුවම් දීලා හරි බාලයාව මේච්චල් කරන්නෙ. අනුන්ට කේන්ති ගිය බව දැනගෙනලු තමන් සිහි නුවණින් යුක්තව සංසිඤෙනවා නම්ලු මං හිතන්නෙ බාලයාව පාලනය කරන්න ඒක තමයි හොඳ කියලා..." ඒක අහල ආයෙම මාතලී මෙ-හෙම කිව්වා... "පින්වත් සක් දෙවිඳුනි ඔය ඉවසීම ගැන මම එක්තරා වරදක් දකිනවා... යම් විටක ඉවසන කොට, මෝඩයා හිතන්නෙ මෙයා මේ මට භයෙන් ඉවසනවා කියලා... පැනලා දුවනවා වගේ.. අඥාන කෙනා, ඉවසන කෙනාවමයි යට කරගෙන යන්නෙ.."

ඒත් මට හරිම පුදුම හිතෙනවා දෙවිඳුණී.. ඔබවහන්සේ කිව්වේ 'මෙයා මේ ඉවසන්නෙ මට භයෙන්ය කියලා.. කෙනෙක් හිතුවත් කමක් නෑ.. නැතත් කමක් නෑ.. උතුම් යහපත නම් තමා තුළ යහපත් ගුණධර්ම ඇතිකර ගැනීමයි.. ඉවසීමට වඩා උතුම් දෙයක් නෑ....... යම් කෙනෙක් අතිශයින්ම බලවත්ව ඉඳගෙන දුර්වල කෙනෙකුගේ නින්දා අපහාස ආදිය ඉවසනවා නම්.. ඒක තමයි ලොකුම ඉවසීම.. බැරි කෙනා හැම තිස්සෙම ඉවසනවා නෙව. යම් අඥානයෙකුගේ බලයක් වේද.. ඒකට බලය කියල කිව්වට, එතන බලයක් නෑ... ධර්මය තුළ සුරැකී ඉන්න කෙනාගේ ඉවසීම අභිභවා කියන්න දෙයක් නෑ. යම් කෙනෙක් කිපෙන කෙනාට පෙරළා කිපුනොත්.. ඒකෙන් පාඩු සිදුවෙන්නෙ තමාටමයි.. කේන්ති ගිය කෙනාව හඳුනගෙන.. පෙරළා කිපෙන්නෙ නැත්නම් එයා තමයි ජයගන්න දුෂ්කර වූ යුද්ධය දිනාගන්නෙ.. අනුන් කිපුන බව දැනගෙන...තමන් සිහි නුවණින් සංසිඤෙනවා නම් තමාටත්.. අනුන්ටත් දෙපැත්තට යහපත සලසග න්නවා..තමාටත්.. අනුන්ටත්.. දෙපැත්තටම සෙත සලසන කෙනා ගැන ධර්මයේ අදක්ෂ ජනයා හිතන්නෙ ඔහු මෝඩයෙක්ය කියලා" ස්වාමීණී දෙවිඳුණී ඒ වචන ඇහුවම මම පුදුමවුනා.. සලිත වුණා.. සක් දෙවිඳුන් මොනරතම් පිනෙන් බලවත්ද.. පිරිසෙන් බලවත්ද? ඒ වගේ බලවත් කෙනෙක් ඉවසීමේ ගුණ කියද්දි මට මං ගැනම ලැජ්ජ හිතුණ වෙලාවල් තිබුණා. සැබවින්ම දෙදෙව්ලොව අධිපතිවූ ශක්‍රයා කියන ඔබ වහන්සේ කව්රුන් හරි බනිද්දිත් ඉවසන හැටි.... ඇත්තටම ඔබ වහන්සේ මොනතරම් සුන්දර සිත් ඇති දෙව්රජෙක්ද?

සක්දෙවිඳුණී.. මගේ බුදුරජාණන් වහන්සේගේ ගැන ඔබවහන්සේ මොනතරම් ගෞරවයකින්ද කටයුතු කළේ... ඒ මගේ බුදුරජාණන් වහන්සේ ලේ අතීසාරය වැළඳී සිටිනාකළ "මමද ගොස් ඒ බුදුරජාණන් වහන්සේට සේවය කරමි"යි පැමිණ තුන් ගව් ශරීරය අත්හැර මිනිස් වෙස් ගෙන බුදුරජාණන් වහ්නසේ පා පියුම් වැඳ ස්වාමීණී අපට සේවය කරන්නට ඉඩ දෙනු මැනවි කියා බුදුරජාණන් වහන්සේ ශරීරකෘත්‍ය කොට අවසන් වූ කළ ඒ ගන්නට සැරසෙද්දි "සක් දෙවිඳුණී ..දෙවියන්ට මිනිසුන්ගේ ගඳ හාරසීයක් ගව් දුරසිටම කුණුවී ගිය සත්ව ගන්ධයක් මෙන් දැනෙන්නේය. නුඹ ආපසු යව. මට උවටැන් කරන්න අය සිටී" කියද්දීත්... 'ස්වාමීණී ලෝකනාථ වූ භාග්‍යවත් මුණිඳුනි.. මෙතැනට තුන්ලක්ෂ තිස්දහසක් ගව් දුරක් ඈත සිටිනා මට බුදු සුවඳ ම දැනෙන්නේය.

ස්වාමීණී අත්පා මෙහෙවර කොට පින් කරගන්නට ආමි. සසර දුක් නිමා කෙරුමට ඇවැසි පුණ්‍ය සම්භාරයෝ පුරාගනු පිනිස ආමි.. අනේ එයට බාධා නොකළ මැනවි"යි වැඳ වැටෙනු මා බලා සිටිමි. තථාගතයන් වහන්සේගේ ශරීරකෘත්‍යනේ බැහැර දමන දේ හිස තබාගෙන ඉවත ගෙන යනු මම දකිමි දෙවිඳුණී.. සැබවින්ම අසිරිමත්මයි. බොහෝ මිනිසුන්ට ඒ වන් නුවණ නැත්තේය. විමසා පින් කරන ස්වභාවය නැත්තේය. බොහෝ රජුන්ටද ඒවා අමතක ව යන්නට ඇත්තතේමය. එහෙත් දෙව් රජුනි ඔබනම් සැබවින්ම

ඔබවහන්සේ සොඳුරු සිත් ඇත්තේමය. ශාස්තෘ ගෞරව ඇත්තේය. ස්වාමීණී පිනෙන්ම රාජප්‍රාප්ත දෙවිඳුණී.. . ඔබවහන්සේ අන් හැම අභිබවා දෙවියන් අතර බැබලෙනවා. සොදුරු ගුණ ඇති ඔබවහන්සේ ඉස්සරවෙලාම දන් දුන් නිසා ඔබවහන්සේට පුරින්දද කියනවායැයි ඇසූවෙමි.

ඔබවහන්සේ දන් දෙද්දි මැනවින් සකසාම දන් දුන් නිසා ශක්‍රයා කියන්නේ යි අසා තිබෙන්නෙමි... ඉස්සර මිනිසුන්ට ඉන්නට හිටින්නට තැන් හදා දුන් නිසා වාසව කියලත් කියවායැයි ඇසුවෙමි. දෙවිඳුණී.. දෙව්රාජයාණෙනි.. ඔබවහන්සේට එකවර කරුණු දහසක් සිතිය හැකියිලු.. ඒ නිසා සහස්ස නෙත්ත කියනවා යැයිද අසා තිබෙමි. අධිපතිභාවයෙන් අන් දෙවියන්ට වඩා වැඩිනිසාවෙන් 'දේවානමින්දී කියනවා යැයි දනිමි.

ඒ ඔබවහන්සේ උතුම් ශක්‍ර ව්‍රත පද සමාදන්වූ නිසාවෙන් සක් දෙව් පදවි ලැබීයැයි ඇසුවෙමි...ඒ ගැනද පිලිවෙලින් මතක්කොට කියමි... පෙර මිනිස් ලොව සිටිකළ ඔබ විසින් දිවිතිබෙන තුරා දෙමාපියන්ට සැලකූ නිසාත්.. දිවිඇතිතුරා කුලදෙටුවන් පිදූ නිසාත්.. දිවි ඇති තෙක්ම මධුර වූ සොඳුරු වචන කතාකළ නිසාත්..කිසි-කලෙක කේලම් කියා දෙපිරිස් බිඳවා නැති නිසාත්.. මසුරු මළ දුරුකරමිකියා ගිහිගෙයි විසූ නිසාත්.. දන් දෙන්න සිතාගෙනම අත්හරින කෙනෙක්වූ නිසාත්.. දන් දෙන්න සිතාගෙනම දෑත් සෝදාගෙන සිටිනිසාත්. දන් දීමටම කැමතිවූ නිසාත්.. දන් බෙදන්නට කැමති වූ නිසාත්.. දිවි ඇතිතුරුම සත්‍ය වචන කියූ නිසාත් ... ජීවිතය තිබෙන තුරු ක්‍රෝධ නොකළ නිසාත් උපන් ක්‍රෝධය වහාම දුරුකරවන නුවණ තිබු නිසාත් දෙවිඳුණී.. ඔබට ඒ ශක්‍ර පදවිය ලැබුණු බව තථාගත බුදුරජාණන් වහන්සේ මහාලී නම් ලිච්ඡවියාට කියූ බව මම ඇසුවෙමි. සැබෑ සත්පුරුෂ ගති ඇති උතුමාණෙනි... අසිරිමත් ගුණ ඇති දෙවිඳුණී... ඔබවහන්සේ ස්වකීය පුතුන් ට කිව්වේ "ශෝක පීඩා නැති උතුම්ම නිවනම සැපයි කියලයි" .. සැබවින්ම දෙවිඳුණී.. ඉපදීම ඇති සියළු තැන්හි දුක ඇතිම බව සිතා නිවනම උතුම්බැව් දෙව් පුතුන්ටද කියූ කරුණෙන්ම ඔබවහන්සෙගේ ශ්‍රේෂ්ඨ බවම සිතාගත හැකිය. දෙවිඳුණී.. ඇතැම් විට අපගේ තථාගතයන් වහන්සේ සක්දෙවිඳුන් තුළ ඇති ගුණධර්ම මේවායි භික්ෂූන් වහන්සේලාට කියාදුන්නා. ඉවසීම ගැන ක්‍රෝධ නොකිරීම ගැන .. භික්ෂූන් වහන්සේලාටත් සක් දෙවිඳුන්ගෙන් ආදර්ශ ගන්නැයි කියා තිබෙනවා.

1. ශ්‍රද්ධාව දියුණු වීම.
2 තම ජීවිතයට ආරක්ෂාවක් ලැබීම.
3. හිතේ සතුට දියුණු වීම.
4. පිං සිදු වීම
5. සිත එකඟ වී සමාධිය ඇති වීම යනුවෙනි.

මෙම භාවනාව නිසා ඉගෙනගන්නා ළමයිනගේ ඉගෙනුම් හැකියාව, දියුණු වන අතර සමාජයට ප්‍රියමනාප කෙනෙකු වශයෙන් ජීවත් වීමටද හේතු වන බව මතක්කරනු කැමැත්තෙමු.

### 1 පියවර

1.බුද්ධ ප්‍රතිමාවක් හෝ බුද්ධ රූපයක් සොයාගන්න

2. එය උස් තැනකින් තැන්පත් කරගන්න (අඩි 1.5ක් 2ක් පමණ උසකින්)

3. දැන් ඔබ එම පිළිම වහන්සේ හෝ රූපය ඉදිරියෙන් භාවනාවට සුදුසු ආකාරයෙන් වාඩි වෙන්න.(පිරිමි ළමයෙකුට බද්ධ පර්යංකයත් ගැහැණු ළමයෙකුට අර්ධ පර්යංකයත් සුදුසුය.)

4. බුද්ධ රූපයේ ඉදිරිපසින් අඩි 3.5 ක් පමණ ඈතින් වාඩිවී නමස්කාරය තුන් වතාවක් කියා පන්සිල් සමාදන් වී කෙටියෙන් වන්දනාකොට තුනුරුවන්ට මාගේ සිත, කය, වචනය යන තිදොරින් යම් වරදක් සිදි වී ඇත්නම් ත්‍රිවිධ රත්නයෙන් මට සමාව ලැබේවායි ද මාගේ ජීවිතය තුනුරුවන්ට පූජා වේවායිද තිසා භාවනාවට සූදානම් වන්න. කොන්දත් හිසත් කෙළින් තබාගන්න.

5. දැන් පිළිම වහන්සේ දෙස ඇස් ඇරගෙන බලා සිටින්න. සිත වෙන අරමුණුවල යා නොදී මෙම අරමුණෙහිම රඳවන්න. පිළිම වහන්සේගේ ශීර්ෂයේ සිට සිරිපතුල දක්වා හෙමින්සීරුවේ ඇසත් සිතත් ගමන් කරවන්න. මෙය මනා අවධානයකින් යුතුව හතර පස් වතාවක් කරනු මැනවි.
6. ඉන් පසුව ඇස් පියාගෙන බුදුරුව දෙස මනැසින් බලන්න. මේ පියවර හතර පස් වතාවක් කරන්න.

### 2 පියවර

ඉතිපිසෝ පාඨය පද කඩමින් ශබ්දනගා කියවන්න.(තමන්ට පමනක් ඇසෙන අයුරින් කියවීම සුදුසුයි.)

පද කඩන්නෙ මෙසේය

ඉතිපිසෝ භගවා / අරහං / සම්මා සම්බුද්ධෝ / විජ්ජාචරන සම්පන්නෝ / සුගතෝ / ලෝකවිදූ / අනුත්තරෝ / පුරිසධම්ම සාරථී/ සත්ථා දේව මනුස්සානං / බුද්ධෝ භගවාති. මෙය හතර පස් වතාවක් කියවන්න. මේ පියවර වැඩියෙන් භාවනා කිරීමට ඔබේ කැමැත්තක් ඇතිවන්නේ නම් නවගුණ ඇට වැලක් ගෙන එක් එක් බුදු ගුණයට එක එක නවගුණ ඇටය බැගින් යවමින් මෙම අභ්‍යාසය කළ හැක.

## 3 පියවර

1. බුදුගුණ එකින් එක ගෙන ඒවායේ තේරුම් මෙනෙහි කරමින් භාවනා කිරීමටයි දැන් අපි සූදානම් වන්නේ. අරහං බුදුගුණය රැගෙන භාවනා කරන විට එහි තේරුම් මෙසේ ගත හැකිය.

මගේ බුදුපියාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ සේක. සියලු දෙව් මිනිසුන්ගේ ආමිෂ පූජා, ප්‍රතිපත්ති පූජා ලැබීමට ඉතාමත් සුදුසු වන සේක.

මෙයද මුලදී ශබ්දනගා කියවා පසුව සිතින් සිතීම පමණක් කරන්න. මුලදී අරහං නම් වන සේක යන්න තුන් වතාවක් කියවා පසුව වාර ගනන 4/5/6/7/8 ආදී වශයෙන් වැඩි කරන්න.

මේ පියවරේදී සිත හොඳින් එකඟවී හිතේ සමාධිය ගොඩ නැගේ. ඒ නිසා මෙම පියවර විනාඩි තුනේ සිට විනාඩි 5/10/15/20/30 ආදී වශයෙන් අනුක්‍රමයෙන් වැඩි කළ හැකිය. එසේ ටිකෙන් ටික කාලය වැඩි කොට භාවනා කිරීමෙන් ඔබේ සිතට ලොකු සැහැල්ලුවක් දැනෙන්නට පටන් ගනී.

සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න ආදී අනෙක් ගුණයන් අනුවද ඒවායේ අර්ථය මෙනෙහි කරමින් භාවනා කිරීමෙන් ඔබේ චිත්ත සමාධිය තව තවත් දියුණු කරගත් හැක.

මෙම භාවනාව ළමයින්ට පමණක් නොව වැඩිහිටි අයට ද චිත්ත සමාධිය ඇතිකර ගැනීමට උපකාරී වන කමටහනක් බැව්ද සැලකුව මැනවි.

බුද්ධානුස්සති භාවනාව නිවසේදී හෝ පන්සලේදී හෝ වන්දනාවකට අනතුරුව සිදු කිරීමට පුරුද්දක් කරගන්න.

මෙය සිව් ඉරියව්වේදීම වැඩිය හැකි භාවනාවක් බව සිහියේ තබා ගන්න.

භාවනාව අවසන් වී ඥාති හිතමිත්‍රාදීන්ට හා දෙව් දේවතාවුන්ට පින් දෙන්න

ඉන් අනතුරුව මේ ප්‍රශ්ණ කීපයට පිළිතුරු සපයාග න්න.

1. වෙන අරමුණුවලට යා නොදී සිත බුද්ධානුස්සතියෙහිම රඳවාගත හැකි වීද ?

2.මේ භාවනාව වැඩීමෙන් කායික මානසික සුවයක් දැනෙන්නේද ?

3. සිතේ ඇතිවන අශාව, තරහව ඊර්ශ්‍යාව වැනි හැඟීම් පාලනය කරගැනීමට භාවනාවෙන් අනුබලයක් ලැබුනේද ?

**පූජ්‍ය දොරලියද්දේ සුදස්සී හිමිපාණන්ගෙ ලිපියක්**

උපුටා ගැනීම : මෙත්සවිය / දෙවන කලාපය / (2003) පළමු කාණ්ඩය



මෙත්සවිය මගින්, ශ්‍රී ලංකාද්වීපයේ 75 වන නිදහස් සංවත්සරය තිරසාර ලෙස සැමරීමේ වැඩපිළිවෙළක් ලෙස විනාශාභිමුඛයට යන බුද්ධ ශාසනය නැවත ගොඩ ගැනීමේ ප්‍රයත්නයක් වශයෙන් 2023.02.04 දින කළුතර සාමණේර භික්ෂු පුහුණු මධ්‍යස්ථානය අරඹා

# කුලදරුවන් 5 දෙනෙකු මහණ කිරීම ආරම්භ කිරීමේ අවස්ථාව


























## මෙත්සවිය මගින්, ශ්‍රී ලංකාද්වීපයේ 75 වන නිදහස් සංවත්සරය තිරසාර ලෙස සැමරීමේ වැඩපිළිවෙළක් ලෙස විනාශාභිමුඛයට යන බුද්ධ ශාසනය නැවත ගොඩ ගැනීමේ ප්‍රයත්නයක් වශයෙන් 2023.02.04 දින කළුතර සාමණේර භික්ෂු පුහුණු මධ්‍යස්ථානය අරඹා කුලදරුවන් 5 දෙනෙකු මහණ කිරීම ආරම්භ කිරීමේ අවස්ථාව සහභාගී වූ සහ උර දුන් පිරිස්













# අධ්‍යාපනික වැඩමුළුව 2023



**2022 අප්‍රේල් 02 වන දින කොළඹ, විශ්ව විද්‍යාලයේ විද්‍යාපීඨ පරිශ්‍රයේ නව කලාගාරයේ ශාලාවෙහි පැවැත් වූ,**

සාර්ථකව ඉගෙනගන්නා ක්‍රම සහ විභාග සමත් වීමේ ක්‍රම පිළිබඳ වැඩසටහන

































මහාචාර්ය චන්දන ජයරත්න ගුරුතුමන්ගේ උදාර සංකල්පයක් ලෙස ඇරඹි මෙත්සවිය  සදහම් අරණ දෙවන අදියර ලෙස ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙනෙහි මෙත්සවිය ධර්ම දූත ඒකකය අරඹා



# 2023 වෙසක් මස 04 වන දින කුල දරුවන් නව දෙනෙකු සසුන්ගත කිරීමේ පුණ්‍යමහෝත්සවය























මෛත් සවිය
ධර්මදූත වැඩසටහන් ඒකකය
විහාරමහාදේවී පිරිවෙණ
ඇල්පිටිය



**මහාචාර්ය චන්දන ජයරත්න ගුරුතුමන්ගේ උදාර සංකල්පයක් ලෙස ඇරඹි**
**මෙත්සවිය සදහම් අරණ දෙවන අදියර ලෙස මෙත්සවිය ධර්ම දූත ඒකකය අරඹා**

# 2023 වෙසක් මස 04 වන දින පැවිදි කල ස්වාමීන් වහන්සේලාට පොත්පත් පූජා කිරීම සහ මදුරු දැල් පූජා කිරීම. (2023.06.23)




















ආසියාවේ හොඳම විද්‍යාඥයන් සිය දෙනා අතරට
ලංකාවෙන් තෝරාගත් විද්‍යාඥයන්
05 දෙනා ගෙන් එක් අයෙක් වන
මහාචාර්ය චන්දන ජයරත්න
ගුරුවියාණන්ව මෙත්සවිය කමිටු සාමාජිකයින්
විසින් හරසරින් පිළිගත් අවස්ථාව





# 20 වසරක මෙතෙක් අප ආ ගමන් මගෙහි
## නොමැකෙන පිය සටහන් වලින් බිඳක්...

2023 ... 2013

- 2003 - 06 - 08 දින කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශී බෞද්ධාශ්‍රමයේ දී පළමු ත්‍රෛමාසික භාවනා වැඩ සටහන ඇරඹීම හා මේ වන විට සසර දුකින් ගැලවීමට වෙර දරන පිංවතුන් 7,500 කට ආසන්න ප්‍රමාණයකට විදර්ශනා භාවනාව හා හතලිස් කමටහන් සහිත සමථ භාවනාව පුහුණු කරවීම.
- භාවනාවේ ප්‍රයෝජන සම්බන්ධව විද්‍යාත්මක පර්යේෂණ පවත්වන ඒ පිළිබඳ ලංකාවේ පිහිටි මුල්ම පර්යේෂණ අංශය පිහිටුවීම.
- සංසදයේ ප්‍රථම අසරණ සරණ වැඩසටහන වෙනුවෙන් මතුගම බෙලිගහ අසරණ පවුලකට නිවසක් තනා දීම. (2003.09.19)
- ඇඹුල් ගම රජමහා විහාරස්ථානයට සක්මන් මළුවක් සාදා පූජා කිරීම. (2005. 05. 15)
- මෙත් සවිය ලේ දන්දීමේ පුණ්‍යොත්සවය ආරම්භය (2004.5.30)සුනාමියෙන් විපතට පත් වූවන් සඳහා 2004. 12. 27 සිට 2004. 12. 30 දක්වා වෛද්‍ය කඳවුරු 20 ක් පැවැත්වීම සහ ලක්ෂ 6 කට වැඩි භාණ්ඩ බෙදා දීම.
- දාන - සීල - භාවනා වැඩ සටහනක දී රු. 34,000/- ක් වටිනා පොත් 55 කින් යුත් ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව රාජගිරයේ තපෝ වනය භාවනා මධ්‍යස්ථානයට පූජා කිරීම. (2006. 01. 01)
- පිලිකුත්තුව රජමහා විහාරයේ වැසිකිළි පෙළක් තනා සඟ සතු කර පූජා කිරීම සහ දහම් පාසලට ලී බඩු පූජා කිරීම.
- මිරිසවැටිය සළපතල මළුවේ ගල් ඇතිරීම ආරම්භ කිරීම. (2007. 02. 14)
- අනුරාධපුරය ජේතවනාරාමයට පරිගණයක් සඳහා යූ. පී. එස්. බල සැපයුම් යන්ත්‍රයක් පූජා කිරීම. (2007. 02. 04)
- මෙත් සවිය සාමාජිකයින් විසින් අසරණ සරණ සඳහා පිං කැට වලට එකතු කරන ලද රු. 83,900/- මුදලින් ගවයන් නිදහස් කිරීම. (2007. 05. 13)
- මෙත් සවිය මගින් දඹාන හා දිඹුලාගල ආදී වාසීන් සඳහා නිවාස තනා දීමේ පළමු අදියර 2007. 05. 26 / 27 යන දිනයන් හි සිදුකරන ලදී.
- සාර්ථකව ඉගෙනීම හා විභාග සමත් වීමේ නවීන ක්‍රමවේද පිළිබඳව වැඩමුළුව 2008. 04. 06 දිනෙන් ආරම්භ කර නොකඩවා සෑම වසරක් පාසාම පැවැත්වීම.
- අපගේ ගරු සභාපති තුමන් මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන් සහ ගරු සාමාජික අරිසෙන් අහුබුදු ශූරීන් අතිගරු ජනාධිපති තුමන් සහ අගමැතිතුමන් හමුවී සත්ව හිංසනය වැලැක්වීම පිළිබඳව නීතිමය පියවරක් ඉල්ලා සිටීමේ අත්සන් ලක්ෂයකින් යුත් ලියවිල්ල භාර දීම (2008). මේ වන විට එම නීති සංශෝධනය වී බොහෝමයක් ක්‍රියාවට නංවා ඇත.
- හම්බන්තොට අති දුෂ්කර පාසලක් වන සූරියවලාන විදුහලේ පරිගණක විද්‍යාගාරයක් තැනීම සඳහා පරිගණක හතරක් ලබා දීම. (2010)
- යුද්ධය නිමා වී මාස 6 ක් යාමට පෙර ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් සඳහා අත්‍යවශ්‍යව තිබූ වැසිකිළි පද්ධතියක් හා ජල ටැංකි නාගදීප විහාරස්ථානයට පූජා කිරීම. (2010)
- අසරණ රෝගීන් සඳහා නොමිලේ රෝදපුටු හා කිහිළි කරු පරිත්‍යාග කිරීම.
- වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ පැරණි ධර්ම ශාලාව ප්‍රතිසංස්කරණය කර භාරදීම.
- අංගොඩ මානසික රෝහලේ 21 වන වාට්ටුවට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම හා ඉඳගැනීම සඳහා එළිමහනේ බංකු සවිකිරීම.
- 2011 වසරේ දී රුපියල් ලක්ෂ 5 ක පමණ වියදමින් මහියංගන රාජ මහා විහාර පුණ්‍ය භූමියේ ඉදි කරන ලද ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පිරිසකට එකවර පෙරණ ලද පිරිසිඳු ජලය සැපයිය හැකි නවීන තාක්ෂණය පදනම් වූ ජල පෙරණ සහිත පානීය ජල ව්‍යාපෘතියක් තැනීම.
- වාර්ෂිකව ගංගාරාමයට ජනවාරි මස පළමු දින වසරේ ප්‍රථම දානය පූජා කිරීම.
- ශබ්දවාහිනී යන්ත්‍ර, කලුවාමෝදර පංචකප දූපතේ ආරාමයට පූජා කිරීම හා එහි ධර්මශාලාවේ වහලය තනා දීම.
- වාර්ෂිකව අක්ෂි සායන පවත්වා නොමිලේ ඇස් කණ්නාඩි ලබා දීම.
- වාර්ෂිකව මෛත්‍රී භූෂණ සම්මානයෙන් පිදිය යුත්තන් පිදීම.
- වාර්ෂිකව බොරැල්ල ජයන්ති ළමා නිවාසයේ සිටින අසරණ ළමුන්ට ආහාර ඇතුළු අවශ්‍ය කළමණා පරිත්‍යාග කිරීම.
- කොළඹ ජාතික රෝහල, මහරගම අපේක්ෂා රෝහල, නයනාරෝග්‍ය ශාලාව හා රිජ්වේ ළමා රෝහල් වලට බුදුපිළිම, බෙහෙත් හා වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම.
- බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදුකල මහියංගන රාජමහා විහාරයේ අඩි 84 ක් උසැති 2600 සම්බුද්ධ ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ තැනීමේ කටයුතු 2012. 01. 08 වන දුරුතු පෝදා ආරම්භ කර ඉදිකිරීමේ කටයුතු කරගෙන යාම.
- වැල්ලවත්තේ ශ්‍රී විජයාරාමයේ දී 2014 මැයි 12-18 වෙසක් සතිය තුළ පැවැත් වූ ප්‍රථම නේවාසික වැඩසටහන.
- මහරගම අපේක්ෂා රෝහලට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය සහ උපකරණ ලබාදීම.

- 2015 වසරේ ආදිවාසී දරුවන්ගේ දහම් පාසල් අධ්‍යාපනය සඳහා අවශ්‍ය පාසැල් උපකරණ ලබාදීම සහ දහම් පාසැලට අවශ්‍ය ජල පිරිපහදුකරණයක් ලබාදීම.
- ආදිවාසී ජන උරුම විහාරස්ථානයේ දාන ශාලාවේ වහලය ඉදිකිරීමට අවශ්‍ය මුදල් ආධාර ලබාදීම.
- උතුම් වෙසක් පොහොය නිමිති කරගෙන මහරගම අපේක්ෂා රෝහලේ ළමා වාට්ටුව සඳහා කිරිපිටි, බෙහෙත්, සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පූජා කිරීම (20/5/2016).
- ප්‍රියන්ත මුතුතන්ත්‍රී මහතා මෙහෙයවූ පුද්ගල සංවර්ධන වැඩසටහන (5/6/2016).
- මෙත්සවිය ත්‍රෛමාසික දාන සීල භාවනා වැඩසටහන පූජ්‍ය මඩවල උපාලි ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙන් බණ්ඩාරවෙල කිතල් ඇල්ල ආරණ්‍ය සේනාසනයේ පැවැත්වීම (3/7/2016).
- මෙත්සවිය දෙවන නේවාසික භාවනා පුහුණු වැඩසටහන වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දී ආරම්භ කිරීම (17/8/2016).
- මෙත්සවිය දෙවන නේවාසික භාවනා පුහුණු වැඩසටහන සාර්ථක ලෙස අවසන් කිරීම (26/8/2016).
- සතුන් නිදහස් කිරීමේ වැඩසටහනට අනුගාමීව සිරකරගෙන සිටි නාගයින් දෙදෙනෙක් නිදහස් කිරීම.
- පූජ්‍ය කුකුල්පනේ සුදස්සී ස්වාමීන් වහන්සේ පැවැත් වූ මෙත්සවිය පළමු ඉරුදින ධර්ම දේශනාව (4/9/2016).
- මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මැතිතුමාගේ ජන්ම දිනය නිමිති කරගෙන මෙත්සවිය තරුණ කමිටුවේ මූලිකත්වයෙන් මහා සංඝරත්නය උදෙසා දානය පිරිනැමීම සහ විධායක කමිටුවේ මූලිකත්වයෙන් පැවැත්වූ අටවිසි බුද්ධ පූජාමය පිංකම (8/9/2016).
- වාර්ෂිකව සැප්තැම්බර් 8 වන දින මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මහතාගේ ජන්ම දිනය නිමිති කොටගෙන මහා සංඝරත්නය සඳහා දහවල් දානය පිරිනැමීම හා සතුන් නිදහස් කිරීම.
- පූජ්‍ය මීරාවත්තේ පඤ්ඤාසීල ස්වාමීන් වහන්සේ පැවැත්වූ පළමු ඉරුදින ධර්ම දේශනාව (2/10/2016).
- නියගයෙන් පීඩාවට පත් අනුරාධපුරය පොලොන්නරුව ආදී ප්‍රදේශවල ජනතාවට ජලය බෙදාදීම (15/10/2016).
- මෙත්සවිය 35 වන චිත්ත සංයමය භාවනා වැඩසටහනේ ආරම්භය (23/10/2016).
- මාසික පළමු ඉරුදින වැඩසටහන පිණිස මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මහතා පැවැත් වූ, ලෝක විෂය, විශ්වයේ සම්භවය, ලෝකයේ සත්වයාගේ හටගැනීම හා ලෝක විනාශය බුදු නෙතින් හා විදු ඇසින් දේශනය (6/11/2016).
- ගම්පහ පාසාධික ස්වාමීන් වහන්සේ පැවැත්වූ මාසික පළමු ඉරුදින ධර්මදේශනය (6/11/2016).
- මාසික පළමු ඉරුදින වැඩසටහන සඳහා මහාචාර්ය දයා රෝහණ අතුකෝරාළ මහතා පැවැත් වූ, ජීවිතය ජයගන්නා අන්දම පිළිබඳ මනෝවිද්‍යාත්මක පුද්ගල ප්‍රවර්ධන දේශනය (4/12/2016).
- වසරේ ප්‍රථම හීල් දානමය පින්කම හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ දී පැවැත්වීම සහ කොළඹ 07 ජයන්ති ළමා නිවාසයේ දරුවන් සඳහා දහවල් කෑම ලබාදීම. පසුව ජයන්ති ළමා නිවාසයේ දරුවන් හුණුපිටිය ගංගාරාමයේ ආගමික වැඩ සටහන් සඳහා කැඳවාගෙන යාමට අවශ්‍ය ප්‍රවාහන පහසු කම් ලබා දීම (1/1/2017).
- වාර්ෂිකව මෙත්සවිය සියලු සාමාජිකයින්ට සෙත්පතා අටවිසි බුද්ධ පූජාමය පින්කමක් වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ දී පැවැත්වීම (1/1/2017).
- ත්‍රෛමාසික දාන - සීල - භාවනා වැඩසටහන මිහින්තලය කළුදිය පොකුණ ආරණ්‍ය සේනාසනයේදී පැවැත්වීම සහ නොමිලේ ඇස් කන්නාඩි 186 ක් අසරණ ප්‍රදේශවාසීන් වෙත බෙදාදීම (5/2/2017).
- සාර්ථකව ඉගනගන්නා අන්දම සහ විභාග සමත්වන ක්‍රම පිළිබඳ වැඩමුළුව 750 ආසන්න පිරිසකගේ සහභාගීත්වයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ නව කලාගාර ශාලාවේදී පැවැත්වීම (5/3/2017).
- අප්‍රේල් 30 වන දින මහාචාර්යතුමා විසින් සියලුම කමිටු සාමාජිකයින් සඳහා පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන.
- මැයි 7 වන ඉරුදින විශ්වය සහ බුදු දහම වැඩසටහන මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මහතා විසින් මෙහෙයවීම.
- මැයි 11 සිට 12 දක්වා බෞද්ධාලෝක වෙසක් කලාපයට සම්බන්ධ වී සත්ත්ව ඝාතනය වැලැක්වීමේ සී.ඩී. තැටි නොමිලයේ බෙදාදීම සහ ස්වයංජාත ඇල් සහල් බෙදාදීම.
- ජූනි 4 පළමු ඉරු දින මහාචාර්ය දයාරෝහණ අතුකෝරාල මහතාගේ ''ජීවිතය ජය ගන්නා අන්දම'' දේශනය පැවැත්වීම.
- ජූනි 4 පළමු ඉරු දින ගංවතුරින් අසරණ වූවන්ට වියළි ආහාර ද්‍රව්‍ය සහ සනීපාරක්‍ෂක ද්‍රව්‍ය සහ අත්‍යවශ්‍යය ද්‍රව්‍ය කළුතර ප්‍රදේශයට ගෙනගොස් බෙදාදීම.
- ජූලි 1 වන පළමු ඉරුදින ''සාර්ථක පවුල් ජීවිතයක් පවත් වාගෙන යාම'' මැයෙන් කිරුළපන බළපොකුණ විහාරාධිපති ස්වාමීන්වහන්සේගේ ධර්ම දේශනාව සහ මහාචාර්ය චන්ද්‍රන ජයරත්න මහතා විසින් දේශනයක් පැවැත්වීම.
- ජූලි 9 වන දින ප්‍රදීප් යහම්පත් මහතාගේ ''ස්පියර් හෙඩ්'' ආයතනය මගින් සියළුම මෙත්සවිය කමිටු සාමාජිකයින් සඳහා ''නායකත්ව පුහුණු හා පෞරුෂත්ව වර්ධන'' වැඩසටහනක් ආරම්භ කිරීම.
- ජූලි 30 වන දින ''නායකත්ව පුහුණු හා පෞර්ෂත්ව වර්ධන'' වැඩසටහනේ දෙවන අදියර ක්‍රියාත්මක් කිරීම.
- අගෝස්තු 6 වන පළමු ඉරුදින රාජගිරිය කළපළුවාව නෙළුම් පෙදෙසේ දහම් මැදුර වාසී මකුලෑවේ සුදස්සන හිමිගේ ධර්ම දේශනය පැවැත්වීම.
- අගෝස්තු 27 වන දින ''නායකත්ව පුහුණු හා පෞර්ෂත්ව වර්ධන'' වැඩසටහනේ තෙවන අදියර ක්‍රියාත්මක් කිරීම.
- සැප්තැම්බර් 1 සිට 5 දක්වා කාලය තුලදී මහියංගනය රාජමහා විහාරයේ පෙරහැර පවත්වන දිනයන්හිදී, ඉදිකරමින් පවතින සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ සඳහා ආධාර ටිකට් පත්‍රිකා මෙත් සවිය සාමාජිකයින් විසින් විකිණීම.

- සැප්තැම්බර් 17 වන දින මෙත් සවිය හා මැද කොළඹ රොටරි සමාජය ඒකාබද්ධව අක්ෂි සායනයක් සහ ශ්‍රවණාධාර උපකරණ බෙදාදීමේ කඳවුරක් පැවැත්වීම.
- සැප්තැම්බර් 24 වන දින ''නායකත්ව පුහුණු හා පෞර්ෂත්ව වර්ධන'' වැඩසටහනේ සිව්වන අදියර ක්‍රියාත්මක් කිරීම.
- සැප්තැම්බර් 30 - 1 යන දිනයන්හිදී මෙත් සවිය සදහම් චාරිකාව සඳහා මෙත් සවිය සාමාජිකයින් සමගින් මහියංගනය වෙත යෑම.
- ඔක්තෝම්බර් 22 අක්ෂි සායනයේ දී ලබා දීමට නියමිත වූ ඇස්කන්නාඩි ලබාදීම.
- නොවැම්බර් 05 පළමු ඉරුදින ඉඳුරාගාරේ ධර්මරතන ස්වාමීන් වහන්සේ විසින් ධර්මදේශණය පැවැත්වීම.
- දෙසැම්බර් 17 වන දින අසරණ සරණ කමිටුව විසින් පුස්තකාලය ප්‍රතිසංස්කරණය කර නැවත විවෘත කිරීම.
- 2018 වසරේ ප්‍රථම හීල් දානමය පින්කම හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ දී පැවැත්වීම.
- 2018 ජනවාරි 01 වන දින වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දී එක් දින අනේවාසික භාවනා වැඩසටහන පැවැත්වීම.
- 2018 ජනවාරි 01 වන දින වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙහි තැන් පත් කර ඇති මෛත්‍රී බෝධිසත්ව පිළිමවහන්සේ නිරාවරණය කිරීම.
- 2018 මාර්තු මස අධ්‍යාපන වැඩමුළුව පැවැත්වීම.
- සෑම මසක ම දෙසතියකට වරක් මහියංගනයේ ඉදිකරමින් පවතින බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම අධීක්ෂණය කිරීම පිණිස නිරීක්ෂණ චාරිකාවක යෙදීම.
- 2018 ජුනි 03 දින - මෙත්සවිය 15 වන සංවත්සරය සහ මෛත්‍රී භූෂණ උපහාර 2018 ජුනි 03 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක අග්ග මහා පණ්ඩිත කොටුගොඩ ධම්මාවාස නාහිමියන් උත්සවයේ මුලසුන දරන ලද අතර ගරු බුද්ධ ශාසන අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා ගෞරවනීය ආරාධිතයකු ලෙස උත්සවයට සහභාගිවිය
- 2018 ජුනි 03 දින - දේශීය වෛද්‍ය විශාරද ශාසන කීර්ති ශ්‍රී විද්‍යාපති පූජ්‍යපාද මහඇලගම ලංකානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෛත්‍රී භූෂණ වෛද්‍ය චක්‍රවර්තී සම්මානයෙන් සහ දේශීය වෛද්‍යශූරී රුවින්ද මාරසිංහ මැතිදුන් මෛත්‍රී භූෂණ වෛද්‍ය ශිරෝමනි සම්මානයෙන්ද පිදුම් ලදහ. පොලිසිය තුල භාවනා වැඩසටහන් ඇරඹීමේ ක්‍රියාව අගයමින් ශ්‍රී ලංකා පොලිසියේ ගරු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා ශාසනදීපන ප්‍රජාප්‍රසෝධනි සම්මානයෙන් පිදුම් ලබන ලදී.
- 2018 ජුනි 03 දින - මෙත්සවිය ශිෂ්‍යත්ව ලාභි දරුවන්ද විශේෂ ත්‍යාග සහ ශිෂ්‍යත්ව පරිත්‍යාගයන් ශිෂ්‍යත්ව දායක පින්වතුන් අතින් ලද අතර මෙත්සවිය සංසදයේ වසර 15 පුරාවට නොකඩවා සාමාජිකත්වය පවත්වාගෙන ආ සාමාජිකයන් උපහාර සම්මානයෙන් පිදුම් ලබන ලදී. මෙත්සවිය මගින් සංවිධානය කරන ලද නායකත්ව පුහුණු වැඩසටහනට සහභාගිවුවන් හට සහතික පත්‍ර ප්‍රධානයද එදින සිදු කරන ලදී.
- 2018 අගෝස්තු 08 - අපවත්වී වදාල අති පූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේගේ තෙමස් පූර්ණය සිහිපත් කරමින් කොළඹ ජාතික රෝහලේ හෘද රෝග ඒකකයට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ පරිත්‍යාග කිරීම එම රෝහල් පරිශ්‍රයේදී රණස්ගල්ලේ ඤාණවීර සමින්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.
- 2018 අගෝස්තු 12 - මෙත්සවිය තරුණ කමිටුව මගින් කඳුබොඩ භාවනා මධ්‍යස්ථානයට ප්‍රක්ෂේපණ තිරයක් **projector screen** පරිත්‍යාග කිරීම සිදු කරන ලදී.
- 2018 ඔක්තෝබර් 07 - නායකත්වය හා පුද්ගල සංවර්ධනය පිළිබඳ දේශනයක් ප්‍රදීප් යහම්පත් මහතා විසින් සිදු කරන ලදී.
- 2018 ඔක්තෝබර් 28 - මෙත්සවිය මගින් ඉදිකරන 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධප්‍රතිම වහන්සේගේ තැන්පත් කිරීම පිණිස පිරිවානා පොත් වහන්සේ තුල අඩංගු ධර්මය, රන් පත්තිරුවල ලිවීම ආරම්භ කරන ලදී.
- 2018 නොවැම්බර් 04 - මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් කාල කළමනාකරණය සහ අරමුණු ජයගැනීමල පිළිබඳ විශේෂ දේශනයක් සිදු කරන ලදී.
- 2018 නොවැම්බර් 18 දින 40 වන චිත්ත සංයම අභ්‍යාස සහ භාවනා පුහුණු වැඩසටහන ආරම්භය.
- 2018 දෙසැම්බර් 23 - මෙත්සවිය විසින් පාසල් අධ්‍යාපනය ලබන මහියංගනය ප්‍රදේශයේ අඩු අදායම් ලාභී දුවා දරුවන් 30 පමණ පිරිසක් වෙත ඔවුනට අධ්‍යාපන වර්ෂය සඳහා අවශ්‍ය බෑග්, සපත්තු ඇතුළු පාසල් ද්‍රව්‍ය ලබාදීම සිදු කරන ලදී.
- 2018 දෙසැම්බර් 23 - අබාධිත දරුවෙකු සඳහා රෝද පුටුවක් පරිත්‍යාග කිරීම සිදු කරන ලදී.
- 2019 ජනවාරි 01 - මෙත්සවිය මගින් වාර්ෂිකව සිදු කරන වසරේ ප්‍රථම හීල් දානමය පිංකම, ගරුතර මහා සංඝරත්නය උදෙසා කොළඹ හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී පවත්වන ලදී.
- 2019 ජනවාරි 01 - කොළඹ 07 ජයන්ති ළමා නිවාසයේ දරුවන් උදෙසා දහවල් දානමය පිංකම සිදු කරන ලදී. මෙහිදී මෙත්සවිය සාමාජිකයන්ගේ දායකත්වයෙන් දරුවන්ට අවශ්‍ය පාසල් බෑග්, සපත්තු, පොත් පත් සහ ත්‍රෛසිකල් ලබාදී දරුවන් සතුටු කිරීමට හැකි විය.
- 2019 ජනවාරි 01 - සවස සියළු මෙත්සවිය සාමාජිකයන්ට සෙත් පතා මෙත් බෝධි පූජාවක් වැල්ලවත්ත ශ්‍රී විජයාරමයේදී පවත්වන ලදී.
- 2019 ජනවාරි 06 - මෙත්සවිය මගින් සංවිධානය කරන මාසයේ පළමු ඉරුදින වැඩසටහන ඇස්වැද්දුමේ කමලසීල ස්වාමීන්වහන්සේගේ වැඩමවීමෙන් බොරැල්ල ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේදී පවත්වන ලදී.
- 2019 ජනවාරි 20 - මෙත්සවිය මගින් අබාධිත අය සඳහා පරිත්‍යාග කිරීම පිණිස රෝද පුටුවක් මහියංගන රජමහා විහාරයට පරිත්‍යාග කිරීම සිදු කරන ලදී.
- 2019 පෙබරවාරි 03 - මෙත්සවිය ත්‍රෛමාසික දාන-සීල-භාවනා වැඩසටහන බණ්ඩාරවෙල රත්මල්කන්ද භාවනා මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ගරුතර මඩවල උපාලි නායක ස්වාමීන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් ඉතා අගනා ධර්ම දේශනා කිහිපයකින් සහ භාවනා පුහුණු වැඩසටහනකින් යුක්ත වූ මෙම වැඩසටහන මෙත්සවිය සාමාජිකයන් 200 ගේ පමණ සහභාගීත්වයෙන් සිදු කරන ලදී.

- 2019 මාර්තු 03 - මෙත්සවිය මගින් ඉගෙන ගන්නා දරුවන් වෙනුවෙන් සංවිධානය කරන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන ක්‍රම පිළිබඳ වන වැඩමුළුව මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් බොරැල්ල තරුණ බෞද්ධ සංගම් ශාලාවේදී (ශඑඊ) පවත්වන ලදී.

- 2019 මාර්තු 24 දින 41 වන චිත්ත සංයම අභ්‍යාස සහ භාවනා පුහුණු වැඩසටහන ආරම්භය.

- වසර පුරාම දිවයිනේ නන් දෙසින් අයදුම් කල ඉතා අඩු ආදායම් ලාභී සිසුන් 50කට පමණ මාසිකව ශිෂ්‍යත්ව මුදල් පිරිනමන ලදී

- 2020 මැයි මස 26 දින මෙත්සවිය සංසදය මගින් සම්බන්ධීකරණය කර, මෙත්සවිය අධීක්ෂණ කමිටු සාමාජික වික්‍රම ගුණදාස මහතාගේ දායකත්වයෙන් අසරණවූ අයකුට රෝද පුටුවක් පරිත්‍යාග කිරීම. මෙම කටයුත්තට අදාල ප්‍රවාහන වියදම් හේමන්ති පෙරේරා මහත්මිය දරණ ලදී.

- කොවිඩ් 19 උවදුර පිටුදැකීමට උපකාර කිරීමට ජංගම දුරකථන යෙදවුමක් ජාතික පර්යේෂණ සභාව මගින් ගොඩනැගිම සිදුකල අතර මෙත්සවිය පර්යේෂණ කමිටුව සහ මෙත්සවිය වෙබ් හා මාධ්‍ය කමිටුව මගින් මෙම ජංගම දුරකථන යෙදවුම ගොඩනැගීමට ඉමහත් දායකත්වයක් ලබාදෙන ලදී. මිතුරු මිතුරෝ වෙනුවෙන් මත්ද්‍රව්‍ය භාවිත නිවාරණය සඳහා උදව් දෙන නව ජංගම දුරකථන යෙදවුමක් ද නිර්මාණය කෙරෙමින් පවතී.

- 2020 ජුනි මස, මෙත්සවිය අසරණ සරණ කමිටුවේ ප්‍රධානත්වයෙන් මරණයට නියම වී සිටි ගවයන් 9 දෙනෙකු නිදහස් කර වව්නියාවෙන් ඔබ්බෙහි මායිම් ගමක් ව පැවති හොරොව්පතාන ගම්මානයේ ජීවත්වන ආර්ථික දුෂ්කරතා ඇති පවුල් වෙත ලබා දෙන ලදී. අද ඔවුහු කිරි විකුණා ජීවිකාව රැකගනිති.

- 2020 අගෝස්තු 02 දින මෙත්සවිය 17 වන සංවත්සරය සහ වාර්ෂික මහා සමුළුව බොරැල්ල ශ්‍රී ලංකාරාමයෙදී පවත්වන ලදී. වාර්ෂික මහා සමුළුවට සමගාමීව මියගිය මෙත්සවිය සමාජිකයන්ට පිං අනුමෝදම් කිරීමේ සහ සියළු මෙත්සවිය සාමාජිකයන්ට සෙත් පැතීමේ අරමුණින් සංඝගත දක්ෂිණාවක් මෙත්සවිය කාන්තා කමිටුවේ සංවිධාන ශක්තියෙන් සහ මෙත්සවිය සාමාජිකයන්ගේ මුල්‍යමය පරිත්‍යාගයෙන් සිදුකරන ලදී. එදින සවස කැස්බෑව ශාසනාරක්ෂක බලමණ්ඩලයේ ලේඛකාධිකාරී ගොම්බද්දර ධමිත ස්වාමීන්වහන්සේ විසින් රැස්ව සිටි මෙත්සවිය සාමාජිකයන් වෙත වටිනා ධර්ම දේශනයක් පවත්වන ලදී.

- 2020 නොවැම්බර් 15න් පසු කොවිඩ් දෙවන රැල්ල මත නැවත 2021 අප්‍රේල් 25 අරඹන තෙක් භාවනා වැඩසටහන් තාවකාලිකව නවතා දමන්නට සිදු විය. මෙම කාලය තුල විධායක කමිටවු සෑම සතියක ම ඉරු දින සවස 5.30 ට **ZOOM** හරහා රැස්වීම් පවත්වා ඇත.

- 2020 සැප්තැම්බර් 01 දින මෙත්සවිය සාමාජිකයන් පිරිසක් මහියංගනය බුදුපිළිමවහන්සේ ඉදිකෙරෙන භූමියේ නිරීක්ෂණ චාරිකාවක් සිදුකර, එදිනම ශ්‍රමදානයක් සංවිධානය කර පිළිම වහන්සේ ඉදිකරන සීමාමාලකය අවට ප්‍රදේශය එළිපෙහෙළි කර පිරිසිදු කරන ලදී.

- තම නිවසේ වහලය පිළිසකර කරගැනීමට අපහසුව සිටි මෙත්සවිය සාමාජිකාවගේ නිවසේ වහලය මෙත්සවිය අසරණ සරණ කමිටුවේ මූලිකත්වයෙන් 2020 සැප්තැම්බර් 08 වන දින පිළිසකර කර දෙන ලදී.

- 2020 සැප්තැම්බර් 13 දින අසරණව සිටි රෝදපුටුවක් අවශ්‍ය මවකට රෝදපුටුවක් පරිත්‍යාග කිරීම අසරණ සරණ කමිටුවේ මූලිකත්වයෙන් සිදු කරන ලදී.

- කොවිඩ් උවදුර මත ඇතිවී තිබු අපහසුතාවයන් මගහරවා ගැනීම පිණිස මෙත්සවිය කාන්තා කමිටුවේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකාරාමයේ වැඩිහිටි නිවාසය වෙත වියලි අහාර පරිත්‍යාග යක් 2020 දෙසැම්බර් මස සිදු කරන ලදී.

- 2020 සැප්තැම්බර් මස මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ ජන්මදිනය නිමිතිකොට ගෙන මෙත්සවිය කාන්තා කමිටුවේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකාරාමයේ වැඩිහිටි නිවාසය අළුතින් වර්ණ ගන්වා පිළිසකර කරන ලදී.

- 2020 සැප්තැම්බර් 13 දින මෙත් සවිය සනීපාරක්ෂක කටයුතු සඳහා දායක වන රීටා ආච්චිට නිවසක් තනා දී පරිත්‍යාග කිරීම අසරණ සරණ කිමිටුවේ අනුග්‍රහයෙන් සිදු කරන ලදී.

- 2020 සැප්තැම්බර් 19 දින මෙත්සවිය සියලූම කමිටු දායකත්වයෙන් සහ අසරණ අරණ කමිටුවේ සංවිධාන ශක්තියෙන් මරණයට නියම කරන ලද කිරි ගවයන් 8 දෙනුකු නිදහස් කර දුෂ්කර ප්‍රදේශවල අඩු අදායම් ලබන පවුල් 6 ක් සඳහා පරිත්‍යාග කරන ලදී.

- මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ ජන්මදිනය වෙනුවෙන් 2020 සැප්තැම්බර් 20 දින මෙත්සවිය කාන්තා කමිටුවේ සංවිධානයෙන් ශ්‍රී ලංකාරාමයේ වැඩිහිටි නිවසේ නේවාසිකව සිටින වැඩිහිටි මව් - පියවරු වෙත ඔවුනට අවශ්‍ය රෙදිපිළි පරිත්‍යාග කරන ලදී. එම කටයුත්ත සඳහා මුල්‍ය දායකත්වය කාන්තා කමිටුවේ උපසභාපතිනිය වන හේමන්ති පෙරේරා මහත්මිය ලබාදෙන ලදී.

- කොවිඩ් කාලය තුල අසරණ භාවයට පත් වූ මෙත් සවිය සාමාජිකයන්ගේ ඉල්ලීම පරිදි මහචාර්ය චන්දන ජයරත්න මහතා විසින් රුපියල් ලක්‍ෂයකට අධික මුදලක් අපසු නොග න්නා ආධාර ලෙස සිය ධන පරිත්‍යාගයෙන් ලබාදීම සිදුවිය.


- සෑම වර්ෂයකම සිදුකරන වසරේ ප්‍රථම හීල් දානමය පිංකම මෙත්සවිය කාන්තා කමිටුවේ සංවිධාන ශක්තියෙන් 2021 ජනවාරි 01 වන දින හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදි ස්වාමින්වහන්සේලා 37 නමක් උදෙසා මෙත් සවිය සාමාජිකයින් ඉතා සුළු පිරිසකගේ (50 දෙනෙකු පමණ) සහභාගීත්වයෙන් (කොවිඩ් 19 තත්වය මත පනවා තිබු සීමා නිසා) සිදු කරන ලදී.

- මෙත්සවිය සංසදය මගින් සෑම වර්ෂයකම ජනවාරි 01 දින කොළඹ 07 ජයන්ති ළමා නිවාසයේ කුඩා දරුවන් උදෙසා දහවල් දානමය පිංකමක් සිදුකලද කොවිඩ් උවදුර නිසා එම පිංකම සඳහා මුල්‍යමය දායකත්වය පමණක් ලබාදී එම පිංකම 2021 ජනවාරි 01 සිදු කරන ලද අතර මුල්‍යමය දායකත්වය මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා දරණ ලදී.

- 2020 නොවැම්බර් 22 වන ඉරු දින මෙත්සවිය කළුතර ශාඛාව කළුතර පරදුව තෝරගල්ල සිරි සදහම් අරණ විහාරයේ ස්ථාප නය කරන ලදී. එම ස්ථානයේ සසුන්ගත වී පිරිවෙන් අධ්‍යාපනය සිදුකල හැකි පරිදි භික්ෂූන්වහන්සේ 15 නමක් උදෙසා අවශ්‍ය කුටි ඇතුළු සියළු යටිතල පහසුකම් ගොඩනැගීම ආරම්භ කර ඇති අතර මේ වනවිට එම ව්‍යාපෘතියේ අවසන් අදියරට පැමිණ ඇත. ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සහ නියාමනය අසරණ සරණ කමිටුවේ සහ විධායක කමිටුවේ දායකත්වයෙන් සිදු කරන ලදී.

- මෙත්සවිය කළුතර ශාඛාවට අනුබද්ධව පරදුව තෝරගල්ල සිරි සදහම් අරණ විහාරයේ මෙත්සවිය සංසදය මගින් ආර්ථික අපහසුතා ඇති පවුල්වල දරුවන් උදෙසා පෙරපාසලක් ආරම්භකිරීමට සියළු වැඩකටයුතු සංවිධානය කර ඇති අතර කොවිඩ් තත්වය මත ඇතිවී තිබෙන සීමාවන් ලිහිල්වූ නිසා පෙර පාසැල 2021 අප්‍රේල් 18 දින ආරම්භ කරනු ඇත.
- 2021 පෙබරවාරි 24 වන දින බොරැල්ලේ ලංකාරාමයේ විහාරාධිපති වීරගොඩ ඥාණ ස්වාමීන්වහන්සේ වෙත රුපියල් ලක්ෂ 04 ක පමණ වියදමින්, වායු සමීකරණ සහිත කුටියක් තනා පූජා කරන ලදී.
- 2021 නොවැම්බර් 7 වනදින මෙත්සවිය වාර්ෂික මහා සමුළුව බොරැල්ල ශ්‍රී ලංකාරාමයේදී පවත්වන ලදී.
- මෙත්සවිය 18 වන වාර්ෂික මහා සමුළුව පදනම් කර ගනිමින්, 2021 නොවැම්බර් 7 වන දින මෙත් සවිය මාධ්‍ය ජාලයේ කටයුතු ආරම්භ කරමින්, එහි පළමුවන පියවර ලෙස මෙත්සවිය යූ ටියුබ් ( You Tube ) නාලිකාවේ ප්‍රථම ධර්ම දේශනාව පූජ්‍ය දිවිතුරේ සුනීත ස්වාමින්වහන්සේ විසින් පවත්වන ලද ධර්ම දේශනාව මෙත්සවිය ( You Tube ) නාලිකාව හරහා විකාශනය කිරීමට කටයුතු යොදා තිබුණි.
- 2021 දෙසැම්බර් 4 දින පූජ්‍ය මකුළුදූවේ නන්දාරාම හිමි විසින් බොරැල්ල ශ්‍රී ලංකාරාමයේදී මෙත්සවිය සාමාජිකයින් උදෙසා ධර්ම දේශනාවක් පවත්වන ලදී.
- 2021 දෙසැම්බර් 13 වනදින, මියගිය මෙත්සවිය සාමාජිකයන්ට පිං අනුමෝදන් කිරීම පිණිසත්, සියළු මෙත්සවිය සාමාජිකයන්ට ආශිර්වාද පිණිසත් මහා සංඝරත්නය 12 නමක් උදෙසා සංඝගත දක්ෂිණාවක් බොරැල්ල ශ්‍රී ලංකාරම යෙදී පිරිනමන ලදී.
- 2022 ජනවාරි 1 වන දින මෙත්සවිය මඟින් මහාසංඝරත්නය උදෙසා වාර්ෂිකව පවත්වන හීල් දානමය පිංකම හුණුපිටිය ගංගාරාමය විහාරස්ථානයේදී පවත්වන ලදී. තවද, සෑම ජනවාරි 1 වන දිනකම සිදුකරන, බොරැල්ල ජයන්ති ළමා නිවාසයේ සිඟිති දරුවන් උදෙසා ලබාදෙන දිවා ආහාරමය පිංකම කොවිඩ් 19 - තත්වය නිසා සහභාගීත්වයකින් තොරව සිදු කිරීමට කටයුතු යොදා තිබිණි.
- 2022 ජනවාරි 23 දින මෙත් සවිය 45 වන කණ්ඩායම ආරම්භ කරන ලදී.
- 2022 පෙබරවාරි 6 දින පූජ්‍ය තිත්තගල්ලේ ආනන්ද සිරිහිමි විසින් බොරැල්ල ශ්‍රී ලංකාරාමයෙදී මෙත්සවිය සාමාජිකයින් උදෙසා ධර්ම දේශනාවක් පවත්වන ලදී.
- 2022 මාර්තු 04 වන දින මෙත් සවිය අසරණ සරණ කමිටුවේ මූලිකත්වයෙන් හොරොව්පතාන ප්‍රදේශයේ සිසුවෙකුට අංගසම්පූර්ණ පරිගණකයක් ලබාදීමට කටයුතු කරන ලදී.
- 2022 මාර්තු 06 දින පූජ්‍ය මඩිහේ සුගත හිමි විසින් බොරැල්ල ශ්‍රී ලංකාරාමයේදී මෙත්සවිය සාමාජිකයින් උදෙසා ධර්ම දේශනාවක් පවත්වන ලදී.
- 2022 අප්‍රේල් 02 දින මෙත්සවිය මගින් කළුතර ශාඛාවේ පවත්වාගෙන යන ළදරු පාසලෙහි වාර්ෂික විවිධ ප්‍රසංගය පවත්වන ලද අතර නව සිසුන් බඳවා ගැනීම සිදු කරන ලදී.
- 2022 අප්‍රේල් 02 දින රටෙහි මතුව ඇති අර්බුදකාරි තත්වයට සෙත්පතා ආශිර්වාද පිංකමක්, මෙත්සවිය සමාජිකයින්ගේ සහභාගිත්වයෙන්, අනුරාධපුර රුවන්වැලිමහා සෑ රජුන් සහ ශ්‍රී මහාබෝධීන් වහන්සේ අසල පවත්වන ලදී.
- 2022 මැයි 14 දින වෙසක් පෝය නිමිති කොට ගෙන කළුතර ශාඛාවේදී ළදරු පාසලෙහි දරුවන් උදෙසා සීල සමාදාන වැඩසටහන්ක් පවත්වන ලදී.
- 2022 මැයි 16 දින මෙත්සවිය සාමාජිකයින් උදෙසා නේවාසික භාවනා වැඩසටහනක් පවත්වන ලදී.
- 2022 ජුනි 05 දින කොල්ලුපිටියේ පඤ්ඤාසාමිමල හිමි විසින් බොරැල්ල ශ්‍රී ලංකාරමයේදී මෙත්සවිය සාමාජිකයන් උදෙසා ධර්ම දේශනාවක් පවත්වන ලදී.
- 2022 ජුනි 10 දින මහියංගන රාජමහාවිහාරයෙහි මෙත් සවිය සමඟින් ඉදිකරන පිළිමවහන්සේගේ නෙළීමේ කටයුතු අධීක්ෂණය කරනු පිණිස මෙත් සවිය විධායක කමිටුව සහ බුදු පිළිම කමිටුවම මඟින් නිරීක්ෂණ චාරිකාව සිදුකරන ලදී.
- ජුනි 12 දින මෙත්සවිය ස්වයංපෝෂණ අනුකමිටු පිහිටුවා මෙත්සවිය ස්වයංපෝෂණ වැඩසටහන ආරම්භ කරන ලදී.
- 2022 ජුනි 13 වන දින පොසොන් පොහොය නිමිති කොටගෙන කළුතර ශාඛාවේ ළදරු පාසලෙහි දරුවන් උදෙසා එක්දින සීල වැඩසටහනක් පවත්වන ලදී.
- 2022 ජුනි 19 දින මෙත් සවිය ස්වයංපෝෂණ වැඩසටහනයට විශ්නාත් අපොන්සු මහතාගේ දායකත්වයෙන් මෙත්සවිය සාමාජිකයින් ට පොල් පැල, එළවලු බීජ කාබනික පොහොර බෙදා දීමට කටයුතු කරන ලදී.
- 2022 ජුනි මස තුල දී මෙත්සවිය ස්වයංපෝෂණ වැඩසටහන යටතේ, එළවළු බීජ ඉල්ලුම් කල අයට සාමාජිකා නිලූකා ජයසිංහ හා නිලක්ෂි ගුණසේකර මහත්මීන්ගේ අනුග්‍රහයෙන් එම බීජ තැපැල් මඟින් යවන ලදී.
- 2022 ජූලි 04 දින මෙත්සවිය ස්වයංපෝෂණ වැඩසටහන යටතේ මෙත්සවිය සමාජිකා ගිම්හානි මහත්මියගේ දායකත්වයෙන් මඤ්ඤොක්කා දඬු බෙදාදෙන ලදී.
- 2022 ජූලි 17 දින මෙත්සවිය 46 වන කණ්ඩායම ආරම්භ කරන ලදී.
- 2022 ජූලි 24 දින නිලූකා ජයසිංහ මහත්මියගේ සහ එම්. කේ. ප්‍රියන්ත මහතාගේ දායකත්වයෙන් මෙත්සවිය ලාංඡනය සහිත වටිනා මුතු කුඩයක් පරිත්‍යාග කරන ලදී.
- 2022 ජූලි 28 අවස්ථා කීපයක දී රු. 800,000.00 පමණ මුදලක් ශ්‍රී ලංකාරාමයේ වැඩවසන විජිත ස්වාමීන්වහන්සේගේ කුටිය සැකසීම සඳහා පරිත්‍යාග කරන ලදී.
- 2022 අගෝස්තු 07 ප.ව. 2.00 සිට බොරැල්ල ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේදී මෙත්සවිය 19 වන සංවත්සරය සහ වාර්ෂික මහා සමුළුව පවත්වන ලදී.
- 2022 සැප්තැම්බර් 04 දින බොරැල්ල ශ්‍රී ලංකාරාමයේදී අයෝනි සංජනා මෙනවියගේ දායකත්වයෙන් ත්‍රිපිටිකාචාර්ය කැළණියේ අජිත ස්වාමින්වහන්සේ විසින් ධර්ම දේශනයක් පවත්වන ලදී.
- 2022 සැප්තැම්බර් 08 දින මෙත්සවිය ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා වෙත වෘත්තියකත්වය උදෙසා ශ්‍රී ලංකාවේ පිදෙන ඉහලම සම්මානයක්මෙ වන APEX සම්මානයෙන් පිදුම් ලැබීම උදෙසා මෙත්සවිය විධායක කමිටුව මගින් ඇගයීම් සම්මානයක් ලබාදීම සහ හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ හීල් දානමය පිංකමක් සිදු කරන ලදී.

- 2022 සැප්තැම්බර් 25 දින කොළඹ විශ්වවිද්‍යාලයේ නවකලාගාර ශාලාවේදී සාර්ථකව ඉගෙන ගන්නා අන්දම පිළිබඳ වැඩමුළුව සිදු කරන ලදී.
- 2022 දෙසැම්බර් 04 දින විශ්වනාත් අපොන්සු මහතාගේ දායකත්වයෙන් පූජ්‍යපාද ආචාර්යය කුකුල්පනේ සුදස්සි ස්වාමීන්වහන්සේ විසින් බොරැල්ල ශ්‍රී ලංකාරාමයේ දී ධර්ම දේශණාවක් පවත්වන ලදී.
- 2022 දෙසැම්බර් 04 දින මියගිය මෙත්සවිය සාමාජිකයන්ට පිං අනුමෝදම් කිරීම සහ මෙත්සවිය සාමාජිකයන්ට ආශීර්වාද පිණිස ගරුතර මහා සංඝරත්නය උදෙසා දහවල් දානමය පිංකම සිදුකරන ලදී.
- 2023 ජනවාරි 01 දින හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී වසරේ ප්‍රථම හීල් දානමය පිංකම සිදු කිරීම සහ බොරැල්ල ජයන්ති ළමා නිවාසයේ දරුවන් සඳහා දහවල් ආහාරය සහ ත්‍යාග ලබාදීම.
- 2023 ජනවාරි 16 දින මෙත්සවිය 47 වන කණ්ඩායම ආරම්භ කරන ලදී.
- 2023 පෙබරවාරි 04 දින මෙත්සවිය සදහම් අරණ කළුතර තෝරගල්ල ශාඛාවේ භික්ෂු පුහුණු මධ්‍යස්ථානයේ කුල දරුවන් 5 දෙනෙකු සසුන් ගත කර සාසනයට පූජා කිරීම.
- 2023 මාර්තු 05 දින මහාචාර්ය දයා රෝහණ අතුකෝරල මහතා විසින් බොරැල්ල ධම්මගවේසි බෞද්ධ අශ්‍රමයේදී "ලංකාවෙම ඉඳගෙන දියුණු වෙන්නෙ කොහොමද" මැයින් දේශනයක් පවත් වන ලදී.
- 2023 අප්‍රේල් 02 දින කොළඹ විශ්වවිද්‍යාලයේ නවකලාගාර ශාලාවේදී සාර්ථකව ඉගෙන ගන්නා අන්දම පිළිබඳ වැඩමුළුව සිදු කරන ලදී.
- 2023 අප්‍රේල් 11 දින කළුතර තෝරගල්ල පිහිටුවා ඇති මෙත්සවිය ළදරු පාසලේ දරුවන්ගේ විවිධ ප්‍රසංගය පැවැත්වීම සහ සසුන්ගතවූ ස්වාමීන්වහන්සේ නමකයේ පවුලක අසරණ වූ දරුවකුට ප්‍රතිකාර සඳහා රු. 50000 ක මුල්‍ය පරිත්‍යාගයක් මෙත්සවිය සදහම් අරණ අරමුදලින් පරිත්‍යාග කිරීම.
- 2023 මැයි 04 දින මෙත්සවිය ධර්මදූත වැඩසටහන් ඒකකය යටතේ ඇල්පිටිය විහාරමහාදේවි පිරිවෙනේ කුල දරුවන් 10 දෙනෙකු සසුන් ගත කර සාසනයට පූජා කිරීම.
- 2023 මැයි 05 දින මහියංගන පූජා භූමියේ ඉදිකරන ලද මෙත්සවිය 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේගේ ශීර්ෂයේ ධාතුන් වහන්සේලා තැන්පත් කිරීම සහ ශීර්ෂයේ පළිගු තැන්පත් කිරීම සිදු කරන ලදී.
- 2023 මැයි 18 දින මහියංගන පූජා භූමියේ ඉදිකරන ලද මෙත්සවිය 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේගේ රුපියල් කෝටියක් පමණ වටිනා කමකින් නිමවූ ඌර්ණ රෝම ධාතුන් වහන්සේ තැන්පත් කිරීම .
- 2023 මැයි 28 දින මෙත්සවිය ඉතිහාසයේ සුවිශේෂී දිනයක් සනිටුහන් කරමින්, මෙත්සවිය මගින් මෙතෙක් සිදුකල විශාලම ව්‍යාපෘතිය වන අඩි 104 උසින් මහියංගන පූජා භූමියේ නිම වන ලද, බාහිර ආධාරයකින් තොරව ඉදි කල ශ්‍රී ලංකාවේ උසම වටකුරු බුද්ධ ප්‍රතිමා වහන්සේ වන මෙත්සවිය 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ ජනතා පූජා උපහාර සඳහා නිරාවරණය ලදී.
- 2023 ජූනි 25 දින මෙත්සවිය ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා 2023 වර්ෂය සඳහා වූ ආසියාවේ හොඳම විද්‍යාඥයන් 100 අතරට නිර්දේශ වීම උදෙසා මෙත්සවිය විධායක කමිටුව මගින් ඇගයීම් සම්මානයක් ලබාදීම.
- 2023 ජූලි 03 දින නිහාල් මෙන්ඩිස් මහතාගේ දායකත්වයෙ න් මහියංගන පූජා භූමියේ ඉදිකරන ලද මෙත් සවිය 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ අසල දොළොස්මහේ පහනක් ඉදිකර නිමවීම.
- 2023 ජූනි 04 දින බොරැල්ල ශ්‍රී ලංකාරාමයේ දී විශ්වනාත් අපොන්සු මහතාගේ දායකත්වයෙන් පූජ්‍යපාද ශාස්ත්‍රිය පණ්ඩිත ගොම්බද්දල දමිත ස්වාමීන්වහන්සේ විසින් ධර්ම දේශනයක් පවත්වන ලදී.
- 2023 ජූලි 08 දින බොරැල්ල ශ්‍රී ලංකාරාමයේ පින්තාරු කටයුතු සඳහා මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ රු. 50000 පමණ මූල්‍ය දායකත්වයෙන් අවශ්‍ය තීන්ත සහ අනෙකුත් ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම.
- 2023 ජූලි 16 දින අච්චු පොත් ඇතුළු පිරිවනේ ඉගෙන ගන්නා ස්වමීන්වහසේලාට අවශ්‍ය ද්‍රව්‍ය තොගයක් රු. 150000 ක පමණ මෙත්සවිය සදහම් අරණ මුල්‍ය දායකත්වයෙන් පරිත්‍යාග කිරීම.



බුදුරුව නිමැයුමේ

# ආවර්ජනා



සති කීහිපයක සිට ගතවෙමින් පවතින මෙම බුද්ධාලම්බන ප්‍රීතියෙන් ගතකරන කාලය නිවන් දක්නා තෙක් පවතිවා යනුවෙන් යලි යලිත් පතනුයේ මහත් සැදැහැයෙනි.

එදා 2023.05.28 වන දින මහියංගනය විල්ලුව වැව මධ්‍යයේ සිදුවෙමින් පැවති අඩි 102 ක් උසැති බුද්ධ ප්‍රතිමා වහන්සේ ජනතාවට විවෘත කිරීමේ මහා පුණ්‍යකර්ම භූමියට ලඟා වෙමින් සිටියදී සිදුවූ මහා චිත්ත විපරියාසය තුළින් ඇතිවූ මූලික සිතිවිල්ල හේතුවෙන් මෙය ලිවීම ඇරඹිමි.

එදා ප. ව. 2.00 ට පමණ වැව් බැම්මට පා තබා වැව මැදින් ඇති පාලමට ප්‍රවිෂ්ඨ වීමත් සමග ඉදිරියේ දකුණු පසට බරව පිහිටි ප්‍රතිමා වහන්සේ දෙසට මගේ නෙත් යොමු වුහ. මහත් ආශ්චර්යයකි. බුදු රජාණන් වහන්සේ අහස් තලයේ වැඩ සිටි අයුරු සංකේතවත් ව දිස් විය.

මෙම සංකේතාත්මක ප්‍රතිමාව දැකීමෙන් එදා ජීවමාන බුදුන් වහන්සේ මෙම ස්ථානයට වඩින දර්ශනය කොතරම් ආශ්චර්යමත්ව පවතින්නට ඇත්දැයි මැවී මැවී පෙනිනි පැහැදිලි නිල් අහසේ ඇතින් පෙනෙන එකිනෙක පසුපස පාවෙමින් බටහිර සිටි නැගෙනහිරට ගලා යමින් පැවති සුදු පුළුන්වන් වලාකුළු දහරාවන් මෙම දර්ශනයට සැරසිල්ලක් එක් කරමින් පැවතින.

මෙම බුද්ධ සම්ප්‍රාප්තිය සිහිවන මොහොතක් මොහොතක් පාසා අසල සිටි වන්දනාකරුවෝ නිවන කරා නොනවත්වා ඇදී යන අයුරුත් සිහියට නැගුනි.

වසර කීපයක් මෙම නිර්මාණය යතාවත් කිරීමේ උදෙසා පරම පවිත්‍ර චේතනාවෙන් මෙත් සවිය ඇතුළු විවිධ අංශ වල සාමාජිකයෝ විවිධ දුෂ්කරතා විඳ දරාගනිමින් කැපකල කාලය ශ්‍රමය ධනයට ප්‍රතිඋපකාරයක් ලෙස කියා නිමකළ නොහැකි අමිල සත්කාරයකට එදින සියල්ල දායක කර ගැනිමත් සිදුවී ඇති බව සිහිවීමෙන් මහත් සැනසුම් සුසුමක් හෙලිමි.

එසේම දස දහස් ගණනින් ලක්ෂ ගණනින් සැදැහවතුන් මෙම කාලයේ මෙවැනි නිර්මාණයක් බිහිකිරීමක් පිළිබඳ සිතීමටවත් නොහැකි කාලයක ආශ්චර්යයක් වූ බුද්ධ සම්ප්‍රාප්ති දර්ශනය දැකීමෙන් ඇතිකර ගත් විවිධාකාර වූ සිතිවිලි පරම්පරාව ඔවුන් රෝස මල් යහනාවක් තුළින් නොපමාව නිවන් සුවය දක්වා ඔසවාගෙන යන බුද්ධානුස්සති කමටහනක් මනසේ සනිටුහන් කරගත් බව නම් ස්ථිරයි.

මෙවැනි නිවන කරා වේගයෙන් ඇදි යන සැදැහවතුන් දැකිය හැකි මෙම පින්කෙත සඳහා දරදිය අදින ලද සාමාජිකයින්ට මෙම ප්‍රතිමාවේ වැලිකැටයක් වැලිකැටයක් පාසා වෙන් වෙන්ව මැවෙන මහා පුණ්‍ය සම්භාරයකට අපව ඇදගෙන පැමිණි මෙත් සවිය සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතාට අපගේ ගෞරවය ප්‍රණාමය පුද කරමි. එතුමන් පතන බෝධියකින් නිවන් දැකීමට මෙයම හේතුවේවා යැයි ප්‍රාර්ථනා කරමු.

මෙම දහස් ගණනකගේ උත්සාහය කැපකිරීම පරිත්‍යාගයන් තුළින් බිහිවූ මෙම දුර්ලභ මහා සාගරය බඳු සීමාවක් නොපෙනෙන පුණ්‍ය බලවේගය අපගේ ජීවිත කාලය තුළ අවස්ථාව ලැබෙන වාරයක් වාරයක් පාසා වන්දනා කරමින් අඩුපාඩු ගැන සිතමින් ආධාර වෙමින් තව තවත් පින් රැස් කරගැනීමට ඇති අවස්ථාව මහියංගනය පළාත්වාසීන්ට පමණක් සීමා නොකළ යුතුය. **මේ සඳහා ආධාර කළ හා පින් කැමති සැදැහැවතුන් හය හත් සීයයක් ඒකරාශි වී මසකට අඩු වශයෙන් 50 දෙනෙකු පමණ එක් අයෙකු වසරකට දිනක් ලෙස) මෙත් සවිය නියෝජනය කරමින් මෙම ප්‍රතිමාව අභියසයට ලඟාවීම අත්නොහළ යුතු යැයි මාගේ පැතුමයි.**

තවත් අතපසු වූ වැදගත් කරුණක් සඳහන් කිරිමට කැමැත්තෙමි. ප්‍රතිමා සංවර්ධනය අසීරු වකවානුවේ මා ඉතා සමීපව ඇසුරු කළ ගල්කිස්ස ධර්මපාලාරාමාධිපතිව වැඩවිසූ අභාවප්‍රාප්ත වූ අග්‍රමහා පණ්ඩිත කොටුගොඩ ධම්මාවාස හිමියන් වරක් මෙසේ පැවසුහ. **මෙවැනි නිර්මාණයක් ගෞතම බුද්ධ ශාසනය පවතිනතාක් මෙරටේ බිහිනොවුනු ඒකාන්තයි. මෙය ඉතා සාර්ථකව නිම වන බව මා හට පැවසූහ එය මහාචාර්ය ජයරත්න මහතාට පවසන ලෙස තවදුරටත් පැවසූහ.** ධම්මාවාස හිමියන් වසර 40 කට ආසන්න කාලයක් මා නොකඩවා හමුවෙමින් වන්දනා කර ඇති අතර එතුමන් දිනකට පැය 5 ක පමණ කාලයක් භාවනා කරන බව දැනගැනීමට ලැබිණි. එසේම කිසියම් ධ්‍යායන ඵලයක් හෝ උසස් මානසික තත්ත්වයකට එළඹී ඇති බව එදිනෙදා විදහා දැක්වූ විවිධ අසාමාන ක්‍රියාකාරකම් තුළින් අවබෝධ කර ගතිමි.

**පියදාස සිල්වා** Msc.
**විශ්‍රාමික පොලිස් අධිකාරි**
**මෙත්සවිය සා. අං. 15-2738**



## තෙවරක් සාධුකාර දීමේ අර්ථය

සාධු! සාධු! සාධු!

කායෙන සංවරො සාධු
කාය සුචරිතයේ පිහිටමි - සාධු!
සාධු වාචාය සංවරො
වචී සුචරිතයේ පිහිටමි - සාධු!
මනසා සංවරො සාධු
මනෝ සුචරිතයේ පිහිටමි - සාධු!

**කාය සුචරිතය**

ප්‍රාණඝාතයෙන් (පරපණ නැසීම) වැළකීම,' අදත්තාදානයෙන් (අන්සතු දේ සොරකම් කිරීම) වැළකීම, කාම මිථ්‍යාචාරයෙන් (කාම විසමාචාරය) වැළකීම.

**වචී සුචරිතය**

'මුසාවාදයෙන් (අනුන් රවටන වංචාසහගත අසත්‍ය වචන) වැළකීම,පිසුණාවාචයෙන් (කේළාම් හෙවත් අනුන් භේද කරන වචන) වැළකීම,'පරුෂාවාචයෙන් (අනුන් සැඩ බවට පත් කරන වචන) වැළකීම, 'සම්පප්‍රලාපයෙන් (යහපත පිණිස නොපවතින හිස් නිසරු වචන) වැළකීම.

**මනෝ සුචරිතය**

අභිධ්‍යාවෙන් (දැඩිලෝභය) වෙන්වීම, ව්‍යාපාදයෙන් (අනුන් නැසීමේ වෛරී චේතනාව) වෙන්වීම, මිථ්‍යා දෘෂ්ටියෙන් (කර්මය - කර්ම ඵල පිළි නොගැනීම) වෙන්වීම.

කායෙන සංවරො සාධු
සාධු වාචාය සංවරො
මනසා සංවරො සාධු
සාධු සබ්බත්ථ සංවරො
'සබ්බත්ථ සංවුතො භික්ඛු
සබ්බ දුක්ඛා පමුච්චතු

කාය (කායද්වාරය) සංවරය යහපති. වචී (වාග්ද්වාරය) සංවරය යහපති, මානසික (මනොද්වාරය) සංවරය යහපති. සියල්ලෙහි සංවරය යහපති, එසේ 'සදොරෙහිම සංවර වූ සංවෘත වූ භික්ෂු තෙම, සියලු සංසාර දුකින් අතමිදේ.

## මහවැලි නදියේ - අයබඩ සැදි ඒ
## මහියංගන ථූපේ - වඳිනට අපි එනවා

එදා රස විඳි පැරණි ගීයක
ඇත එසේ සටහන් වෙලා
මෙදා මහියංගනය විස්මිත
දසුනකින් සුපහන් වෙලා

අහස් තලයෙන් බිමට වඩිනා
විලස බුදුරුව ඉදි වෙලා
දකින නෙත සිත බුදු අසිරියෙන්
පිරෙයි මෙත් මුදිතා ගලා

භාස්කමකින් මහ ඇදුරු
චන්දන තුමන් මෙය නිම කළාදෝ
මෙත්සවිය අප සැම දෙනාගේ
එකතුවෙන් මෙය ඉදි උනාදෝ

දෙනෙතෙ කඳුලක් නැගෙයි අප හැම
විඳි වෙහෙස කොයි ගියාදෝ
අහස් තලයෙන් බිමට වඩිනා
සමිදු දැක්මට පින් කලාදෝ

සමිඳු සිරිපා ගැටුන පින් බිම
ජාති ජාතිත් වාසනාවන්
කේශ ධාතුන් වහන්සේ රැකි
සෑය මියුගුණ වාසනාවන්

ඔබේ මග පෙන්වීම මහැදුරු
තුමනි අප හට වාසනාවන්
අපට නොව මුළු රටට චන්දන
ජයරත්න මැති වාසනාවන්

රංජනී උඩුගොඩ, සභාපතිනිය - කාන්තා කමිටුව - මෙත්සවිය

## *Love Conquers (poem)*

*The society should alter true*
*people should all through*
*Belive in the heart true*
*We must respect love too*
*It is a feeling beyond lust*
*Show love to the world right*
*Compassion is embedded in love light*
*The world leaders should sight*
*To promote kindness meditation, alright*
*No wars, only love as glue*

*By*
*Shasha Gjaweera (45-6842)*

# කලාවන් සිව් සැට (64)

**මුළු මහත් විශ්වයම රඳා ඇත්තේ මේ පඤ්චකය තුළ බැව් ප්‍රාකාශිතය. මෙම ප්‍රධාන කොටස් පහ පුළුල් වශයෙන් සිව් සැට කලාව වශයෙන් බෙදා ඇත. ඒවා මෙසේය.**

| අක්ෂරය | ලිඛිත | ගණිත | ගාන්ධර්ව |
|---|---|---|---|
| තර්ක | ව්‍යාකරණ | ඡන්දස් | නිඝණ්ඩු |
| අලඞ්කාර | ශාලිහොත්‍ර | මන්ත්‍ර | තන්ත්‍ර |
| යන්ත්‍ර | ආත්මොදය | ජ්‍යාතිර්ඥානය | ඉතිහාසය |
| පුරාණ | අග්නිස්තම්බය | ජලස්තම්බය | කෞමාරය |
| කූප ශාස්ත්‍රය | සූප ශාස්ත්‍රය | කාම ශාස්ත්‍රය | ශස්ත්‍ර ව්‍යාසය |
| ශස්ත්‍ර කර්මය | අශ්වාරෝහණය | ගජරෝහණය | අංකුශ මාරණය |
| මාරණය | මොහනය | ස්තම්භනය | උච්චාටනය |
| ත්‍රොටනය | දූරගමනය | දූරදර්ශනය | හෙරිත්‍රෙටනය |
| පත්‍රච්ඡේදනය | චිත්‍ර කර්මය | මලාබන්ධනය | ගන්ධ යුක්ති |
| දූතය | හරකය | ස්ත්‍රී ලක්ෂණය | පුරුෂ ලක්ෂණය |
| නපුංසත ලක්ෂණය | පරහිත ඥානය | කනක පරීක්ෂා | රෛනක පරීක්ෂා |
| චතුර්වේදය | ධාතු වාදය | බිල වාදය | කනකාබාදය |
| ආකර්ෂණය | ආකාශ ගමනය | සිස කර්මය | කෘෂ්ඨ කර්මය |
| ගෙම කර්මය | රත්න පරීක්ෂා | කක්ධරණය | ශ්‍රායනය |
| ආදෘශ්‍යකරණය | පරකාය ප්‍රවේශය | වේණු වීණායාද්‍ය | විෂහරණය |

## දියවැඩියාව වළකන පලා වර්ග

කුරිඤ්ඤං කොළ, තෙබු කොළ, මඩු දළු, කොහිල දළු, පෙනෙල කොළ, කිරිඅඟුණ කොළ, තෝර කොළ, එරබදු කොළ, වැල් දොඩම් කොළ, වට්ටක්කා දළු, වාතහංග කොළ, ජපන් බටු දළු, කතුරුමුරුංගා කොළ, මැල්ල කොළ, වල්කොත්තමල්ලි කොළ, තැල් කොළ, කර කොළ, නිවිති, තුඹ දළු, කළු කම්බිරියා, රණවරා ගොටුකොළ, කංකුං මුගුණුවැන්න, එරබදු දළු


තෙබු කොළ


කිරිඅඟුණ කොළ


තුඹ දළු


වාතහංග කොළ

# මල් වලට පැන් ඉසින්නේ ඇයි

අපි හැමෝම මල් පූජා කිරීමට පෙර මල් වලට පැන් ඉහිනවා නේද?

ඒ ඇයි, අප සම්මා සම්බුදු රජාණන් වහන්සේ කලක් රජගහ නුවරට සමීපව පිහිටි අඹසැඩ නම් බමුණුගම අසල වූ වේදීය පර්වතයේ ඉන්ද්‍රසාල නම් ගුහාවේ වාසය කළේ ය. එකල දෙව්ලොව අධිපති සක්දෙව්ඳු වසර තුන්කෝටි හැටලක්ෂයක් ආයු වළඳා සිටියේ ය. එහෙත් මේ වන විට සක්දෙව්ඳුගේ පිං ගෙවී චුත වීමට ආසන්න බව හඟවන නිමිති පහළ විය. සක්දෙව්ඳුට දෙව්ලොව සැප අත් හැරීමට දුකක් හට ගත්තේ ය

සක්දෙව්ඳු පන්චසික පෙරටු කරගෙන මුළු දිව්‍ය සභාවම සමඟ බුදුන් වහන්සේ බැහැ දැකීමට ආවේ ය. වේදීය පර්වතය ආලෝකමත් කරමින් ආ මේ පිරිස පන්චසික ගේ මැදිහත් වීමෙන් බුදු සිරිපා වැන්දේ ය.

සක්දෙව්ඳු පැමිණ මුණි සිරිපා නමදින විටම සක්දෙව්ඳුගේ ආයුෂ ඉවර විය. මෙය සෙසු දෙවියන් නොදුටුවේ ය. බුදු රජාණන් වහන්සේ ආයු බෝ වේවා යැයි පතා, සක්දෙව්ඳු නැවත ජීවත් වීමට, ආයු ලැබීමට තරම් පිං කර තිබේදැයි බැලීය.

සක්දෙව්ඳු පෙර ආත්මයක මනුලොව සිටියදී ගොපළු දරුවෙකුව සිටියේ ය. මේ ගොපළු දරුවා වනයේ ඇවිදිමින් සිටින විට පොකුණක් අසල ගරාවැටී ගිය ස්තූපයක මල් අසුනක් මත කවරෙකු විසින් හෝ පූජා කර පරවෙමින් තිබූ දියබෙරලිය මල් ටිකක් දුටුවේ ය. මේ ගොපළු දරුවා වහා ලඟ තිබූ පොකුණට බැස නෙළුම් කොළයක් කඩාගෙන එයට වතුර ගෙනවිත් ඉස, මල් ප්‍රාණවත් කළේ ය.

මේ පින බුදුහිමියන් දැක සක්දෙව්ඳු හා පිරිසගේ ආයු බෝ වේවා යි ප්‍රාර්ථනා කළේ ය. එතැන් සිට නැවත සක්දෙව්ඳුට ආයුෂ වසර තුන්කෝටි හැටලක්ෂයක් ලැබිණි.

හදිසි මරණයකට ගොදුරු නොවේවා! යි පතා ඔබත් මල් වලට පැන් ඉහින්න.



# සිතේ ආයුෂය

අහසේ හටගන්නා විදුලිය සැණෙකින් කිසිවක් ඉතිරි නො වී නැති වන්නාක් මෙන් ද , බෙරයකින් නිකුත් වන හඬ සැණෙකින් කිසිවක් ඉතිරි නොවී නැති වන්නාක් මෙන් ද , කර අවසන් වනු සමඟම සිදු වී අවසන් වනු සමගම එයින් කිසිවක් ඉතුරු නොවී ක්‍රියා අභාවප්‍රාප්ත වන බව ඉහත කියන ලදී . සිත ද ක්‍රියාවක් බැවින් ක්‍රියාවන්ට අයත් වූ ඒ ස්වභාවය නොඉක්මවා ඉපිද පරමාර්ථ මොහොතකුදු නො පැවතී වහා අභාවප්‍රාප්ත වේ . ධර්මයන්ගේ ඒ අභාවප්‍රාප්තියට නිරෝධය යි ද භංග ය යි ද කියනු ලැබේ . එක් සිතකට උපදනා කාලයය , පවත්නා කාලයය , බිඳෙන කාලයය යි කාල තුනක් ඇත්තේය . ඒ තුන් කාලය ප්‍රමාණයෙන් සමය . එකකවත් දිගින් අඩු වැඩි කමක් නැත . උපදින්නට යම් පමණ කාලයක් වේ නම් එපමණ ම කාලයක් පැවතී එපමණ ම කාලයකින් බිඳී යාම චිත්ත චෛතසික පරමාර්ථයන්ගේ ස්වභාවය රූප පරමාර්ථයන්ගේ ජීවන කාලය සිත මෙන් සතළොස් ගුණයකි . සිතේ ඉපදීමට උත්පාදය යි ද , පැවැත්වීමට ස්ථිතිය යි ද , අභාවප්‍රාප්තියට භංගය යි ද කියනු ලැබේ . උත්පාද ස්ථිති භංග තුන් කාලයට චිත්තක්ෂණය යි කියනු ලැබේ . චිත්තක්ෂණය ඉතා ලුහුඬු කාලයකි . එක් සන්තානයක එක් සිත් පරම්පරාවක එකවර සිත් දෙකක් නූපදනේය . දෙවන සිතක් උපදින්නේ උපන් සිත සම්පූර්ණයෙන් අභාවප්‍රාප්ත වූ පසුය . සාමාන්‍ය ලෝකයා විසින් ඉතා කෙටි සැටියට සලකන්නේ අසුරක් ගැසීමට ගත වන කාලය හා ඇසිපිය හෙළීමට ගත වන කාලය යි . **"සො පන ඛණො අච්ඡරාසංඝාත ඛණස්ස අක්ඛිනිමීලන ඛණස්ස ච අනෙක කොටි සතසහස්ස භාගො දට්ඨබ්බා "**යනුවෙන් සිතක ජීවන කාලය , අසුරු ගසන කාලයෙන් ඇසිපිය හෙළන කාලයෙන් කෝටි ලක්ෂ ගණනකින් කොටසක් තරමට කුඩා බව ය . යන දක්වා තිබේ .



උපන් සිත කෙතරම් ඉක්මනින් කොතෙක් වේගයෙන් නිරුද්ධ වෙතත් තැන සිස් නොවන ලෙස නිරුද්ධ වන සිත හා බැඳී උපදින සේ අලුත් අලුත් සිත් ; එළඹ සිටින අනේකප්‍රකාර නිරෝධ සමාපත්ති අවස්ථාව ආරම්මණයන් ගනිමින් උපදෙන් ය . හා අසංඥ භූමියේ ඉපද සිටින අවස්ථාවන් හැර චිත්ත පරම්පරාවේ විශේෂාරම්මණයක් නොලද සිත් නූපදනා අවස්ථාවක් නැත . කල්හි ප්‍රතිසන්ධියට අරමුණු වූ කර්මාදීන් ගෙන් එකක් අරමුණු කරමින් වැල නොකැඩී සිත් උපදනේය . භවාංග සිතයයි කියන කර්මාදිය ගෙන උපදනා ප්‍රකෘති සිත් ඇති බව අපට නොදැනේ . එය ගැන විස්තරයක් කිරීමට මෙය අවස්ථාව නොවේ . සිතේ ජීවන කාලය ඉතා ලුහුඬු බැවින් හා අතරක් ඇති නොවන සැටියට නිරුද්ධ වන සිත සමඟ බැඳී උපදනාක් මෙන් අලුත් අලුත් සිත් ඉපදිය යුතු බැවින් ද සිත් උපදනා තැන සිදු වන්නේ ඉතා වේගවත් වැඩ පිළිවෙලකි එබඳු වේගවත් වැඩ පිළිවෙළක් කෙරෙන අන් කිසි යන්ත්‍රයක් නැත . චිත්තායුෂය ඉතා ලුහුඬු බැවින් එක් සන්තානයක එකකට එකක් පෙර පසු වී අසුරු සැණක් තුළදී ඉපද නිරුද්ධ වන සිත් කෝටි ලක්ෂ ගණනක් වන බව දක්වා තිබේ . මහ රහතන් වහන්සේ මිළිඳු රජුට අසුරු සැණක් තුළදී ඉපද නිරුද්ධ වන සිත්වල ප්‍රමාණය උපමාවකින් දක්වන්නාහු " වාහසතං ඛො මහාරාජ , විහීනං අඩ්ඪචූළඤ්ච වාහා විහිසත්තම්මණානි ද්වේ ච තුම්බා එකච්ඡරක්ඛණෙ පවත්තචිත්තස්ස එත්තකා වීහි ලක්ඛං ඨපීයමානෙ පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍යුං ' ' යනු වදාළ සේක . එක්සිය පණස් යාළ සතමුණු දෙලාසෙක වී ඇට එක් අසුරු සැණෙක උපදනා සිත්වලට එක එක ඇටය බැගින් තැබුව හොත් වී සියල්ලම අවසන් වේය යනු එහි අදහසයි . නාගසේන කරත්තයකි . යාළ නම් වී මෙය එක් අසුරු සැණක උපදනා සිත්වල නියම් ප්‍රමාණය දැක්වීමක් නොව බහුභාවය දැක්වීමකි. නිශ්චිත වශයෙන් ම එහි ගණනක් නොදැක්විය හැකිය . එක් අසුරු සැණෙකදී එක් පුද්ගලයකුට මෙපමණ මහත් රාශියක් සිත් උපදිය යන්න මෙය කියවන්නවුන්ට නො පිළිගැණෙන කරුණකි . එය පිළිගත වන්නේ චිත්ත තත්ත්වය ගැන වැඩිදුර උගෙනීමක් ලැබූ පසුවයි . හැකි ඒ තැනට පැමිණීමට උත්සාහ කෙරෙත්වා.

> **" සිත් උපදනා තැන සිදු වන්නේ ඉතා වේගවත් වැඩ පිළිවෙලකි එබඳු වේගවත් වැඩ පිළිවෙළක් කෙරෙන අන් කිසි යන්ත්‍රයක් නැත .**

අතිපූජ්‍ය රේරුකානෙ චන්ද්විමල ස්වාමීන් වහන්සේගෙ
අභිධර්මයේ මූලික කරුණු ග්‍රන්ථය ඇසුරෙනි.

## පින් කිරීමට අනවකාශ කල් අට

01. නරකයට වැටි සිටින කාලය ය,
02. තිරිසන් ව සිටින කාලය ය,
08. ප්‍රේත ව සිටින කාලය ය,
04. සිත නැති කය පමණක් ඇති අසංඥ භවයට පැමණ සිටින කාලය ය,
05. බුදුවරයන්, බුද්ධ ශ්‍රාවකයන් නො පැමිණෙන ප්‍රත්‍යන්ත ප්‍රදේශවල ඉපිද සිටින කාලය ය,
06. මිථ්‍යාදෘෂ්ටිය ගෙන සිටන කාලය ය,
07. හොඳ නරක තේරුම් ගත නොහැකි මෝඩයෙකු වී සිටින කාලය ය,
08. අබුද්ධෝත්පාද කාලය ය යන, කාල අට ය.

රේරුකානේ චන්දවිමල මහනාහිමියන් වහන්සේ (බෞද්ධයාගේ අත්පොත)

## SIGNS OF MATURITY:

1. Small talks no longer **excite** you.
2. **Sleep** is better than a Friday night out.
3. You **forgive** more.
4. You become more **open-minded**.
5. You respect **differences**.
6. You don't force **love**.
7. You accept **heartaches**.
8. You don't **judge easily**.
9. You sometimes prefer to be **silent**

මෙහි දහවන කොටස පසුගිය කලාපයේ පළ විය...

# කෙලෙස් 1500

## 11 වන කොටස...



**අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමියන්ගේ ලිපියක් ඇසුරිනි.**

**(37.) චාපල්‍යං**

කියන දෙය වරින් වර වෙනස් කරන වරින් වර එක එක අතට හැරෙන වාසි පැත්ත සොයන ස්ථිරගති නැති අයට ලෝකයෙහි චපලයෝය යි කියති. මෙහි චාපල්‍යං යන වචනයෙන් දක්වන්නේ ඒ අර්ථය නො වන බව දත යුතුය. මේ ක්ලේශ දක්වන තැන අදහස් කරන්නේ ශරීරය හා පරිභෝග කරන වස්තූන් ද වාසස්ථාන ද සරසා ගැනීමේ ආශාවය. මෙය ගිහි පැවිදි කාහටත් ඇතිවන ක්ලේශයකි. ගිහි කාමභෝගීහු නොයෙක් ඇඳුම් පැලඳුම් වලින් ශරීරය සරසති. වාසස්ථාන සරසති. පාරිභෝගික භාණ්ඩ සරසති. එයින් ඔවුනට කෙලෙස් වැඩේ. කෙලෙස් බැහැර කිරීමට මහණදම් පුරන පැවිද්දන් චාම් ලෙස ජීවත් විය යුතුය. ශරීරය හා චීවරාදිය පිරිසිදුව තබා ගැනීම පමණක් කළ යුතුය.

**(38.) අසභාගවුත්ති**

අනුකූල විය යුතු සැලකිය යුතු ගරු කළ යුතු මාපිය ගුරුවරාදීන්ට අනුකූල නොවන ස්වභාවය අසභාගවුත්ති නම් වේ. මෙය ඒ ආකාරයෙන් ඇති වන මානය හා ද්වේෂය ය. අසභාගවුත්තිතාවෙන් යුක්ත වන පුද්ගලයාට මාපියන්ට නො සලකා සිටීම විරුද්ධව සිටීම මිහිරකි. මෙය ඉතා පහත් අසත්පුරුෂ ලක්ෂණයෙකි. එයින් යුක්ත වූ පාපී පුද්ගල තෙමේ මව හෝ පියා හෝ සහෝදරයෙකු හෝ සහෝදරියක හෝ අන් සැලකිය යුත්තකු හෝ ගිලන් වුව ද පැත්තවත් නොබලයි. පියා අයත් දෙය සම්බන්ධයෙන් මව හා කෝලාහල කරයි. මව අයත් දෙය සම්බන්ධයෙන් පියා හා කෝලාහල කරයි. මාපියන් අයත් දේ සම්බන්ධයෙන් සහෝදර සහෝදරියන් හා කෝලාහල කරයි. මාපියන්ට නො වඳී. ඔවුන් දුටු විට හුනස්නෙන් නො නැගිටී. මාපියන් බිම සිටියදී අසුනෙහි හිඳී. මාපියන් නිවාසනයේ සිටියදී තමා උසස්නෙහි හිඳී. මාපියන්ගේ වැඩ වලට සහාය නොවේ. මාපියන් පහත් කොට සලකයි. අසභාගවුත්තිතාව ඇති පැවිද්දා ද ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් ගිලන් වුව ද හැරී බැලීමකුදු නො කර යයි. විහාරයේ වෙසෙන අනිකකු ගිලන් වුව ද එසේ ම කරයි. ආචාර්‍ය්‍යෝපාධ්‍යායයන්ට හා වැඩිමහලු භික්ෂූන්ට නො වඳී. විහාරයට චෛත්‍යයට බෝධියට ගරු නො කරයි. සෑ මලු බෝ මලුවලට පාවහන් පයලා ගමන් කරයි. කුඩ ඉසලා ගමන් කරයි. සංඝයාට ගරු නො කරයි.

මා පියන් බොහෝ දුක් විඳ බොහෝ වෙහෙසී දියුණු කළ ඇතැම් දරුවෝ තමන් උසස් තත්ත්වයකට පැමිණි පසු මම දැන් මවුපියන්ට වඩා උසස් තත්ත්වයක සිටිමි ය, ඔවුන්ගෙන් මට වැඩක් නැත කියා මාපියන් පහත් කොට සලකමින් හැසිරෙති. ඇතැම් පැවිද්දෝ ද ගුරුවරුන් ගේ ආධාරයෙන් උසස් තත්ත්වයට පැමිණි කල්හි දැන් මම ගුරුවරයාට වඩා උසස් තත්ත්වයක සිටිමියි ගුරුවරුන් නොසලකා හරිති. මහලුව දුබලව සිටින ගුරුවරුන්ට අවමන් කරති. ගුරුවරයා තමා යටතට ගන්නට තැත් කරති. මාපියන් ගුරුවරුන් තමන් යටතට ගන්නට තැත් කිරීම ඔවුනට ගරු නො කිරීම මෙලොව ද පිරිහීමට හේතු වන බලවත් පාපයෙකි.

දරුවෝ මාපියනට ප්‍රියයෝ ය. දරුවා ගැන මාපියන් ගේ සිත්හි ඇතිවන ඒ ප්‍රියත්වය කුශල ධර්මයක් නො වේ. එය රාග නමැති ක්ලේශය ය. දරු සුරතලය මාපියන්ට මිහිරකි. කැවීම් පෙවීම් නැවීම් හැඳවීම් පැළඳවීම් ආදියෙන් දරුවන්ට සත්කාර කිරීමත් මාපියන්ට මිහිරකි. ඒ සියල්ල ම කෙරෙන්නේ රාග නමැති ක්ලේශයෙන් ම ය. එහෙත් දරුවන් විසින් මා පියන්ට ගරු කළ යුතුය. බුදුසස්නෙහි මහතෙරවරුන් ගෝලයන් ඇති දැඩි කරන්නේ ගෝලයන් දියුණු කරන්නේ රාගාදි යම්කිසි ක්ලේශයකින් නොව මෛත්‍රී කරුණාදි කුශල ධර්මවලිනි. එබැවින් මාපියන්ට ද වඩා ගුරුවරුන්ට ගරු කළ යුතුය. එබැවින් බුදුසස්නෙහි දෙවැනි තැන ලබා සිටි ශ්‍රාවකයන්ගෙන් මුල් තැන ලබා සිටි උසස් ම බුද්ධ ශ්‍රාවකයන් වහන්සේ වන සැරියුත් මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේට බුදුසස්නට ඇතුළු වීමට මුලින් ම මග පෙන්වූ ගුරුවරයා වන අස්සජි තෙරුන් වහන්සේට දිනපතා වැඳීම කළහ. අස්සජි තෙරුන් වහන්සේ නැති තන්හිදී උන්වහන්සේ වැඩ සිටින දිශාවට හැරී වැඳ ඒ දිශාවට ම හිස ලා ශයනය කළහ. මෙය භික්ෂූන් විසින් ආදර්ශයට ගත යුතු කරුණෙකි.

මාපියන්ට ගුරුවරුන්ට අනුකූල පැවැත්මක් නැතිව ඔවුන්ගේ සිත් රිදවන අයට එයින් වන අනිෂ්ඨ විපාක මෙලොවදීමත් නොයෙක් විට විඳින්නට සිදු වේ. එසේ කරන අසත්පුරුෂයන්ව සත්පුරුෂයෝ පිළිකුල් කෙරෙති. ඔවුහු ජනයාට අප්‍රියයෝ වෙති. අනුන්ගෙන් උපකාර වුවමනා අවස්ථා කාහටත් එළඹේ. අනුන්ට අනුකූල පැවතුම් නැති උඩඟු පුද්ගලයා එබඳු අවස්ථාවක් පැමිණි විට තනි වේ. එබඳු පුද්ගලයන්ට උපකාරයට කිසිවෙක් ඉදිරිපත් නො වෙති.

**(39.) අරති**

ආරණ්‍ය සේනාසනයන්හි හා විවේකස්ථානයන්හි විසීම ගැනත්, ශමථවිදර්ශනා භාවනාවන්හි යෙදීම ගැනත් ශීලය සම්පූර්ණ කිරීම ගැනත් පැවිද්දන්ට ඇති වන අප්‍රියතාව හා ශීලසමාදාන භාවනා ආදිය පිළිබඳ ව ගිහියන්ට ඇතිවන නො සතුටත් අරති නම් වේ. එය ඒ ආකාරයෙන් ඇති වන සූක්ෂම ද්වේෂය ය.

**(40.) තන්ද්‍රි**

වත් පිළිවෙත් කිරීම් භාවනා කිරීම් ආදි කුශල ක්‍රියාවන්ට අලස බව තන්ද්‍රි නම් වේ. මෙයින් කියනුයේ රෝගාදිය නිසා ඇතිවන කයේ අලස බව නොව ක්ලේශයන් නිසා සිතෙහි හටගන්නා අලස බව ය.

**කොටස් වශයෙන් ඊළඟ සඟරාවෙන්**

# අහක යන නයි!



එදා මුගලන් මහරහතන්වහන්සේගේ ඇට කටු කුඩු වෙන්න ගහපු හොරු ටික කොසොල් රජතුමා විසින් අල්ලලා බෙල්ල ලගට වෙනකන් වලලා ඇත්තු ලව්වා නගුලා දාල හාන්න කිව්වා බෙලි ගලවලා යන්න. එතකොට බුදු හාමුදුරුවෝ මොකද කිව්වේ? "රජතුමනි ඔය හොරු රැල ඔය වගේ ක්‍රියාවක් කලේ ඒගොල්ලොන්ගේම වැරැද්දෙන් නෙමෙයි, මීට කල්ප ගානකට පෙර මුගලන් මහරහතන් වහන්සේ එක්තරා අත්බැවක තම බිරිඳගේ කීමට තම අන්ධ දෙමව්පියන් කැලේක අතරමන් කරල මෙන්න හොරු ටිකක් අපිට ඇවිත් ගහනවා කියමින්" පොලු අරන් ගහල දාලා ආවා.

එදා ඔතනින් ගිය පිරිසක් ඔය වයසක අන්ධ දෙමව්පියන් දැකලා කම්පා වෙලා "මේ අපරාදය කරපු එකා මට අහු වුනා නම් ඕකගේ ඇට කුඩු වෙන්න ගහනව" යනුවෙන් ද්වේෂයක් ඉපදෙව්වා.
සසර ගමනක හැටි කියන්නේ, එදා ද්වේශයෙන් ගොඩ නගපු ගණුදෙනුව පියව ගන්න කල්ප ගානකට පසු මේ පිරිස මුණ ගැසුනා. මුණ ගැසෙනකොට මේ පුද්ගලයා රහතන් වහන්සේ නමක්, අර පිරිස ආනන්තරීය පාප කර්මයක් කරගත්තා. පුදුම සසරක් මේක....

අපි අද සුදනො වෙලා හැමෝටම චෝදනා කරන්නේ, වැරදි කියන්නේ අපි මේ අවුරුදු 30ක් 40ක් දන්න ටිකෙන් නේ. මේ හැමදේකම පිටි පස්සේ ලොකු සාංසාරික ගණුදෙනුවක් තියෙනවා හැබැයි එක අපි දකින්නේ නෑ. ඒක නොදැක අහක යන සසර ගණුදෙනු වලට පැත්තක ඉඳන් ද්වේෂය උපදවගෙන නව ගණුදෙනවක් හදාගන්නවා.
මෙහෙමත් අසාර ලෝකයක්....

---



එක්තරා රටක රජතුමෙක් පුරුද්දක් ලෙස හැම වසරකම රට වැසින්ට දානයක් දෙනවා. දවසක දානෙ දෙන දවස උදාවුනා. සේවකයො දානෙ පිළියෙල කරන වැඩ පටන් ගත්තා. දානය පිළියෙල කරන තැනට කිට්ටුව පොඩි කැළයක් තිබුනා. ඒ කැළේ නයෙක් මරණාසන්නව කැලෙන් එළියට එද්දිම මැරුනා. මේ නයාව රාජාළියෙක් දැකල ඇවිත් ඩැහැගෙන පියාඹගෙන යද්දි නයාගෙ කටින් විෂ බින්දු කීපයක් දානෙට ලෑස්ති කරන භාජනේකට වැටුනා. දානෙ ලෑස්තිකරල ඉවරවුනු ගමන් මුලින්ම රජතුමා ඇවිත් රජතුමාගෙ අතින් පළවෙනියට දානෙ බෙදල දුන්න. ඒ දානෙ වළඳපු කෙනා නයාගෙ විෂ කළවම් වෙලා තිබ්බ කෑම කාපු ගමන් එතනම මැරිල වැටුනා.

රජතුමා කම්පාවෙලා බොහොම දුක්වුනා. එතනින්ම ඒ දානෙ නතර කරා. මේ මරණෙ යම ලෝකෙට වහාම වාර්ථා වුනාම, දැං මේ මරණෙට හේතුවුනු කෙනාගෙ නමට පව ලියන්න යමලෝකෙ ලියන මහත්තයට භාරවුනාට පව ලියන්නෙ කාටද කියන ගැටළුව මතුවුනා. නයා මැරිල උන්නු නිසා මේ පව නයාගෙ පොතට ලියන්න බෑ, විෂ භාජනේට වැටුනු බව රාජාලියාත් දන්නෙ නැති නිසා රාජාළියාට ලියන්නත් බෑ. රජතුමා මේ දානෙ දෙන්න මූලික උනත් , රජතුමා ත් දන්නැති නිසා එයාගෙ නමට දාන්නත් බෑ. ලියන මහත්තයා දැං මහ අවුලෙන් නිසා පව් පිං පොතත් අරං යම රජ්ජුරුවො හම්බවෙලා අකරතැබ්බය කිව්වා. යමයත් පොඩ්ඩක් අවුල්වෙලා වගේ උන්නා. ටිකක් කල්පනා කරපු යමයා ලියන්න ට කිව්ව...

"උඹ ඕක ඔය පොතේ පැත්තකින් ලියාගෙන ඕකට සවයංක්‍රීය එලාම් එක හදල තියපං. අපිට ඔය පව ලියන්න නමක් හම්බෙයි".

ඔය විදිහට අවුරුද්දකුත් ගෙවුනා, අර රජතුමා ආපහු දානෙ දෙන්න ලෑස්ති කරා. අසල්වැසි රටකින් ආපු කට්ටියකට රජතුමාගෙ දානමය පිංකම ආරංචි වෙලා, දානෙ දෙන තැන හොයාගෙන යද්දි, අතරමග වෙළඳාමේ යෙදිල උන්නු වට්ටි අම්ම කෙනෙක් දැකල දානෙ දෙන තැනට යන පාර ඇහුවා...

"අපෝ... ඔයාල වහදාල දානෙ දෙන රජාගෙ දානෙ කන්නද යන්නෙ" කියල අර කට්ටියව බයකරල යැව්වා.

වට්ටි අම්ම එහෙම කියන ගමන් යමලෝකෙ පව් පිං පොතේ එලාම් එක වදින්න ගත්තා. ඒක ඇහුනු ලියන්නා පව් පිං පොතත් උස්සං යම රජ්ජුරුවො ළඟට දිව්වා.

" ඕං ඔය වට්ටි අම්මගෙ නමට අර පව දාපං. මෙලෝ දෙයක් දන්නැතුව කෙනෙකුට දොස්කිව්වයි කියල ලියාගනිං" කියල යම රජ්ජුරුවො අණ කලා.



# පස්වණක් ප්‍රීතිය

බුදු ගුණ නැවත නැවත සිහි කිරීමෙන් පස්වණක් ප්‍රීති ඇති වේ.
1. **ඛුද්දකපීති** - කුඩා ප්‍රීතිය. සුළු වශයෙන් ඇතිවන ප්‍රීතිය. ශරීරයේ ලොම් නැගිටවීම් පමණක් සිදු කරන දුර්වල ප්‍රීතිය ඛුද්දක ප්‍රීතිය යි. එය ඉපද වහා බිඳෙයි. නැවත නැවත නැග නො එයි.
2. **ඛණිකපීති** - එක් වරකින් ම කෙළවර නො වී අහසෙහි විදුලිය මෙන් නැවත නැවත නැගෙන ප්‍රීතිය ඛණික ප්‍රීතිය යි.
3. **ඔක්කන්තිකපීති** - මුහුදේ රළ වෙරළෙහි පැතිර පැතිර බිඳී බිඳී යන්නාක් මෙන් ශරීරය පිනවමින් එහි පැතිර පැතිර බිඳී යන ප්‍රීතිය ඔක්කන්තික ප්‍රීතිය ය.
4. **උබ්බේගපීති** - ශරීරය උඩ විසි කරන බලවත් වූ ප්‍රීතිය උබ්බේග ප්‍රීතිය ය.
5. **ඵරණපීති** - සකල ශරීරයේ පැතිර සකල ශරීරය ම ස්පර්ශ කර ගෙන උපදනා අතිප්‍රණීත ප්‍රීතිය ඵරණ ප්‍රීතිය යි.

අංගුත්තර නිකාය ඒකාදසත නිපාතයෙහි මහානාම සූත්‍රයෙහි වදාළ පරිදි බුද්ධානුස්සති වඩත්ම ප්‍රාමෝද්‍යය ඇතිවේ. ප්‍රමුදිතයාට ප්‍රීතිය ඇතිවේ. ප්‍රීතිමනස් ඇත්තහු ගේ කය සංසිඳෙයි. සංසුන් කයැත්තාහු මානසික සුව විඳියි. සුවත්තාගේ සිත එකඟ වේ. ආර්යශ්‍රාවකයා රාග - ද්වේශ - මෝහ විසින් විෂමතාවයාට ගිය ප්‍රජායෙහි සමත්වයට - විෂමනැති බවට පැමිණ වෙසෙයි. දුක් සහිත ජනතාව අතර නිදුක් ව වෙසෙයි.

**ප්‍රශ්නයः**
පස්වනක් ප්‍රීතිය බුදුන් අරබයා උපදින්නක්ද ?
**පිළිතුරः**
සමාජයේ දී අපට බොහෝ විට අසන්නට ලැබෙන කියමනක් නම් "පස්වනක් ප්‍රීතියට පත්වුණා" හෝ "පස්වනක් ප්‍රීතියෙන් පිනා ගියා" යන්නයි. පංච වර්ණ හෙවත් පස්වැදෑරුම් ප්‍රීතිය කුමක්දැයි නොදන්නා නමුත් අධික උද්දාමයකට පත් අවස්ථාවක සිංහලයන් විසින් භාවිත කරනු ලබන මෙම කියමන මදක් විග්‍රහ කිරීම සුදුසුය. මෙහි සැබෑ අර්ථය විමසා බැලීමට විශේෂයෙන් බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථයෝ අපට උපකාරී වෙත්.

පස්වනක් ප්‍රීතිය නාමික වශයෙන් මෙසේය.

1. ඛණික ප්‍රීතිය (ක්‍ෂණික ප්‍රීතිය)
2. ඛුද්දක ප්‍රීතිය (ක්‍ෂුද්‍රක ප්‍රීතිය)
3. උද්වේගික ප්‍රීතිය (උද්වේග ප්‍රීතිය)
4. ඔක්කන්තික ප්‍රීතිය (අවක්‍රාන්තික ප්‍රීතිය)
5. ඵරණ ප්‍රීතිය (ස්ඵරණ ප්‍රීතිය)

අප එදිනෙදා භාවිතයේදී පස් වැදෑරුම් ප්‍රීතිය නැතිනම් පස්වනක් ප්‍රීතිය යනුවෙන් අදහස් කරනුයේ තද බල ලෙස සතුටට පත් වීමයි. සියලු ආකාරයෙන් උපරිම වූ සතුට විඳීමයි. ශබ්දකෝෂවල දැක්වෙන විග්‍රහයන්ට අනුව පස්වනක් ප්‍රීතිය මෙසේ විස්තර කළ හැකිය.

**ඛණික ප්‍රීතිය** - එක් වරකින් කෙළවර නොවී නැවත නැවත නැගෙනා ප්‍රීතියයි. නැතහොත් මොහොතින් මොහොත ක්‍ෂණිකව හටගන්නා ප්‍රීතියයි

**ඛුද්දක ප්‍රීතිය** - ශරීරයේ ලොමු දැහැගැන්වෙන අයුරින් ඇතිවන්නා වූ සියුම් හා කුඩා ප්‍රීතියයි.

**උද්වේගික ප්‍රීතිය** - ශරීරය අහසට නැංවීමට තරම් බලවත් වූත් ආධ්‍යාත්මිකව උසස් මට්ටමකට පැමිණවීමේ ශක්තියක් ඇත්තාවූත් ප්‍රීතියයි.

**ඔක්කන්තික ප්‍රීතිය** - චිත්ත වේගයන්ගෙන් යටපත් කරමින් නැවත නැවත මතුවන ප්‍රීතියයි. මෙය ශරීරය පිනවමින් ඉතිරී පැතිරී ගොස් නැති වී යයි

**ඵරණ ප්‍රීතිය** - ශරීරය පුරා පැතිර පවත්නා වූ ප්‍රීතියයි

පස්වනක් ප්‍රීතිය යන්න සිංහල සමාජයේ බහුලවම භාවිත වන්නේ භාෂණයේදී වුවත් සිංහල සාහිත්‍යයෙහි ඒ පිළිබඳ විග්‍රහයට ලක් වූ අවස්ථා රාශියක් වේ
.
"පඤ්ච වණ්ණාය පීතියා ක්‍ෂුද්‍රිකාක්‍ෂණිකො දේවගාවක්‍රාන්ති ස්ඵුරණී යන පස් වනක් ප්‍රීතීන්" යනුවෙන් ජාතික අටුවා ගැටපදයේ පස්වනක් ප්‍රීතිය හඳුන්වා දී තිබේ.
(ජාතක අටුවා ගැටපදය - මැද උයන්ගොඩ විමලකීර්ති හිමි,
නැහින්නේ සෝමින්ද හිමි සංස්. 27 පි.)

බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන පරිදි පස්වනක් ප්‍රීතිය බුදුරජාන් වහන්සේ අරබයා උපදින්නකි. මහාචාර්ය රේරුකානේ චන්දවිමල නාහිමියන්ගේ "මංගල ධර්ම විස්තරය" නමැති කෘතියේ සඳහන් වන පරිදි ප්‍රීතිය යනු බුදු දහමට අනුව සිත මෙන් ම ගත ද පිනවන, ඔද වඩවන උසස් ධර්මයකි. එය සාමිෂ, නිරාමිෂ යනුවෙන් දෙකොටසකි. සාමිෂය, කාමාමිෂ ප්‍රීතිය, ලෝකාමිෂ ප්‍රීතිය, වට්ටාමිෂ ප්‍රීතිය යනුවෙන් තෙවැදෑරුම් වේ. කාමාමිෂ ප්‍රීතිය තෘෂ්ණාව පදනම් වූවකි. මෙයින් පුද්ගල ගත සිත පිනා යන නමුත් එය තාවකාලික වේ. සාමිෂ ප්‍රීතිය අකුසලයක් ද වේ. නිරාමිෂ ප්‍රීතිය වූ කලී දාන, ශීලාදී පුණ්‍ය ක්‍රියා කිරීමේදී ලෞකික හා ලෝකෝත්තර වශයෙන් ඇති වන බුද්දකා, ඛණිකා, ඔක්කන්තිකා, උබ්බේගා හා ඵරණා යන කොටස් පහකින් යුක්ත වේ.

සකල ශරීරයේ ලොමු දැහැ ගැනීම් සමග ඇතිවන ප්‍රීතිය බුද්දකා ප්‍රීතිය වේ. ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා විදුලියක් මෙන් ඇතිවන්නා වූ ප්‍රීතිය ඛණිකා ප්‍රීතිය වේ. මුහුදු වෙරළේ රළ කැඩී කැඩී යන්නාක් මෙන් ඇතිව නැතිව යන්නේ ඔක්කන්තිකා ප්‍රීතිය වේ. වාතයෙන් පිරී ගිය සම් පසුම්බියක් සේ සකල ශරීරගතව පැතිර යන්නා වූ ප්‍රීතිය ඵරණ ප්‍රීති වේ. ශරීරය උඩට ඔසවා අහසින් යවන්නට හැකි සේ ඉතාම බලවත්ව පහළ වන ප්‍රීතිය උද්වේග ප්‍රීතිය වේ. මෙම ප්‍රීතියට පත් වූවෝ ගොඩබිම මෙන්ම ජලයේ ද එකසේ ඇවිද යති.

"මංගල ධර්ම විස්තරය"ට අනුව බලවත් ප්‍රීතිය නිසා ශරීරය පැහැපත් වන අතර ඇතැම් විට ශරීරයෙන් ආලෝක කදම්බ ද විහිදිය හැකි ය. ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයට අනුව බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් සුමේධ තාපසයෝ පස්වනක් ප්‍රීතියට පත් වූහ.
"ඒ බුදුන් (දීපංකර) වඩනට මාර්ගය අපි සරසමහයි දැන්වූවාහුය. එකල්හි සුමේධ තාපසයන් වහන්සේ පස්වනක් ප්‍රීතීන් පිණා ගිය ශරීර ඇතිව සිතන සේක්."
(ශ්‍රී සද්ධර්මවවාද සංග්‍රහය( ඇස්. ටී. කීර්තිචන්ද,
ඇස්. ජේ. කාලිංගවංශ සංස්( (55) පි.)
බුදුන් වෙනුවෙන් කරන කවර කටයුත්තක් වුවද ප්‍රීති ප්‍රමෝදයට හේතු වන අයුරු මෙයින් තහවුරු වේ.

"රජු බුදුන්ගේ ගුණ අසත් අසත් සියල් සිරිරු පස්වනක් ප්‍රීතියෙන් අතුරු නැතිවැ පිරී ගියේ හේ ඒ විගස බුදුන් කරා..." යනුවෙන්
අමාවතුර කරුණු ගෙන හැර හයි.
(අමාවතුර - රිචඩ් ද සිල්වා මහානාම සංස්( (104) පි.)
බුදු ගුණ ඇසීම එසේ පස්වනක් ප්‍රීතියෙන් පිනායාමට හේතු වුවා සේ ම බුදුන් දැකීම ද එවැනි ප්‍රීති ප්‍රමෝදයක් ජනිත කිරීමට හේතු වූ අයුරු ද බෞද්ධ සාහිත්‍යයේ තොරතුරුවලින් හෙළි වේ. පූජාවලියේ සඳහන් මේ පාඨය ඊට නිදසුන් වෙයි.

"සාර ලක්‍ෂයක් රහතුන් පිරිවරා සවණක් රසින් දිලිහී දිලිහී රුවන් මෙරක් සේ අවුදින් වැඩ සිටි බුදුන් දැක පස්වණක් ප්‍රීතීන් පිනා අද ආශ්චර්යවත් වූ මාගේ ප්‍රිය ජීවිතය පූජා කරමියි සිතාලා...."
(පූජාවලිය, කහවේ රතනසාර හිමි සංස්.)

එමෙන්ම උම්මග්ග ජාතකයේ සඳහන් පරිදි වේදේහ රජු බෝසතුන් දැකීමෙන් පස්වනක් ප්‍රීතියෙන් පිනා ගොස් ඇත.
(උම්මග්ග ජාතකය, සයිමොන් ද සිල්වා සංස්( (191) පි.)

ඇතැම් විට බුදුන් යන නම ඇසීම ද කෙනකු ප්‍රීති ප්‍රමෝදයට පත් වීමට හේතු වූ ආකාරය සද්ධර්මාලංකාරය හෙළි කරයි.
"බුදුහු යන නම අසමින් ම පස්වනක් ප්‍රීතීන් පිණා ගිය ශරීර ඇතිව සැබවින් ම බුදු කෙනෙකුන්ට සරසන මාර්ගයක් වී නම් මට ද මෙයින් භාගයක් දෙවයි ඉල්වා..."
(ශ්‍රී සද්ධර්මාලංකාරය, ශ්‍රී ඥානේශ්වර හිමි සංස්( (62) පි.)

සද්ධර්මරත්නාවලියේ සඳහන් පරිදි වක්කලී තෙරුන් බුදුරජාණන් වහන්සේ සමග කතා කිරීමට අවස්ථාවක් නොලැබ ගිජුකුළු පව්වෙන් පැන දිවි නසා ගැනීමට තැත් කරද්දී බුදුරජාණන් වහන්සේ වක්කලී තෙරුන් කරා එළඹ එකී අරමුණ ඉටුකළහ. තම අරමුණ සඵල වීමෙන් උද්වේග ප්‍රීතියට පත් වක්කලී තෙරණුවෝ අහසට නැඟී, අහසේදීම රහත් බව ලැබූහ. බුදුරදුන් හා කථා කිරීමට තිබූ ආශාව ඉටුවීමෙන් කෙනකු ප්‍රීති ප්‍රමෝදයට පත් වන අයුරු වක්කලී තෙරුන් පිළිබඳ මෙම පුවතින් හෙළිවේ.
(සද්ධර්මරත්නාවලිය, බෙන්තොට ශ්‍රී ශ්‍රද්ධාතිස්ස හිමි සංස්( (981-982) පි.)

මෙසේ බුදුන් දැකීමෙන්, බුදුන්ට ගරු සැලකිලි දැක්වීමෙන්, බුදු ගුණ ඇසීමෙන්, බුදුන්ගේ නම ඇසීමෙන් ප්‍රීති ප්‍රමෝදයට පත්වූ සමාජයේ විවිධ තරා තිරමේ පුද්ගලයන් පිළිබඳව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. පස්වනක් ප්‍රීතිය වූ කලී බුදුන් අරබයා ඇතිවන මානව චිත්ත ආවේගයක් බව මේ තොරතුරුවලින් තහවුරු වෙයි. ඒ හැරුණු කොට බුදුන්ගෙන් බණ ඇසීම ද පස්වනක් ප්‍රීතිය ඇතිකරවීමට හේතු වන අයුරු ධර්මානිශංසය කෘතිය හෙළි කරයි.
"ඉක්බිති උපාසකයෝ ද බණ අසා සතුටුව බුද්දක ප්‍රීතිය, ඛණික ප්‍රීතිය යනාදී පස්වනක් ප්‍රීතියෙන් පිරුණා වූ ශරීර ඇතිව"
(ධර්මානිශංසය, 4 පි.)

විසුද්ධි මාර්ග සන්නය පෙන්වා දෙන පරිදි ද පස්වනක් ප්‍රීතිය බුදුන් අරබයා උපදී. විශේෂයෙන්ම මෙම ග්‍රන්ථයේ පෙන්වා දෙනුයේ පස්වැදෑරුම් ප්‍රීතීන් අතුරින් උද්වේගික ප්‍රීතිය ඇතිවීමෙන් අහසින් යැමට හැකි වූ අයුරුය. ඒ පුවත් මෙසේය.

බුදුරජාණන් වහන්සේ අරමුණු කොට උපන් උත්ප්‍රේෂිකා (උද්වේගික) ප්‍රීතිය නිසා පුණ්ණගල්ලක විහාරවාසී මහා තිස්ස තෙරුන් විසිතුරු පන්දුවක් මෙන් අහසට නැග රුවන්වැලිසෑ මළුවට වැඩම කළහ. එමෙන්ම ගිරිහඬු වෙහෙරට ගොදුරු ගමක් වූ වත්තකාල ගම්වැසි කුල දුවක් ද බුදුන් කෙරෙහි උපන් උත්ප්‍රේෂිකා ප්‍රීතිය කරණකොට ගෙන ගිරිහඬු වෙහෙරට අහසින් ගොස් බණ ඇසුවාය.
(විසුද්ධිමාර්ග සන්නය (510-531) පි.)

විසුද්ධිමාර්ගයේ එන මේ කතා පුවත් දෙක, එනම් බුදුන් කෙරෙහි උපන් උද්වේගික ප්‍රීතිය කරණ කොට ගෙන මහාතිස්ස තෙරුන් රුවන්වැලි සෑ මළුවට අහසින් යැම හා වත්තකාල ගම කුල දුවක් ගිරිහඬු වෙහෙරට අහසින් යැම පිළිබඳ සිංහල සාරසංග්‍රහය ද කරුණු ගෙනහැර දක්වයි. ඇතැම් ග්‍රන්ථයන්හි බුදුන් අරබයා උපන් උද්වේගික ප්‍රීතිය නිසා අහසින් ගිය බව හෝ අහසට නැඟුණු බව හෝ දක්වයි. මෙහිදී සඳහන් කළ යුතු විශේෂ කරුණ වන්නේ, උද්වේගික නැතහොත් උත්ප්‍රේෂිකා ප්‍රීතිය (Up Lifting joy) ශරීරය අහසට නැංවීමට තරම් බලවත් වූත් ආධ්‍යාත්මිකව උසස් මට්ටමකට පුද්ගලයකු පැමිණවීමට ශක්තියක් ඇත්තා වූත් ප්‍රීතියක් බවයි. එහෙයින් මිනිසා ආධ්‍යාත්මිකව ඔසවා තැබීමට සමත් වන හා මිනිස් සිත සැහැල්ලුවට පත් කිරීමට සමත් බුදු දහම පිළිබඳ අර්ථවිවරණ සැපයීමේදී උද්වේගික හෙවත් උත්ප්‍රේෂිකා ප්‍රීතිය ඉස්මතු කිරීමට බෞද්ධ ලේඛකයන් නැඹුරුවීම සාධාරණය.

අපි අද සමාජයේදී කොතෙකුත් වාරයක් පස්වනක් ප්‍රීතියට පත්වීම පිළිබඳ කතා කරන්නෙමු. එය අප සරලව සැලකුව ද අතීතයේදී බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථයන්හි නිරන්තරයෙන් සඳහන් වූ පස්වනක් ප්‍රීතිය බුදුන් අරබයා ඇතිවූ චිත්තවේගයකි. බුදුන් දැකීමෙන්, බුදු බණ හා බුදුගුණ ඇසීමෙන්, බුදු ගුණ මෙනෙහි කිරීමෙන් හෝ බුදුන්ගේ නම ඇසූ පමණින් හෝ බෞද්ධයා තුළ උපන් ප්‍රීතිමත් තත්ත්වයන් හෙවත් ප්‍රමෝදයන් වශයෙන්, පස් වණක් ප්‍රීතිය හඳුන්වා දිය හැකි බව මේ අනුව තහවුරු වේ.

අන්තර්ජාලය ඇසුරෙනි



# ගසේ තිබියදී ම බුදුන්ට මල් පූජා කිරීම

**කුසුමං වුල්ලීතං ඒතං - පග්ගහෙත්වාන අඤ්ජලිං**
**බුද්ධසෙට්ඨං සරිත්වාන - ආකාසම්පි පූජයේ**

යහපත් අරමුනෙන් බුදුන් උදෙසා මල් පිදීමෙන් යහපතක්ම සිදු වේ.

බුදුරජාණන් වහන්සේ ඇතුලු මහරහතන් වහන්සේලා 500 නමක් වෙත දෙන දානය ඇතුලු ලොව සියලුම දානයන්ට වඩා අනිච්ච, දුඛ්ක, අනාත්ම මෙනෙහි වන N¦jk¦j iaj,n වේලාවක් වැඩීම තුළින් බොහෝ කුසල් අත්වන බව බුද්ධ දේශනාවයි. fï wkqj උදයට පිපී සවස පරවී යන සුවඳවත් මෙම මල් මෙන් අපගේ ජීවිතය ඇතුලු ලොව සියල්ල විනාස වී යන බව සිහි කරමින් බුදුන් වහන්සේට මෙම පිපී ඇති මල් පූජා වේවායි පතමින්, පූජේමි බුද්ධන් ආදී ගාථාවන් ගෙන් මල් පිදීම තුළින් මහත් කුසලයක් සහ බලවත් පිනක් ද අත් කර ගත හැකිය.

අවසානයේ සියලු දෙවියන්, බ්‍රහ්මයන් we;¿ mßka බලාපොරොත්තු වන සියල්ලටම mßka අනුමෝදන් කරන්න.

### පෙරහන්කඩ පූජාවේ ආනිසංස

- දීර්ඝායු සම්පත් ලැබේ. සොර සතුරු විපත් ඇති නොවේ.
- අවි ආයුධ වලින් පීඩාවට පත්කල නොහැක.
- අතුරු, (හදිසි) මරණයකට පත් නොවෙයි.
- වස-විස වලින් පීඩාවට පත් කළ නොහැක.

### වටාපත් පූජාවේ ආනිසංස

- සීත-උෂ්ණ ආදියෙන් පීඩා නොලබයි. ශරීර දාහ නැත්තෙක් වේ.
- මානසික දාහ නැත්තෙක් වේ. සිත සකස්කර ගත්තෙකු වෙයි.
- රාග, දොෂ, මෝහ, මාන, ගිනි නිවීමේ ශක්තිය ඇත්තෙක් වේ.
- මිසදිටු හිත් නිවීමේ හැකියා ඇත්තෙක් වේ.
- යහපත් ජීවිතයක් ගෙවීමේ හැකියාව ඇත්තේ වෙයි.

### කොට්ට, මෙට්ට, සුව පහසු ඇතිරිලි පූජා කිරීමේ ආනිසංස

- කොටට, මෙට්ට, සුවපහසු ඇතිරිලි ලැබේ.
- ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සිත එක අරමුණක පවත්වා ගැනීමට හැකියාව ලැබෙයි.
- ඉන්ද්‍රිය දමනය කරගෙන කටයුතු කිරීමට හැකිවේ. තුන්දොර
- යහපත් ලෙස හසුරුවා ගත හැකිවේ.
- සිත පහසුවෙන් සමාධි ගත කරගත හැකිවේ.
- වෙත්-පිළිවෙත්, ගුණධර්ම, බෝධිපාක්ෂික ධර්ම ආදියෙන් යුතු ධර්මානුකූල ජීවිතයක් ගෙවීමේ හැකියාව ඇත්තෙක් වේ.

### පාවහන් පූජාවේ ආනිසංස

- සුගතියේ උප්පත්ති ලබයි.
- මහත් ප්‍රසාද, රන් සිවිකා ලබයි.
- වේගයෙන් යා හැකි වාහන ලැබේ.
- අගනා පාවහන් ලැබේ.
- ඍද්ධි වලට පහසුවෙන් ළඟාවිය හැක.
- සසර කෙටි කර ගෙන නිර්වාණාවබෝධයට මේ පුණ්‍යකර්මය හේතුවේ.

### කුටි, සෙනසුන් පූජා කිරීමේ ආනිසංස

- දුගතියේ නූපදී.
- දෙව් මිනිස් සැප සම්පත් ලබයි.
- දෙව් විමන් පහළ වේ.
- උපනුපන් තැන ප්‍රාසාද පහළ වේ.
- තමන් සිතන පතන පරිදි ප්‍රාසාද මන්දිර ලැබේ.
- බිය, තැතිගැනීම් ලොමු දැහැගැනීම් ඇති නොවේ.
- වනයක වුව සතුන් සර්පයන්ගෙන් පීඩා ඇති නොවේ.
- සතුන් සර්පයන් මාර්ගයෙන් ඉවත් වේ.
- මේ පුණ්‍යකරමය නිර්වාණ අවබෝධයට හේතු පාදක වේ.

### වස්ත්‍ර පූජා කිරීමේ ආනිසංස

- රූමත්, කඩවසම් තැනැත්තෙකු බවට පත්වේ.
- භෝග වස්ත්‍ර ලැබේ.
- ගුණවන්ත අයෙකු වෙයි.
- බොහෝ වස්ත්‍ර ආදිය ඇත්තෙක් වේ.
- රන්වන් පාට සිරුරක් ලැබේ.
- කාන්තිමත් සුසිනිඳු ශරීර ලැබේ.
- රන් රිදී මුතු මැණික් ලැබේ.
- දූවිලි, දැලි, කුණු නොඇලෙන සමක් ඇත්තෙකු වේ.

### සැරයටි පූජා කිරීමේ ආනිසංස

- බොහෝ පුත්‍රයන් ලැබේ.
- බියවීම තැතිගැනීම් නැති ධෛර්ය සම්පන්න පුද්ගලයකු වේ.
- හැම කල්හිම අනුන් විසින් පීඩා නොකළ හැක්කෙකු වේ.
- සැම කල්හිම සියලු ආරක්ෂාව ලැබේ.
- වැරදි නැත්තෙකු වේ.
- චිත්ත පීඩා, මානසික පීඩා ඇති නොවේ, යහපත් ජීවිතම ලැබේ.

### බුදු පිළිම නෙළීමේ ආනිසංස

- මෙහි ආනිසංස මෙතෙකැයි කියා නිම කළ නොහැකි බව සඳහන්.
- කිසිම අත් භවයක අට මහා නිරයේ නූපදී. සුගතියේ ම උපදී.
- මහත්වූ ඍද්ධි බලය ඇත්තවුන් සිය ඍද්ධි බල මහිමයෙන් ලොව සියළු උඳු, මුං යන ධාන්‍ය සියල්ල ගණන් කර මේ යැයි කීව ද, බුදු පිළිම නෙළු පින මෙතකැයි කියා නිමකළ නොහැක.
- සක්විති රජෙක් මහමේරුව (යොදුන් තිස්හත් ලක්ෂ දස දහස් තුන්සිය පනහක්) උසට උඳු මුං පුරවාලා ඒ සියල්ල ගණන් කොට මේ යැයි කීවද, බුදු පිළිම කළ පුණ්‍යකර්මයේ අනුසස් මෙතෙකැයි කියා නිමකළ නොහැක.
- මහානුභාව සම්පන්න දෙවියන් විසින් සාගර ජලය සිය දහස් ගණන් නැලිවලින් ගණනය කර, මේ යැයි කීවද, බුද්ධ පිළිම නිර්මාණය කළ පින මෙපමණ යැයි කියා නිමකළ නොහැක.
- මුව සීයයකින්, දහසකින් එක්වර එහි ආනිසංස කීවද, බුදු පිළිම නෙළීමේ ආනිසංස මෙතෙකැයි කියා නිමකළ නොහැක.
- මෙය අටමහ කුසල් ගණයේ ගැණෙන මහත්ඵල මහානිසංස පිංකමකි.

### දිය පිස්නා වස්ත්‍ර පූජා කිරීමේ ආනිසංස

- රන්වන් පැහැපත් සිරුරක් ඇත්තේ වේ.
- රජස් නැත්තෙකු වේ.
- සිනිඳු සිරුරක් ලැබේ. සිරුරේ දැලි, කුණු නොඇලේ.
- ශරීරයෙන් නික්මෙන ප්‍රභාවක් ඇත්තේක් වේ. තේජස් ඇත්තෙක් වේ.

### ආරක්ෂක ප්‍රාකාර, බැම් සඳා පූජා කිරීමෙන් ලැබෙන ආනිශංස

- දේව, මනුෂ්‍ය ආදී සුගති ජිවිත ලැබීම.
- සැප නැති තැනක උපත ලැබුවත් තමාව නොයෙක් ආකාරයේ සැප සම්පත් ලැබීම.
- සතර අපාවලින් මිදීම.

## බෝධි පළඳනා පූජා කිරීමෙන් ලැබෙන ආනිශංස

- ශරීරය බලවත් රූප ශෝභා සම්පන්න භාවයෙන් ආභරණ නැතත් බැබළීම.
- පිළිකුල ඇති කරවන දද, කුෂ්ඨ, වන, ලාදුරු ආදී රෝග නොසෑදීම.
- සෝක පීඩා වලින් වැළකී නිතර චිත්ත ප්‍රීතියෙන් වාසය කරන්නට හැකි වීම.

## පුටු පිදීමේ ආනිශංස

- රජ වෙළඳ, බමුණු, ගොවි යන උසස් කුලවල උපත ලැබීමට හැකි වීම.
- බව භෝග සම්පත් සිතු පරිදි ලැබීම.
- උපන් සැම ආත්මයකදීම බෝහෝ ගරු බුහුමන් ලැබීම.
- තමාගේ කීර්තිය සැමතැන පැතිරීම (මෙය සේනාසන කුසලයකි.)

## කප්රුක් පූජා කිරීමේන් ලැබෙන ආනිසංස

- සසර නිවන් දකින තුරු බව භෝග සම්පත් ලැබීම.
- සිතු පැතු සම්පත් දෙන ආකාරයට තමන්ට කප්රුක් පහල වීම.
- නොයෙක් ආකාරයෙන් කැමති කෑම හා වස්තුන් ලැබීම.
- තුන් ඍතුවට කැමති කැමති සැප සම්පත් ලැබීම.
- කිසිම ජාතියක සතර අපායේ නොඉපදීම.
- නිවන් අවබෝධ වීම, තමාගේ සිත පැහැදීම.
- අන්‍යයන්ගේද සිත් පැහදන්නෙකු වේ.
- උපන් සැම ආත්මයකදීම රූප ශෝභාව ලැබේ.
- කුසල් සිහිවීමෙන් සුගති ජීවිතයක් ලබයි.
- නිවන් අවබෝධ වීම.

## දැහැටි පූජා කිරීමේ ආනිසංස

- උගුරේ අසනීප නොසෑදීම.
- කටහඬ මිහිරි භාවයට පත් වීම.
- කාස හා ස්වාසය රොග වලින් වැළකීම.
- මානෙල් මල් මෙන් කට සුවඳවත් වීම.

## අට මහා කුසල්

- බුදුන් වහන්සේ ප්‍රධාන මහා සංඝ රත්නයට දන් දීම.
- බුද්ධ ප්‍රතිමා සැදවීම.
- කඨින දානය.
- අටපිරිකර පූජාව.
- සංඝ රත්නය උදෙසා ආවාස සාදවා පූජා කිරීම.
- සංඝ රත්නය උදෙසා වැසිකිලි සාදවා පූජා කිරීම.
- කෙත්වතු මහාසංඝ රත්නයට පූජා කිරීම.
- ධර්ම දානමය පිංකම් සිදු කිරීම

## දීර්ඝායුශ ලැබීමට කල යුතු පිංකම්

- පන්සිල් රැකීම.
- පොහෝ දින පෙහෙවස් සමාදන් වීම.
- සංඝයා වහනසේලාගේ සේනාසන අලුත්වැඩියා කිරීම.
- ආවාස සාදවා සංඝයාට පූජා කිරීම.
- ගිලනුන්ට බෙහෙත් සපයා උපස්ථාන කිරීම.
- පිරිත් ඇසීම.
- බෝධි පූජා පැවැත්වීම.
- සංඝික දාන පිංකම් පැවැත්වීම.
- අටපිරිකර පූජා කිරීම.

## පිං වැඩීමට කලයුතු පිංකම්

- මල් වතු පලතුරු වතු යනාදී ලෙස රෝපණය කිරීම.
- වන රෝපණය.
- ඒ දඬු හා පාලම් සැදවීම.
- ළිං පොකුණු ආදීය සැදවීම.
- වාසය කිරීමට තැන් (ආවාස /අම්බලම්) සැදවීම.

## අටපිරිකර පිදීමේ ආනිසංස

- බලගතු ප්‍රඥාවක් ලබයි,
- බොහෝ වසතු සම්පත් හා තේජස් භාවය ලැබේ.
- පිරිවර සම්පත් ඇතිව උපදී, මිථ්‍යාදෘෂ්ඨික ආත්ම වල නූපදී.
- ප්‍රාර්ථනා ඇතොත් ශ්‍රේෂ්ඨ පිරිමි ආත්මයක් වුව ලැබිය හැක.
- මන්ද බුද්ධික, කෙලතොළු, මෝඩ වැනි පවුකාර ආත්ම නොලබයි.
- කිසිම ආත්මයක සිහිවිකල් බව ඇති නොවේ.
- දේශගුණ වෙනස්වීම් හෝ අව්වෙන්, වැස්සෙන් පීඩා ඇති නොවේ.
- වනන්තර වල ගිය ද දරුණු සතුන්ගෙන් පීඩා ඇති නොවේ.
- පිළිකා, කුෂ්ඨ, දද, හොරි, වණ, ලාදුරු, ජීනස වැනි රෝග නොසෑදේ.
- පුරුෂයෙක් නම් 'ඒහි භික්ඛු භාවයෙන්' උපසපන් බව ලබයි.
- ගැහැනියක නම් මේල පළඳනාව වැනි ඉසුරුමත් පළඳනා සම්පත් ලැබෙයි.
- මෙය අටමහා කුසලයන් අතර වන මහානිසංසයෙන් යුත් කුසල කර්මයකි.

## පාවඩ, බුමුතුරුණු, පාපිස්නා පිළීමේ ආනිසංස

- සුගතියේ උපත ලබයි.
- දුගතියක නූපදී.
- උසස් කුලවලම උපත ලබයි.
- මනා අඟ පසඟ ඇතිව, පිරිපුන්ව උපත ලබයි.
- ආරෝහ පරිණාහ දේහයක් ඇතිව උපදී.
- රන්වන් පාටින් බබළන සිරුරක් ලැබේ.
- මටසිලුටු, මෘදු ශරීරයක් ලැබෙයි.
- කරදරයෙන් තොර වාසනාවන්ත ජීවිතයක් ලැබෙයි.
- මඩ දැලිකුණු නොඇලෙන පිරිසුදු සිරුරක් ලැබේ.
- කායික, මානසික සුවය ලැබේ.
- කායික රෝග, මානසික රෝග ඇති නොවේ.
- කිසිම භවයක අකල් මරණවලට ගොදුරු නොවේ.
- භව භෝග සම්පත් නොඅඩුව ලැබේ.
- ගින්නෙන්, ජලයෙන්, රජුන්ගෙන්, සොර සතුරන්ගෙන්, භව භෝග විනාශ නොවේ.
- තම සිත නොරිදෙන යහපත් කල්‍යාණ මිතුරන් ලැබේ.
- වටා එක්වන පිරිසද දියුණුවම ප්‍රාර්ථනා කරයි.
- මේ පුණ්‍යකර්මය නිර්වාණයට උපනිශ්‍රය වේ.

### මුතු කුඩ, මුතු වියන්, පූජා කිරීමේ ආනිසංස මෙය ඉනා අනගි පූජාවකි.

- දුගතියේ උප්පත්තිය නොලබයි.
- සුගතිගාමී වෙයි.
- දෙව් මිනිස් ආත්ම ලැබේ.
- බොහෝ වටිනා රන, රිදී ආභරණ, බඳුන් ආදිය ලැබේ.
- උපද්‍රව රහිතව ජීවත් වීමට වාසනාව ලැබේ.
- රසවත් ආහාර පාන, සුවපහසු සයනාසන, සිනිඳු වූ වස්ත්‍ර, සුවපහසුවට ලබාගත හැකිවේ.
- ලැබෙන සම්පත් අකාලයේ විනාශ නොවේ
- ස්ථිර සිත් ඇත්තෙක් වේ.
- සැමවිටම ස්ථිර අරමුණක පැහැදිලිව සිත පිහිටයි
- ස්ථිර අධිෂ්ඨානයක් ඇත්තෙක් ලෙස කටයුතු කරන්නෙක් වෙයි.
- සැම කල්හිම ධර්මයට කැමැති කෙනෙක් වේ.
- කෙලෙස් අඩු ආශ්‍රමන නැති කෙනෙක් වීම.

### මල් පූජා කිරීමේ ආනිසංස

- මහත් භෝග සම්පත් ඇත්තෙකු වේ.
- උසස් කුලවල ඉපදදේ.
- රිසි පරිදි යාන-වාහන ලැබෙයි.
- බොහෝ රූමත් ස්ත්‍රීන් ලැබෙයි.
- බොහෝ දැසි-දස්සන් ලැබෙයි.
- සැම කල්හිම අන් අයගේ ගෞරවයට, ආදරයට, සෙනෙහසට බඳුන්වේ.
- උසස් කීර්ති ප්‍රශංසා ඇත්තෙක් වේ.
- ඥාතීන් අතර ශ්‍රේෂ්ඨයකු බවට පත් වේ.
- කාන්තිමත්, පැහැපත් ශරීර වර්ණ ඇත්තෙක් වේ.
- සීත- උෂ්ණ ආදියෙන් පීඩාවට පත් නොවේ.
- සැම කල්හිම බොහෝ පිරිවර ජනයා ඇතිවේ.
- කායික සුවය, මානසික සුවය, චිත්ත ඒකාග්‍රතාවය ඇතිවේ.
- මල් පූජා කරන විට බුදුරජාණන් වහන්සේ කෙරෙහි මහත් ගෞරවයෙන් ශ්‍රද්ධාවෙන්, උතුම් බුදුගුණ සිහිකර පිරිසිදු සිතුවිලිවලින්, සිත එකඟ කරගෙන ඒ උතුම් මල් පූජා සිදු කරන්න.

### ඡත්‍ර පූජා කිරීමේ ආනිශංස

- සීතලෙන්, උෂ්ණයෙන් පීඩා නොලබයි.
- සැප සම්පත් ලැබේ.
- සියුම්, සුමට, සුමුදු සිරුරක් ලැබේ.
- විචිත්‍ර කුඩ ආදිය ලැබේ.
- දුවිලි, කුණු නොඇලෙන සිරුරක් ලැබේ.
- පිරිසිදු සිතක් ඇති වේ.
- සැම කල්හිම ගරු බුහුමන් ලැබේ.
- දෙව් තලවල උපත ලබයි.

### පහන් පූජාවේ ආනිසංස

- ආලෝකය දීම ඇස් දීමක් වැනි ය. ඇස් ඇත්තන් ද, ආලෝකය නැතිවිට අන්ධයන් ය. ආලෝකය දීම, ඇස් දීම වැනි පින්කමක් වන්නේ එබැවිනි.
- දෙව් ලොව මිනිස් ලොව සැප ලැබේ.
- දිලිසෙන සිරුරක් ලැබේ.
- උපනුපන් ආත්මවල දීප්තිමත් ඇස් ලැබීමේ වාසනාව ලැබේ.
- ශරීරය කාන්තිමත් වේ.
- දුගතියට නොවැටේ.
- දෙව්ලොව විමන් පහළ වේ.
- ආලෝකවත් ස්ථාන ලැබේ.
- දිවැස් ලැබීමට මේ පුණ්‍යකර්මය උපකාරී වේ.

### බෙහෙත් පූජා කිරීමේ ආනිසංස

- දීර්ඝායුෂ සම්පත්තිය ලැබේ.
- ශරීර ශක්තිය ලැබෙයි.
- ධෛර්යය සම්පන්න පුද්ගලයෙක් වේ.
- පැහැපත් වර්ණයක් ඇති වේ, හොඳ ශරීර සම්පත්තියක් ලැබේ.
- කවර උපද්‍රවයකටවත් හසු නොවී ජීවත් විය හැක.
- අන් අයගේ දෝෂාරෝපණයෙන් වැළකුණු කෙනෙක් වෙයි.
- ප්‍රිය විප්පයෝගයකට පත් නොවේ.
- යහපත් කීර්ති නාමයක් ඇත.
- අඹු දරුවන් සහෝදරයන් දෙමාපියන් අකාලයේ මරණයට පත් නොවේ.

### පාත්‍ර සහ බුද්ධ පූජා කට්ටල පූජා කිරීමේ ආනිසංස

- දුගතියේ උප්පත්තිය නොලබයි. සුගතිගාමී වේ.
- බොහෝ වටිනා රන්-රිදී අභරණ, බඳුන් ආදිය ලැබේ.
- උවදුරු නැත්තෙක් වේ.
- අනතුරු වලින් තොර වේ.
- අනයයන්ගේ ගෞරවයට පාත්‍ර වෙයි.
- උසස් තනතුරු ලැබේ.
- රසවත් ආහාර-පාන, සිනිඳු වස්ත්‍ර, සුවපහසු සයනාසන පහසුවෙන් ලැබේ.
- සැම කල්හිම ධර්මයට සිත් ඇත්තෙකු වේ.
- ලැබෙන සම්පත් අකාලයේ විනාශ නොවේ.
- ස්ථිර සිත් ඇත්තෙක් වේ.
- කෙලෙස් අඩු තැනැත්තෙක් වේ.

### කරඬු පූජාවේ ආනිසංස

- හැම කල්හිම ආරක්ෂාව ඇතිව ජීවත් වීමේ ඉඩ සැලසේ.
- සැපයෙන් යුතු කෙනෙක් බවට පත්වේ.
- ලෙඩ දුක්, වසංගත වලින් පීඩා නොපැමිණේ.
- කීරති ප්‍රශංසා ලැබේ.
- සියුමැලි මුදු මොලොක් ගති ඇත්තෙක් වේ.
- සියුම් ශරීර සහ රූප සම්පත්තියෙන් යුක්ත කෙනෙක් වේ.
- සියලු අනතුරුවලින් මිදුණු කෙනෙකු ලෙස ජීවත් වීමට හැකි වේ.
- මහා ගුණ වන්තයෙකු වේ.
- පුද පූජා සඳහා විචිත්‍රවත් කරඬු ලැබේ.
- අලංකාර යාන-වාහන වල උරුම ඇති කෙනෙකු වේ.
- ඇත්, අස් වැනි රථවාහන උරුම වේ.
- භවභෝග පහසුවෙන් ලැබෙන අයෙකු වේ.
- සතුන්ගෙන්, මිනිසුන්ගෙන් බෝග සම්පත්ති විනාශ නොවේ.
- අඩුවක් සිදු නොවේ.
- නොනැසෙන භෝග සම්පත් ඇත්තෙකු වේ.

# ගුරු පුදට මල් මිටක්

## සැරදේ ඔබ ඇදුරු චන්දන ජයරත්න

දොළොස් වසරකට පෙර තක්සලාවේ
තරුපති ඇදුරු විය මට හුදෙකලාවේ
ලැබුවෙන් එදා ගුරුහරුකම් නිමාවේ
වඳිනෙම් දොහොත් එක්කර ඔබෙ දෙපාවේ

දීපංකර බුදුන් හමුවේ හැර නිවන
සසරට වැටුණ තාපස වර සිහි කරන
නුඹේ භව ගමන දැක මට නුවණට දැණුන
අයුරුයි කියන්නේ අද ගුරු උපහරින

සබඳේ නිවනමැයි සතහට සුව දුන්න
නිබඳේ පරමාද නොම වෙමු එය දක්න
සුවදේ එයයි පැවසූ නිති දුර දක්න
සැරදේ ඔබ ඇදුරු චන්දන ජයරත්න

නිලූකා ජයසිංහ
"මෙත් සවිය" - 18




ආසියාවේ හොඳම විද්‍යාඥයන් සිය
දෙනා අතරට මහාචාර්ය චන්දන
ජයරත්න මහත්මා තේරීපත්වීම සිහිපත්
වීමට මෙත්සවිය විසින් පිරිනමන ලද
ගෞරව සම්මානය



වන සෙනසුන්

Tel: (+94) 70 45 12 333 | (+94) 26 32 66 600| (+94) 71 85 62 700
Fax: (+94) 26 22 28 600
Email: Panamurethilakawansha@gmail.com
arisimale@gmail.com
Web: www.arisimale.lk

මගේ අංකය :- 116/2023 දිනය:- 2023/03/27

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් සිංහල බෞද්ධයන් නොමැති පුල්මුඩේ ග්‍රාමයේ පිහිටි ඓතිහාසික ආසිරිකන්ද පුරාණ රාජ මහා විහාරය හෙවත් අරිසිමල වන සෙනසුන් සංවිතයේ වැඩසිටිමින් ස්වකීය ගුණ ධර්මයන් වර්ධනය කරගනිමින් ශික්ෂාකාමීව වැඩ වෙසෙන පිනැති මහා සංඝ රත්නයේ ප්‍රත්‍යාපහසුකම් සලසා ගැනිම සදහා පිංවත් තිවංක වික්‍රමසිංහ මහතා විසින් රු.100 000.00 ක මුදල් පරිත්‍යාගයක් සිදු කොට පුණ්‍යවන්ත දායකත්වයෙන් උතුම් බුදු සසුන චිරාත් කල් පවත්වා ගැනීමට දායක වී ඇත.

| | | |
|---|---|---|
| "දානං බලු සභාවේන | - | දානය ස්වභාවයෙන්ම |
| සග්ග මානුස භෝගදං | - | ස්වර්ග මනුෂ්‍යා සැප ලැබ දේ |
| පරිණාම වසේනේව | - | පාරමී පූරණය(වර්ධනය) වූ කල |
| භෝති මොක්ඛූපනීසයං" | - | නිවන සාක්ෂාත් කිරීමටද හේතු වේ |

පිංවත් මෙත් සවිය පදනමෙහි ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා ට හා මෙත් සවිය පදනමෙහි සියළුම සාජික සාමාජිකාවන් හටද ඔවුන්ගේ දෙමාපියන්ටත් මෙත් සවිය පදනමට උදවු උපකාර කල සියළුම පුද්ගලයන්ටත් සිදුකරගත් මේ උතුම් කුසලානිසංශයන් අනුමෝදන් වෙත්වා...!!!, සියලු දෙවියෝ ඔබ හැම රකිත්වා...!!!, නමින් මියගිය සියලු දෙනාට සසර දුකින් මිදෙන්නට මේ පින් අනුමෝදන් වේවා...!!!, ඔබ සියලු දෙනාද ශ්‍රද්ධා, සීල, ශ්‍රුත,චාග, ප්‍රඥා යන උතුම් ගුණයෙන් වැඩෙත්වා...!!!, අවසන ප්‍රාර්ථනීය බෝධියකින් සොරවූ සසර කතරින් එතෙරව ලබන උතුම් නිවන වහ වහා අවබෝධ වේවා...!!!
සාධු...! සාධු...!! සාධු...!!!

මෙයට,
සසුන් ලැදි,

පූජ්‍ය පනාමුරේ තිලකවංශ නායක ස්වාමීන්
උතුරු නැගෙනහිර දෙපළාත් සහ තමන්කඩුව දිසාවේ ප්‍රධාන සංඝනායක.
ලේඛකාධිකාරී
ශාසනාරක්ෂක බල මණ්ඩලය - කුච්චවේලි
ශ්‍රී සද්ධර්මාචාර්ය
මුළු දිවයිනටම සාමවිනිසුරු ලියා. අං. 10/2/ද්‍ර/මුද්/626
ආසිරිකන්ද පුරාණ රජමහා විහාරස්ථ වනසෙනසුන
අරිසිමලේ, පුල්මුඩේ
ත්‍රිකුණාමලය.

Ven. Panamure Thilakawansha Thero
The chief incumbent of sangha in the north and the east province including Thamankaduwa district
Chief Secretary of Sasanarakshaka Balamandalaya - Kuchchaweli
Sri Saddharmachariya
Justice of Peace (all island). Reg. No. 10/2/ද්‍ර/මුද්/626
Asirikanda Purana Raja Maha Viharaya
Arisimale, Pulmude
Trincomalee

# මෙත් සවියට මල් මිටක්

2022.10.23 දින "මෙත්සවිය" සාමාජික සාමාජිකාවන් විසින්
නිදහස් කල සිව්වන් කිදෙනා වෙනුවෙන් හරුනු ලංකා
උපහාරයකි... මේ....

මස් කඩයේ කොක්ක මත ජීවිතය ඕහිවෙලා
හැඩි කිරි දෙනුන් හට පෙර පිනක් පෑදිලා
"මෙත්සවිය" සොයුරු සොයුරියන් සැම එක්වෙලා
කිරි මවට, ජීවිතයම අභය දානය කලා

සසර පින් මදිවාම මිනිස් භවයක වුන්න
පෙරදු පින් ඇති උනා මිනිස් ආත්මක වුන්න
දිවිතුරා කිරි වීටක නැවත කඳුළැලි හෝන්න
නොවුනේ දෙව් වරුන් වගේ අපට පින්සිදු වෝන්න

කිරි මවුන් "බහිරි" වෙයි "සදලි" උපාසිය වෙලා
ඇරගෙ සොයුරි "හෝමරිය" හිදිහි හද තුටු වෙලා
සොහොහසරි නිදහසරි සිතට සැනසුම වෙලා
"කෑගල්ල" ගෙරිපියස බවුන් සුවපත් කලා

ගුරුතුමන් චන්ද්‍රනය අමල් සොයුරාණනේ
දියාබර මා සොයුරු දිනකර ද සමගිනේ
"මෙත්සවිය" පින්බරේ සොයුරි සොයුරාණනේ
කල පිනට ඔබ සැමගෙ සසර මග කෙටිවේනේ

සසර මතු කිසි දිනක සෝ සුසුම් නොවේවා...!
ලෙඩ දුකින් ගත සිතට වේදනා නොවේවා...!
සසර සැරි සරන තුරු මරණ බිය නොදේවා...!
තව තවත් ඔබේ සිත පින තුලම රැඳේවා...!

—— මුදාහල දෙනුන්ගේ වගකීම භාරගත්
මෙත්සවිය සාමාජිකා - 24/3720
කෑගල්ලේ රෝහිණී එස්. දේමබාදු

# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දීම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න. (011-2505088, 0714-014467).** එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මඟින්ද තොරතුරු ලබා ගත හැකිය.

මීට අමතරව සම ලේකම්වරු වන මංජුල පත්මකුමාර මහතා (071 529 5855) / පියල් චන්ද්‍රතුංග මහතා (071 450 1358) අමතා ද හදිසි තොරතුරු සඳහා වෙබ් කමිටු සභාපති චින්තක බණ්ඩාර මහතා (0718 114 477) අමතා තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මඟින් **දහවල් 12.00 - 1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 49 වන භාවනා වැඩසටහන

49 වන භාවනා වැඩසටහන 2023 ඔක්තෝම්බර් මස 22 වන ඉරු දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2023/09/30 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. ඉන්පසු ලැබෙන අයදුම්පත් ද ඉඩකඩ තිබුනහොත් සලකා බලනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 46 වන වැඩමුළුව

ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 46 වන වැඩමුළුව 2023 - 08 - 27 වන ඉරු දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 46 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2023 - 08 - 19 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.


**T.S.H.TECHNOLOGIES**

**පරිගනක, රූපවාහිනී අලුත්වැඩියාව / ශබ්දවාහිනී උපකරණ නිපදවීම සහ නව නිර්මාණ කරණය**

**071 66 00 317**

(සාමාජික - 43 කණ්ඩායම)

**ගණකාධිකරන හා මූල්‍ය සේවා**

පලපුරුදු, වෘත්තීය ගණකාධිකාරිවරයෙකු වන මෙත්සවිය සාමාජිකයකු තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර, සමාගම් ඇතුළු සියලු ව්‍යාපාරවල විගණනය, ගිණුම් පිලියෙලකිරීම්, ආදායම් බදු හා මූල්‍ය කළමනාකරණ උපදෙස් හා සේවාවන් සාධාරණ ගාස්තු යටතේ සපයනු ලැබේ.

**විස්තර : 077 2355117 අමතන්න.**

**දිදුලක ක්‍රියේෂන්ස්**

විසිතුරු නිර්මාණ සමගින් අලංකාරවත් ලෙස **මුතුකුඩ නිර්මාණය**

මනාලියන්ගේ සහ උත්සව අවස්ථාවන් සඳහා **සාරි නිර්මාණය කරනු ලැබේ**

**සාමාජිකා - දිලිනි**

බොරලැස්ගමුව - **0773904405**


ප්ලාස්ටික් ප්‍රතිශක්තිකරණය කර පිගන්/ කෝප්ප / වට්ටි ආදිය තැනීම රැකියාව කරගත් සාමාජිකාවකට (සා.අංක. 34-5228) නැගී සිටීමට අතහිත දෙන්න...

**ඔබ නිවසේ විසිකරන අනවශ්‍ය ප්ලාස්ටික් ද්‍රව්‍ය තිබේ නම්**

පොල්තෙල් බෝතල්/අයිස්ක්‍රීම් පෙට්ටි/ වතුර බෝතල් ආදිය භාර දීමට විමසන්න - **0772 353 392**

**ජල රකුසාගෙන් ගැලවෙමු ග්‍රන්ථය**

**කර්තෘ : පියදාස සිල්වා (සා:අ: 15-2738)**



- භාවනාව • ධර්ම දානය
- අභය දානය සඳහා කියවන්න

★ දියේ ගිලීමට ★අමනුස්ස බලපෑම්
★ අකල් මරණ අවමයට
★ ඇමෙරිකාවත් මෛත්‍රී භාවනාවට
★ ලොව ඉහළම කුසලයට
★ බුදුන් වහන්සේට මල් පිදීම තුලින් ...

**මුදුණ වියදම රු. 350**
**අලෙවි මිල රු. 250**
**දු:කා: 075 712 8960**

**පසුගිය වසරේ ලද සියළු පරිත්‍යාග බුදු පිළිමය තැනීම සඳහා පිරිනමන ලදී**

**සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්**

**SIGHT 'N' STYLE OPTOMETRISTS**

නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට) දුරකථන : 2854758

**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)**

**මැහුම් කලාව පුහුණු කිරීම**



මැහුම් කලාවේ සුන්දරම නිර්මාණය වූ, **රිබන් මෝස්තර නිර්මාණ සහ බ්‍රසීලියන් එම්බ්‍රොයිඩර් පුහුණු කිරීම**. නිවස අලංකාරයට **බිත්ති සැරසිලි, කුෂන් කවර, මේස රෙදි ආදි බොහෝ දෑ සමඟ කුඩා ළමා ඇඳුම් සිට බ්ලවුස් සහ සාරිය දක්වාත්,** නිවැරදි ලෙස වර්ණ සංකලනය කරමින් සොබා දහමේ සුන්දරත්වය එලෙසින්ම රැකෙන පරිදි ඉතා සියුම් නිර්මාණ පුහුණු කරනු ලැබේ.

**නිමැවුම් භාර ගැනීම සඳහා ද විමසන්න. 077 542 1001**

**(ළමා නිවාසවල දැරියන්ට ශක්තියක් වීමට නොමිලේ පුහුණුව දීමට කැමැත්තෙමි)**

# මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

**(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

01. සම්පූර්ණ නම ........................................
02. ස්ත්‍රී / පුරුෂ භාවය .................... 3. ජාතික හැඳුනුම්පත් අංකය ....................
(ඡායා පිටපතක් අමුණන්න)
04. උපන් දිනය .................... 5. වයස .................... 6. ආගම ....................
07. ස්ථිර ලිපිනය ........................................
විද්‍යුත් තැපෑල (e-mail) .................... දු:කඃ නිවස .................... ජංගම ....................
08. දිස්ත්‍රික්කය .................... 9. විවාහක / අවිවාහක බව ....................
10. දරුවන් සිටිනම් විස්තර : ගැහැණු දරුවන්ගේ වයස් .................... / පිරිමි දරුවන්ගේ වයස් ....................
11. රැකියාව හා තනතුර ........................................
ආයතනයේ නම ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි)....................
12. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ........................................
13. ලිපි එවිය යුතු ලිපිනය ........................................
14. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්,
    1. ........................................
    2. ........................................
15. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,
    1. ........................................
    2. ........................................
    3. ........................................
16. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ........................................
17. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .
18. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.
........................................
19. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ........................................
........................................

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .................... අයදුම්කරුගේ අත්සන ....................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**
තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ....................

.................... ....................
තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ....................

සැ.යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශන, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරි මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 5,000 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 4,000 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරිතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත් බව දැන්වූවාට පසුව පමණක් සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය අගහරුවාදා, බදාදා හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

**ගරු ලේකම්, මෙත්සවිය, අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08. දුරකථන : 0112 505088, 0714 014467**


**සියළු සාමාජිකයින් සඳහා නොමිලේ පැවැත්වෙන ආධ්‍යාත්මය දියුණු කිරීමේ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වලට අමතරව ධර්ම දේශනා, විශේෂ දේශන, සාර්ථකව ඉගෙන ගන්නා අන්දම පිළිබඳ වැඩමුළුව, අක්ෂි සායන, වෛද්‍ය සායන වලට සහභාගී වීමට අවස්ථාව සහ පුස්තකාල පහසුකම් හිමිය. මෙත් සවිය සඟරාව නිවසටම තැපෑලෙන් එවන අතර වාර්ෂික දින දර්ශනය ද නොමිලේ මෙත් සවිය මගින් ලබා දේ. මියගිය සාමාජිකයින් සඳහා වාර්ෂිකව සංඝගත දක්ෂිණාවක් පවත්වා පිං අනුමෝදන් කිරීම ද සිදු කෙරේ.**

# මෙත් සවිය මාසික ධර්ම දේශනා සහ වැඩසටහන්

2022 iemaqeïn¾ ui ui 04 jk
bre Èk m' j 2'00 g
fnd/ , ą" ,xldrdufhß

foaYlhdkkajykafia'
ufkdaoHd mqrjdislK qWmfoaYl
; sng lidpd¾h
**කැළණියේ අජිත ස්වාමීන්වහන්සේ**

odhl ;ajh (
wfhdaksixckd fufkúh



2022 foieïn¾ ui 04 jk
bre Èk m' j 2'00 g
fnd/ , ą" ,xldrdufhß

foaYlhdkkajykafia'
fmdlKqg ,xldrdu úydr jdiS
**පූජ්‍යපාද ආචාර්ය කුකුල්පනේ සුදස්සි ස්වාමීන් වහන්සේ**a
odhl ;ajh (
úmqf ;a úYajkd;a
wfmdkaiquy ;d



2023 fmdfidkaui 4 jk
bre Èk m' j' 3'30 g
fnd/ , ą" YS,xldrdufhß

foaYlhdkkajykafia'
memsshdk iqk ;dfoa mßfjka
kshdaH mßfjKdêm;s
Ydiąß mKä;
**ගොම්බද්දල දමිත හිමි**

odhl ;ajh (
úmqf ;a úYajkd;a
wfmdkaiquy ;d



2022'10'02 bre Èk **මහාචාර්ය චන්දන ජයරත්න මහතා**
úiska f,dal úlh ms<sno mj ;ajk ,o jevigyk






fu;auúh iudðld iukąs wyqqj uy ;ãh úiskafu;auúh iÕrd tl ;j lafmd; lajYfhka i l id Ndrÿkawj iadj




ÿlad r mdi , lai |yd ,xldrdu úydrjdiSúð; yñhkaf.ab ,ąß u; fu;auúh u.skamgqq120 fmd;a300 lamß ;Hd. lsÍu



2023'03'05 bre Èk Oïu .fõlSfn!oaYufhaß uydpd¾h ohd **රෝහණ අතුකෝරළ මහතාගෙ**a mqa , mj¾Okh ms;s | foaYkh








kß ld chisy uy ;ãh" tï' flamshkąuy ;d iy Ñkąl nKadr uy ;d hk wh úiskafu;auúhg mcd lrk ,o uq lv fol







# කොළඹ ගංගාරාම විහාරස්ථානයේ

## 2023 ජනවාරි 1 වන දින වසරේ පළමු හීල්දානමය පිංකම

සෑම වර්ෂයකම සිදු කරන වසරේ ප්‍රථම හීල් දානමය පිංකම මෙත් සවිය කාන්තා කමිටුවේ සංවිධාන ශක්තියෙන් සහ සාමාජිකයින්ගේ ආධාර උපකාරයෙන් හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී සිදු කරන ලදී.














කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ජයන්ති ළමා නිවාසයේ දරුවන් සඳහා දහවල් දානය හා අත්‍යාවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීම 2023 ජනවාරි 01 දින සිදු කරන ලදී.












2023 ජනවාරි 01 දින ගංගාරාමයේදී පාත්තයන් සඳහා අභය දානය ලබා දීම සහ ඊට සහභාගී වූ පිරිස





දීප්තකර මුද්‍රණාලය 2/99, කාවල පාර, නුගේගොඩ, 011 2827044 / 0712 285 680.

දිනකර මුද්‍රණාලය

නො. 2/99, නාවල පාර, නුගේගොඩ.
වට්ස්ඇප් : 072 3534915
දුරකතන : 011 2827044 / 0712 285 680,
විද්‍යුත් තැපෑල : dinakara.priyantha@gmail.com